# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රපාතන විරෝධී බදු සහ ප්‍රතිතෝලන බදු විමර්ශනය කිරීම සහ පැනවීම සඳහා ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින්
2017 නොවැම්බර් මස 25 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 ඔක්තෝබර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[217 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 124.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 70.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010511—510 (2017/11)

# ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු

එල්. ඩී.—ඕ. 68/2016

**ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන සම්බන්ධයෙන් ප්‍රපාතන විරෝධී බදු සහ ප්‍රතිතෝලන බදු විමර්ශනය කිරීම සහ පැනවීම සඳහා ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

1947 තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතියට (ගැට් 1947) ශ්‍රී ලංකාව ආරම්භක ගිවිසුම් පාර්ශ්වයන්ගෙන් එක් පාර්ශ්වයක් වූ හෙයින් ද:

1947 ගැට් සම්මුතියේ පාඨ මත පදනම් වූ ද, 1994 අප්‍රේල් මාසයේ දී අත්සන් කරනු ලැබුවා වූ ද, 1994 තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතියට වෙනත් කරුණු අතර, 1994 තීරු බදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතියේ VI වන ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගිවිසුම සහ සහනාධාර සහ ප්‍රතිතෝලන පියවර පිළිබඳ ගිවිසුම ඇතුළත් වන බැවින් ද:

ශ්‍රී ලංකාව, තහනම් කළ සහ ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාර මගින් හා ප්‍රපාතනයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමට අදහස් කරන බැවින් ද:

ඉහත සඳහන් ගිවිසුම් දෙක ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික විධිවිධාන සෑදීම යෝග්‍ය වන බැවින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 2017 අංක    දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ප්‍රපාතන විරෝධී බදු

**පොදු ප්‍රතිපත්තිය.**

2. මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ආරම්භ කර පවත්වනු ලැබූ විමර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් -

2—PL 010511—475 (2017/11)

(අ) විමර්ශනයට භාජන කළ නිෂ්පාදනය ප්‍රපාතනය කරමින් පවතින බවට;

(ආ) ශ්‍රී ලංකාවේ කර්මාන්තයට හානියක් සිදුවෙමින් පවතින බවට; සහ

(ඇ) ප්‍රපාතනය සහ සිදු වූ හානිය අතර හේතුකාරක සබඳතාවයක් ඇති බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදන මත ප්‍රපාතන විරෝධී බදු පනවනු ලැබිය හැකි ය.

බලපෑම තක්සේරු කිරීම.

3. එක් රටකට වැඩි රටවල් සංඛ්‍යාවකින් සමාන නිෂ්පාදන ආනයනය කිරීම, සමගාමී ප්‍රපාතන විරෝධී බදු විමර්ශනවලට යටත්වන අවස්ථාවක, හානියක් සිදු වේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත සඳහන් අවස්ථාවල දී පමණක් ශ්‍රී ලංකාවේ කර්මාන්තයට එසේ ප්‍රපාතනය කරනු ලබන ආනයනවල බලපෑම සමුච්චිත ලෙස තක්සේරු කරනු ලැබිය හැකි ය:-

(අ) මේ පනතේ 14 වන වගන්තිය යටතේ පෙත්සම් ගොනු කරනු ලබන විට;

(ආ) එක් එක් රටින් ආනයනය කරන ලද විමර්ශනයට භාජන වූ නිෂ්පාදනවලට අදාළව ඔප්පු වී ඇති ප්‍රපාතන ප්‍රමාණය සුළු ප්‍රමාණයකට වඩා වැඩිවන බවට සහ එක් එක් රටෙන් ආනයනය කරන ලද විමර්ශනයට භාජන වූ නිෂ්පාදනවල ප්‍රමාණය මේ පනතේ 20 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නොසලකා හැරිය හැකි නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරනු ලබන අවස්ථාවක; සහ

(ඇ) ආනයනය කරන ලද නිෂ්පාදන අතර ඇති තරගයේ තත්ත්වය සහ ආනයනය කරන ලද නිෂ්පාදන සහ දේශීය වශයෙන් ඇති සමාන නිෂ්පාදන අතර තරගයේ තත්ත්වය සැලකිල්ලට ගැනීමේ දී, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදන ආනයනය කිරීමේ බලපෑම සම්මුච්චිත ලෙස තක්සේරු කිරීම උචිත බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී.

## සාමාන්‍ය වටිනාකම තීරණය කිරීම

සාමාන්‍ය වටිනාකම තීරණය කිරීමේ පදනම්.

4. (1) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයක සාමාන්‍ය වටිනාකම, සමාන නිෂ්පාදනයක්, අපනයනය කරනු ලබන රටේ දේශීය වෙළෙඳපොළෙහි පරිභෝජනය සඳහා නියමිතව ඇති විට, එම නිෂ්පාදනය සඳහා සාමාන්‍ය වෙළෙඳ

කටයුතුවල දී ගෙවන ලද හෝ ගෙවනු ලබන සංසන්දනාත්මක මිලෙහි පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) නිෂ්පාදන, අපනයන රට හරහා හුදෙක් නැවකින් නැවකට මාරු කිරීම පමණක් කරනු ලබන අවස්ථාවල දී;

(ආ) නිෂ්පාදන, අපනයන රටේ නිෂ්පාදනය කරනු නොලබන අවස්ථාවක දී; හෝ

(ඇ) අපනයන රටෙහි එම නිෂ්පාදන සඳහා සංසන්දනාත්මක මිලක් නොමැති අවස්ථාවක,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාමාන්‍ය වටිනාකම, සමාන නිෂ්පාදනයක්, ආරම්භක රටේ දේශීය වෙළෙඳපළෙහි පරිභෝජනය සඳහා නියමිතව ඇති විට, එම නිෂ්පාදනය සඳහා සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී ගෙවන ලද හෝ ගෙවනු ලබන සංසන්දනාත්මක මිලෙහි පදනම මත, තීරණය කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ, ආරම්භක රටේ පදනම මත සාමාන්‍ය වටිනාකම තීරණය කරනු ලබන අවස්ථාවක, 5 වන, 6 වන, 7 වන සහ 9 වන වගන්තිවල "අපනයන රට" පිළිබඳව කර ඇති සඳහන්, ආරම්භක රට පිළිබඳව කර ඇති සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාන්‍ය වටිනාකම, තුන්වන රටක් සඳහා වූ අපනයන මිල මත පදනම් විය යුතු බව.

**5.** (1) 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අපනයන රටේ දේශීය වෙළෙඳපළෙහි සමාන නිෂ්පාදනයක් සඳහා සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී අලෙවියක් නොමැති අවස්ථාවක හෝ අපනයන රටේ දේශීය වෙළෙඳපළෙහි යම් විශේෂිත වෙළෙඳපළ තත්ත්වයක් නිසා හෝ අඩු අලෙවියක් තිබීම නිසා, එම අලෙවිය මගින් යථා පරිදි සංසන්දනයක් සිදු කිරීමට ඉඩ නොලැබෙන අවස්ථාවක, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ සාමාන්‍ය වටිනාකම විය යුත්තේ -

(අ) යම් උචිත තුන්වන රටකට අපනයනය කරන ලද සමාන නිෂ්පාදනයක් සඳහා සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී ගෙවිය යුතු හෝ ගෙවනු ලබන සංසන්දනාත්මක මිල, එම මිල නියෝජනාත්මක මිලක් නම්, එම සංසන්දනාත්මක මිල; හෝ

(ආ) පරිපාලන, අලෙවිකරණ සහ සාමාන්‍ය වියදම් ඇතුළත්ව අපනයන රටෙහි එම නිෂ්පාදනය සඳහා වූ නිෂ්පාදන වියදම සහ ලාභ වශයෙන් සාධාරණ මුදලක් එකතු කළ විට ලැබෙන මිල වේ.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, අපනයන රටේ හෝ උචිත තුන්වන රටක දේශීය වෙළෙඳපළෙහි පරිභෝජනය සඳහා නියමිතව ඇති සමාන නිෂ්පාදනයේ අලෙවිය, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය ශ්‍රී ලංකාවට අලෙවි කළ ප්‍රමාණයෙන් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වන්නේ නම්, සාමාන්‍ය වටිනාකම තීරණය කිරීම සඳහා එම අලෙවිය සෑහෙන ප්‍රමාණයක් බවට සාමාන්‍යයෙන් සලකනු ලැබිය යුතු ය. එසේ වුව ද, අඩු අනුපාතයකට දේශීය අලෙවිය සිදු කිරීම, යෝග්‍ය සංසන්දනයක් සඳහා සෑහෙන ප්‍රමාණයකින් යුක්ත වන බවට සාක්ෂිවලින් පෙන්නුම් කරන අවස්ථාවක, එම අඩු අනුපාතය භාරගත යුතු ය.

සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී නොවන අලෙවිය.

**6.** (1) අපනයන රටේ දේශීය වෙළෙඳපළෙහි දී සිදුවන සමාන නිෂ්පාදනවල අලෙවිය හෝ (නිශ්චිත සහ වෙනස්වන සුළු) ඒකකයක නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලකට තුන්වන රටකට සිදු කරනු ලබන අලෙවිය, මිලෙහි හේතුව අනුව සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී සිදු නොකරනු ලැබූ බවට සැලකිය හැකි අතර, එම අලෙවිය සිදු කළේ පහත සඳහන් අවස්ථාවල දී බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක පමණක්, සාමාන්‍ය වටිනාකම තීරණය කිරීමේ දී එම අලෙවිය සැලකිල්ලට ගනු නොලැබිය හැකි ය. එනම් -

(අ) සැලකිය යුතු ප්‍රමාණයකින් සහ (මාස හයකට නොඅඩු සහ සාමාන්‍යයෙන් මාස දොළහක් වන) දීර්ඝ කරන ලද කාලසීමාවක් ඇතුළත; සහ

(ආ) සාධාරණ කාලයක් තුළ දී සියලු පිරිවැය ආපසු ලබා ගැනීම සඳහා විධිවිධාන සලස්වනු නොලබන මිලකට විකිණීමේ දී.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්යය සඳහා -

(අ) සැලකිල්ලට භාජන වී ඇති ගනුදෙනුවල ගණනය කරන ලද සාමාන්‍ය විකුණුම් මිල ගණනය කරන ලද සාමාන්‍ය පිරිවැයට වඩා අඩු අවස්ථාවක; හෝ

(ආ) පිරිවැයට වඩා අඩු මුදලකට සිදු කරන ලද අලෙවි කිරීම් ප්‍රමාණය, සැලකිල්ලට භාජන වී ඇති ගනුදෙනුවල දී විකුණනු ලැබූ ප්‍රමාණයෙන් සියයට විස්සක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන අවස්ථාවක,

පිරිවැයට වඩා අඩු මුදලකට කරන ලද අලෙවිය සැලකිය යුතු ප්‍රමාණයකින් සිදු කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(3) අලෙවි කරන අවස්ථාවේ දී ඒකකයක පිරිවැයට වඩා අඩුව පවතින මිල, විමර්ශනයට හෝ සමාලෝචනයට විෂය වන කාලසීමාවේ දී ඒකකයක ගණනය කරන ලද සාමාන්‍ය පිරිවැයට වඩා වැඩිව පවතින අවස්ථාවක, එම මිල සාධාරණ කාලසීමාවක් ඇතුළත පිරිවැය ආපසු ලබා ගැනීම සඳහා ඉඩ සලසන මිලක් ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලැබිය යුතු ය.

5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්යය සඳහා පිරිවැය ගණන් බැලීම.

**7.** (1) මේ පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, විමර්ශනයට භාජන වී ඇති අපනයනකරු හෝ නිෂ්පාදකයා විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා -

(අ) අපනයන රටේ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව පවත්වාගෙන යනු ලබන්නේ නම්; සහ

(ආ) සමාන නිෂ්පාදනයේ නිෂ්පාදනයට සහ අලෙවියට අදාළ පිරිවැය සාධාරණ ලෙස පිළිබිඹු කරන්නේ නම්,

එම වාර්තාවල පදනම මත, පිරිවැය සාමාන්‍යයෙන් ගණන් බලනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශේෂයෙන් ම උචිත ණය නිදහස් කිරීමේ සහ ක්ෂයවීමේ කාලසීමා තීරණය කිරීමට අදාළව මුදල් වෙන් කිරීම පිළිබඳ විමර්ශනයක් අතරතුර දී, අපනයනකරු හෝ නිෂ්පාදකයා විසින් ඓතිහාසිකව භාවිත කරනු ලැබ ඇති අපනයනකරු හෝ නිෂ්පාදකයා වෙත ඇති යම් සාක්ෂි ද ඇතුළුව පිරිවැය යථා පරිදි වෙන් කිරීම පිළිබඳව ඇති සියලු සාක්ෂි සහ ප්‍රාග්ධන වියදම් සහ වෙනත් සංවර්ධන පිරිවැය සඳහා දීමනා ද, සලකා බැලිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පිරිවැය සඳහා වූ වෙන්කිරීම්වල දැනටමත් පිළිබිඹු වී ඇත්නම් මිස, අනාගත හෝ වර්තමාන

නිෂ්පාදනවලට ප්‍රතිලාභ ලබා දෙන පුනරාවර්තන නොවන වියදම් විෂයාංග සඳහා හෝ විමර්ශන කාලය තුළ දී ආරම්භක මෙහෙයුම්වලින් පිරිවැයට බලපෑම් සිදුවන අවස්ථානුගත කරුණු සඳහා මිල උචිත පරිදි ගලපනු ලැබිය යුතු ය.

(4) ආරම්භක මෙහෙයුම් සඳහා සිදු කරන ලද වෙනස් කිරීම්වල ආරම්භක කාලසීමාව අවසානයේ දී ඇති පිරිවැය පිළිබිඹු විය යුතු ය. නැතහොත් එම කාලසීමාව විමර්ශන කාලසීමාව අභිබවා ව්‍යාප්ත වන්නේ නම්, විමර්ශන අතරතුර දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාධාරණ ලෙස සැලකිල්ලට ගත හැකි ඉතා මෑතක දී ගණන් බලනු ලැබූ පිරිවැය පිළිබිඹු විය යුතු ය.

නිෂ්පාදන වියදම තීරණය කිරීම.

8. (1) මේ පනතේ 5 වන සහ 6 වන වගන්තිවල කාර්යය සඳහා සමාන නිෂ්පාදනවල නිෂ්පාදන වියදම විය යුත්තේ -

(අ) අපනයන රටේ විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය නිපදවීමේ දී කෙළින් ම හෝ අන්‍යාකාරයකින් යුක්තවන ද්‍රව්‍යවල පිරිවැය සහ එම නිෂ්පාදනය සකස් කිරීමේ හෝ පිරිසැකසුම් කිරීමේ වියදම්; සහ

(ආ) (මූල්‍ය පිරිවැය සහ ලාභ ඇතුළුව) පරිපාලන, අලෙවි සහ සාමාන්‍ය වියදම් සඳහා සාධාරණ මුදලක්,

යන ඒවායේ මුළු එකතුව වේ.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මුදල් ප්‍රමාණ තීරණය කිරීම, විමර්ශනයට හෝ සමාලෝචනයට භාජන වී ඇති නිෂ්පාදකයා හෝ අපනයනකරු විසින් අපනයන රටේ සමාන නිෂ්පාදනවල සාමාන්‍ය වෙළෙඳ කටයුතුවල දී සිදු කරන ලද නිෂ්පාදන සහ අලෙවියට අදාළ පවත්නා දත්ත මත පදනම් විය යුතු ය. එම මුදල් ප්‍රමාණ මෙම පදනම මත තීරණය කරනු ලැබිය නොහැකි අවස්ථාවල දී එම මුදල් ප්‍රමාණ පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබිය හැකි ය:-

(අ) එම සමාන සාමාන්‍ය වර්ගයේ ම නිෂ්පාදනයක්, ආරම්භක රටේ දේශීය වෙළෙඳපළෙහි නිෂ්පාදනය සහ අලෙවිය සම්බන්ධයෙන් විමර්ශනයට හෝ සමාලෝචනයට භාජන වී ඇති අපනයනකරු හෝ නිෂ්පාදකයා විසින් දරන ලද සහ ලබා ගන්නා ලද සත්‍ය මුදල් ප්‍රමාණය;

(ආ) ආරම්භක රටේ දේශීය වෙළෙඳපළේ දී සමාන නිෂ්පාදන නිපදවීම සහ අලෙවි කිරීම සම්බන්ධයෙන් විමර්ශනයට භාජන වී ඇති වෙනත් අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් විසින් දරන ලද සහ ලබාගන්නා ලද සත්‍ය මුදල් ප්‍රමාණවල ගණනය කරන ලද සාමාන්‍ය වටිනාකම; හෝ

(ඇ) එසේ ලබාගන්නා ලාභ ප්‍රමාණය ආරම්භක රටේ දේශීය වෙළෙඳපළේ එම සමාන සාමාන්‍ය වර්ගයේ නිෂ්පාදන විකිණීම මත වෙනත් අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් විසින් සාමාන්‍යයෙන් ලබාගන්නා ලාභ නොඉක්මවන්නේ නම් වෙනත් යම් සාධාරණ ක්‍රමයක්.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයට භාජනය වී ඇති නිෂ්පාදනයේ නිර්මාණය කරන ලද වටිනාකම ආගණනය කිරීමේ දී, යම් සම්බන්ධතාවයක් ඇති පාර්ශ්වයන් අතර හෝ එකිනෙකා සමග වන්දි ගෙවීමේ වැඩ පිළිවෙළක් ඇති බව පෙනී යන පාර්ශ්වයන් අතර සිදු වූ ගනුදෙනුවකින් ඍජුව හෝ වක්‍රාකාරයෙන් උද්ගත වන යම් පිරිවැයක්, එකී පිරිවැය සම්බන්ධතාවයක් නැති පාර්ශ්වයන් අතර හෝ එකිනෙකා සමග වන්දි ගෙවීමේ වැඩපිළිවෙලක් නැති පාර්ශ්වයන් අතර වූ පිරිවැය සමග සංසන්දනය කළ හැකි නම් මිස, සැලකිල්ලට ගනු නොලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ගනුදෙනුවක් සැලකිල්ලට ගනු නොලැබුවහොත් සහ සලකා බැලීම සඳහා වෙනත් කිසිදු ගනුදෙනුවක් නොමැති නම්, (1) වන උපවගන්තිය යටතේ සැලකිල්ලට ගත යුතු බවට නියම කර ඇති මුදල් ප්‍රමාණ තීරණය කිරීම, සම්බන්ධතාවයක් නොමැති පාර්ශ්වයන් අතර හෝ එකිනෙකා අතර වන්දි ගෙවීමේ වැඩපිළිවෙළක් නොමැති පාර්ශ්වයන් අතර ගනුදෙනුව සිදුවූයේ නම් තිබිය හැකි මුදල සම්බන්ධයෙන් ඇති කරුණු මත පදනම් විය යුතු ය.

**9.** (1) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයක අපනයන මිල විය යුත්තේ එසේ විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනය, අපනයන රටෙන් ශ්‍රී ලංකාවට අපනයනය කිරීම සඳහා විකුණන ලද අවස්ථාවක දී එම නිෂ්පාදනය සඳහා ඇත්ත වශයෙන් ගෙවන ලද හෝ ගෙවනු ලබන මිල යි. අපනයන මිල.

(2) අපනයන මිලක් නොමැති අවස්ථාවක දී හෝ අපනයනකරුවකු සහ ආනයනකරුවකු හෝ තුන්වන පාර්ශ්වයක් අතර සම්බන්ධයක් හෝ වන්දි ගෙවීමේ වැඩ පිළිවෙළක් තිබීම නිසා අපනයන මිල කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, අපනයන මිල නිර්මාණය කරනු ලැබිය හැකි වනුයේ -

(අ) ආනයනය කරන ලද නිෂ්පාදන ස්වාධීන ගැනුම්කරුවකු වෙත පළමුවෙන් ම නැවත විකුණනු ලැබූ මිලෙහි පදනම මත; හෝ

(ආ) නිෂ්පාදන ස්වාධීන ගැනුම්කරුවකු වෙත නැවත විකුණනු නොලැබුවහොත් හෝ ආනයනය කරනු ලැබූ තත්ත්වයෙන් නැවත විකුණනු නොලැබුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබූ සාධාරණ පදනමක් මත ය.

(3) අපනනයන මිල (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට නිර්මාණය කරනු ලැබුවහොත්, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනය ආනයනය කිරීම සහ නැවත විකිණීම අතර දරන ලද වියදම සඳහා අවකාශ සැලසිය යුතු ය.

(4) මේ පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආරම්භක රටේ පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාමාන්‍ය වටිනාකම තීරණය කරනු ලබන අවස්ථාවක, අපනයන මිල වනුයේ, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය ආරම්භක රටේ දී අපනයනය සඳහා විකුණනු ලැබූ විට සත්‍ය වශයෙන් ගෙවනු ලැබූ හෝ ගෙවිය යුතු මිල වේ.

සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල සංසන්දනය කිරීම.

**10.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයක අපනයන මිල සහ සාමාන්‍ය වටිනාකම අතර සාධාරණ සැසඳුමක් කළ යුතු අතර, එම සැසඳුම එකම වෙළෙඳ මට්ටමක දී, එනම් සාමාන්‍යයෙන් කර්මාන්ත ශාලා මට්ටමේ දී සහ හැකිතාක් දුරට එක සමානම අවස්ථාවන්හි දී කරන ලද විකිණීම් සම්බන්ධයෙන් සිදු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල සැසඳීමේ දී පහත දැක්වෙන එක් එක් අවස්ථාවන් හි දී ඒවාට ලැබිය යුතු අවස්ථා මත නිසි ඉඩ ප්‍රස්ථා සැලසිය යුතු ය:-

(අ) මිල සංසන්දනය කිරීමට බලපාන වෙනස්කම්;

(ආ) විකිණීම පිළිබඳ කොන්දේසි සහ නියමයන් අතර වෙනස්කම්, බදු අයකිරීම, වෙළෙඳ වට්ටම්, ප්‍රමාණ, භෞතික ලක්ෂණ; සහ

(ඇ) මිල සංසන්දනය කිරීමට බලපාන උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් පෙන්නුම් කරනු ලබන වෙනත් වෙනස්කම්.

(3) (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියා කරන විට, කරන ලද වෙනස්කම් දෙවරක් සිදු නොවන බවට ඔහු සහතික විය යුතු ය.

(4) මේ පනතේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අපනයන මිල නිර්මාණය කරනු ලබන අවස්ථාවල දී, ආනයනය සහ නැවත විකිණීම අතර ගෙවන ලද තීරුබදු සහ බදු ඇතුළත්ව පිරිවැය වෙනුවෙන් සහ උපචිත වන ලාභය වෙනුවෙන් සාධාරණ ප්‍රමාණයක වෙන් කිරීමක් සිදු කරනු ලැබිය හැකි අතර, මිල සැසඳීමේ හැකියාව බලපෑමට ලක්ව ඇති අවස්ථාවල දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඡේදය යටතේ නිර්මාණය කරන ලද අපනයන මිලෙහි වෙළෙඳ මට්ටමට සමාන වෙළෙඳ මට්ටමකට සාමාන්‍ය වටිනාකම තීරණය කරනු ලැබිය යුතු ය; නැතහොත් මෙම වගන්තිය යටතේ නියම කර ඇති පරිදි නිසි පරිදි ඉඩ ප්‍රස්ථාවක් ලබා දිය යුතු ය.

(5) සාධාරණ සැසඳීමක් සිදු කරන බවට සහතිකවීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රශ්නයට අදාළ පාර්ශ්වයන්ට ඔවුන්ගෙන් අවශ්‍ය වන තොරතුරු පිළිබඳව දැනුම්දිය යුතු අතර, ප්‍රශ්නයට අදාළ පාර්ශ්වයන් මත, අසාධාරණ ඔප්පු කිරීමේ භාරයක් පනවනු නොලැබිය යුතු ය.

සංසන්දනය කිරීමේ ක්‍රම.

11. (1) 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංසන්දනය කළ හැකි සියලු අපනයන ගනුදෙනුවල ගණනය කරන ලද සාමාන්‍ය වටිනාකම සහ ගණනය කරන ලද සාමාන්‍ය මිල අතර සංසන්දනය කිරීමේ හෝ ගනුදෙනුවකින් ගනුදෙනුවකට සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල සංසන්දනය කිරීමේ පදනම මත, සාමාන්‍යයෙන් ප්‍රපාතන ආන්තිකයක පැවැත්ම තීරණය කරනු ලැබිය යුතු ය.

(2) විවිධ මිලදී ගන්නන් අතර, ප්‍රදේශ හෝ කාලසීමා අතර ඉතා පැහැදිලි වෙනසක් ඇති අපනයන මිල රටාවක් ඇති බවට අධ්‍යක්ෂ

ජනරාල්වරයාට පෙනී ගියහොත්, ගණනය කරන ලද සාමාන්‍ය පදනම මත සකස් කරන ලද සාමාන්‍ය වටිනාකමක් තනි තනි අපනයන ගනුදෙනුවල මිල සමග සංසන්දනය කරනු ලැබිය හැකි ය. ගණනය කරන ලද සාමාන්‍යයකින් සාමාන්‍යයකට හෝ ගනුදෙනුවකින් ගනුදෙනුවකට සංසන්දනය කිරීම භාවිත කිරීම මගින් එම වෙනස උචිත පරිදි සැලකිල්ලට ගනු ලැබිය නොහැකි වන්නේ මන්ද යන්න, එවැනි අවස්ථාවල දී පැහැදිලි කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

**ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම.**

**12.** (1) 10 වන වගන්තිය සහ 11 වන වගන්තිය යටතේ සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල සංසන්දනය කිරීම සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක, එම පරිවර්තනය (3) වන සහ (5) වන උපවගන්තිවලට යටත්ව, විකිණීම සිදු කරන දිනයේ පවතින විදේශ විනිමය අනුපාතය භාවිත කරමින් සිදු කළ යුතු ය.

(2) සාමාන්‍යයෙන් විකිණීම සිදු කළ දිනය විය යුත්තේ, අපනයන නිෂ්පාදන විකිණීමේ කොන්දේසි ඔප්පු කරන කවර හෝ ගිවිසුමේ දිනය, මිල දී ගැනීමේ අණකරයේ දිනය, අණකරය ස්ථිර කිරීමේ දිනය හෝ ඉන්වොයිස් පත්‍රයේ දිනය වේ.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අපනයන වෙළෙඳාමකට අදාළව ඉදිරි විනිමය අනුපාතිකයක් භාවිත කරනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම සියලු අදාළ ගනුදෙනු සඳහා ඉදිරි අලෙවියේ විනිමය අනුපාතය භාවිත කරනු ලැබිය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියේ සඳහන් සැසඳුම සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම අවශ්‍ය වන අවස්ථාවක; සහ

(ආ) මෙම ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතය කෙටිකාලීන උච්චාවචනයකට ලක් වී ඇති අවස්ථාවක,

එම සැසඳුමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම උච්චාවචනය සැලකිල්ලට නොගත යුතු ය.

(5) (අ) (1) වන උපවගන්තියේ සඳහන් සැසඳුම සඳහා ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම අවශ්‍ය වන අවස්ථාවක; සහ

(ආ) විමර්ශනවලට භාජන වී ඇති කාලය තුළ දී ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාත අතර ධරණීය චලනයක් සිදු වී ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වී ඇති අවස්ථාවක,

ධරණීය චලනය පිළිබිඹු වන පරිදි අපනයන මිල වෙනස්කර ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අපනයනකරුවන්ට දින හැටකට නොඅඩු කාලයක් ලබා දිය යුතු ය.

පුද්ගල ප්‍රපාතන ආන්තික.

13. (1) රීතියක් වශයෙන්, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ හඳුනාගත් එක් එක් අපනයනකරු හෝ නිෂ්පාදකයා සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙන් වෙන් වූ ප්‍රපාතන ආන්තිකයක් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් හඳුනාගත් අපනයනකරු හෝ නිෂ්පාදකයා සඳහා පුද්ගල ප්‍රපාතන ආන්තිකයක් තීරණය කිරීම ප්‍රායෝගික නොවන ප්‍රමාණයට අපනයනකරුවන්, නිෂ්පාදකයන්, ආනයනකරුවන් හෝ විමර්ශනයට භාජන වූ නිෂ්පාදන වර්ග විශාල වන අවස්ථාවක, තෝරා ගන්නා අවස්ථාවේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඇති තොරතුරුවල පදනම මත, සංඛ්‍යාත්මක වශයෙන් වලංගු සාම්පල භාවිත කරමින්, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ සාධාරණ ප්‍රමාණයකට හෝ විමර්ශනයකට භාජන වූ නිෂ්පාදනවල සාධාරණ ප්‍රමාණයකට, නැතහොත් සාධාරණ ලෙස විමර්ශනය කරනු ලැබිය හැකි වූ ප්‍රශ්නගත රටෙන් අපනයනය කළ අපනයන ප්‍රමාණයේ විශාලතම ප්‍රතිශතයට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට සිය පරීක්ෂාව සීමා කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අපනයනකරුවන්, නිෂ්පාදකයන්, ආනයනකරුවන් හෝ නිෂ්පාදන වර්ග තේරීම අදාළ අපනයනකරුවන්, නිෂ්පාදකයන් හෝ ආනයනකරුවන්ගේ අදහස් විමසා සහ ඔවුන්ගේ කැමැත්ත ඇතිව සිදු කිරීම වඩා යෝග්‍ය ය.

(4) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂණය සීමා කොට ඇති අවස්ථාවක වුව ද, විමර්ශනය කර ගෙන යන අතරතුර දී සලකා බැලීම සඳහා නියමිත වේලාවට අවශ්‍ය තොරතුරු සිය කැමැත්තෙන්ම ඉදිරිපත් කරන යම් අපනයනකරුවකු හෝ නිෂ්පාදකයකු සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පුද්ගල ප්‍රපාතන ආන්තිකයක් තීරණය කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, තනි පුද්ගල පරීක්ෂණ, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනිසි බරක් වන ප්‍රමාණයට සහ විමර්ශනය නියමිත කාලය තුළ අවසන් කිරීම වළක්වන ප්‍රමාණයට අපනයනකරුවන්ගේ හෝ නිෂ්පාදකයන්ගේ ප්‍රමාණය වැඩි වී ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය කැමැත්තෙන් ප්‍රතිචාර දැක්වීමේ පදනම මත පුද්ගල ප්‍රපාතන ආන්තිකයක් තීරණය කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අතර, පරීක්ෂණය සාම්පලයේ අපනයනකරුවන් සහ නිෂ්පාදකයන් හට පමණක් සීමා කළ හැකි ය.

**විමර්ශනය ආරම්භ කිරීම**

ලිඛිත ඉල්ලුම් පත්‍රයක අවශ්‍යතාව.

**14.** (1) 19 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට හැර, මේ පනතේ මේ කොටස යටතේ වූ විමර්ශනයක් ශ්‍රී ලාංකීය කර්මාන්තය විසින් හෝ එය වෙනුවෙන්, නියම කරනු ලැබිය හැකි ගාස්තුව ද සමග නියමිත ආකෘතියෙන් ලිඛිත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ විට, ආරම්භ කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පිටපත් සංඛ්‍යාවකින් යුක්තව ඉල්ලුම් පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා, යම් ශ්‍රී ලාංකික නිෂ්පාදකයන් විසින් සාමූහිකව නිපදවන ලද නිෂ්පාදන ප්‍රමාණය ශ්‍රී ලාංකීය කර්මාන්තයේ එම කොටස මගින් නිපදවන ලද දේශීය සමාන නිෂ්පාදනයේ සම්පූර්ණ නිෂ්පාදනයෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් සාමූහිකව සංයුක්ත වන අවස්ථාවක, එම නිෂ්පාදකයන් විසින් එම ඉල්ලීමට සහාය දක්වන බව හෝ විරුද්ධත්වය පළ කරන බව ප්‍රකාශ කරමින් එම ඉල්ලුම් පත්‍රයට සහාය දෙනු ලබන්නේ නම්, එම ඉල්ලුම් පත්‍රය "ශ්‍රී ලාංකීය කර්මාන්තය විසින් හෝ එය වෙනුවෙන්" ඉදිරිපත් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඉල්ලුම් පත්‍රයට සහාය පළ කරන නිෂ්පාදකයන්, ශ්‍රී ලංකාවේ කර්මාන්තය විසින් නිෂ්පාදනය කරනු ලබන සමාන දේශීය නිෂ්පාදනයේ සම්පූර්ණ නිෂ්පාදනයෙන් සියයට විසිපහකට නොඅඩු ප්‍රමාණයක් සඳහා වගකිව යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නිෂ්පාදකයන් අතිවිශාල සංඛ්‍යාවක් සම්බන්ධ වන කොටස්වලට වෙන් කරන ලද කර්මාන්ත සම්බන්ධයෙන් වන විට, සංඛ්‍යාත්මක වශයෙන් වලංගු සාම්පල තාක්ෂණ ප්‍රයෝජනයට ගනිමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහාය හෝ විරුද්ධත්වය තීරණය කරනු ලැබිය හැකි ය.

තොරතුරු.

**15.** පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඉල්ලුම්කරු වෙත සාධාරණ ලෙස ඇති තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා 14 වන වගන්තිය යටතේ නියම කර ඇති ඉල්ලුම් පත්‍රය මගින් ඉඩ සැලැස්විය යුතු ය. එනම්:–

(අ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය;

(ආ) ඉල්ලුම්කරු විසින් නිෂ්පාදනය කරන ලද දේශීය සමාන නිෂ්පාදනයේ ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳ විස්තරයක්;

(ඇ) ශ්‍රී ලාංකීය කර්මාන්තයේ සමාන නිෂ්පාදනයේ හඳුනාගත් වෙනත් සියලු නිෂ්පාදකයන්ගේ නම්, ලිපින සහ දුරකථන අංක ද, ඉල්ලුම්කරු දන්නා පරිදි එම හඳුනාගත් නිෂ්පාදකයන් විසින් නිපදවනු ලබන සමාන නිෂ්පාදනයේ ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳ විස්තරයක් ද ඇතුළත් කරමින් ශ්‍රී ලාංකික කර්මාන්තය විසින් හෝ එය වෙනුවෙන් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ශ්‍රී ලාංකික කර්මාන්තයේ අනන්‍යතාව;

(ඈ) නිෂ්පාදනයේ තාක්ෂණික ගති ලක්ෂණ හා ප්‍රයෝජන සහ එහි සාමූහික භාණ්ඩ විස්තරය සහ සංකේත පද්ධති වර්ගීකරණය ඇතුළුව ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනයේ සම්පූර්ණ විස්තරයක්;

(ඉ) ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනය, නිෂ්පාදනය කරනු ලැබුවේ හෝ නිපදවනු ලැබුවේ යම් රටක ද, එම රටේ නම සහ එය ආනයනය කරනු ලැබ ඇත්තේ නිෂ්පාදනය කළ හෝ නිපදවනු ලැබූ රට හැර වෙනත් රටකින් නම්, එම නිෂ්පාදන ආනයනය කරනු ලැබූ අතරමැදි රටෙහි නම;

(ඊ) ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනය විකුණන බවට ඉල්ලුම්කරු විශ්වාස කරන එක් එක් තැනැත්තන්ගේ නම් සහ ලිපින සහ පසුගිය ආසන්නතම මාස දොළහ ඇතුළත ශ්‍රී ලංකාවට අපනයනය කරනු ලැබ ඇති සම්පූර්ණ අපනයනවලින් එම තැනැත්තා විසින් වගකිව යුතු අපනයන ප්‍රමාණය;

(උ) අපනයන රටේ හෝ ආරම්භක රටේ දේශීය වෙළෙඳ පොළෙහි පරිභෝජනය සඳහා නියමිත වූ විට, ප්‍රශ්නයට තුඩු දී ඇති නිෂ්පාදනය විකුණනු ලබන මිල පිළිබඳ තොරතුරු හෝ උචිත අවස්ථාවන්හි දී, අපනයන රටෙන් හෝ ආරම්භක රටෙන් තුන්වන රටකට නිෂ්පාදනය විකුණනු ලබන මිල පිළිබඳ තොරතුරු හෝ ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනයේ නිර්මාණය කරන ලද වටිනාකම පිළිබඳ තොරතුරු;

(ඌ) අපනයන මිල පිළිබඳ තොරතුරු හෝ උචිත අවස්ථාවන්හි දී, ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ ස්වාධීන ගැනුම්කරුවකුට ප්‍රථම වරට නැවත විකුණනු ලැබූ මිල පිළිබඳ තොරතුරු සහ මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි සිදු කරන ලද යම් වෙනස්කම් පිළිබඳ තොරතුරු;

(එ) ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන ආනයන ප්‍රමාණයේ විකාශනය වීම පිළිබඳ තොරතුරු, ශ්‍රී ලාංකීය වෙළෙඳපළෙහි සමාන දේශීය නිෂ්පාදනවල මිල කෙරෙහි මෙම ආනයනවල බලපෑම සහ මේ පනතේ 76 වන වගන්තියේ, 77 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල සහ 78 වන වගන්තියේ ලැයිස්තුගත කර ඇති බලපෑම් වැනි ශ්‍රී ලාංකීය කර්මාන්තයේ තත්ත්වයට බලපෑමක් ඇති අදාළ සිද්ධිමය කරුණු සහ සලකුණුවලින් ප්‍රදර්ශනය කරනු ලබන ශ්‍රී ලාංකීය කර්මාන්තය කෙරෙහි ආනයනවලින් සිදුවන බලපෑම් සහ 77 වන වගන්තියේ (4) වන, (5) වන, (6) වන සහ (7) වන උපවගන්ති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතුකාරක සම්බන්ධතාවයක පැවැත්ම පිළිබඳ තොරතුරු.

ඉල්ලීමට ප්‍රසිද්ධියක් දීම.

**16.** (1) විමර්ශනයක් ආරම්භ කිරීමට තීරණයක් ගනු ලැබ ඇත්නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යවරයා විසින් 14 වන

වගන්තිය යටතේ විමර්ශනයක් ආරම්භ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයට ප්‍රසිද්ධියක් ලබාදීමෙන් වැළකී සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනතේ 15 වන වගන්තියේ නියමයන් සපුරාලමින් ඉල්ලුම් පත්‍රයක් ලැබීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහු විසින් එම කරුණු පිළිබඳව අදාළ එක් එක් අපනයන රටෙහි ආණ්ඩුව වෙත වහාම දැනුම් දිය යුතු ය.

ඉල්ලීමක් ඉල්ලා අස්කර ගැනීම.

17. 14 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් පහත සඳහන් අවස්ථාවන්හි දී ඉල්ලා අස්කරගනු ලැබිය හැකි ය:-

(අ) විමර්ශනයක් ආරම්භ කිරීමට පෙර කවර හෝ අවස්ථාවක, එවැනි අවස්ථාවක ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බවට සැලකිය යුතු ය; නැතහොත්

(ආ) විමර්ශනයක් ආරම්භ කිරීමෙන් පසු කවර හෝ අවස්ථාවක, එවැනි අවස්ථාවක එම විමර්ශනය ශ්‍රී ලංකාවේ ආර්ථික යහපත උදෙසා දිගටම පවත්වාගෙන යා යුතු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පියවර ගැනීමකින් තොරව විමර්ශනය අවසන් කරනු ලැබිය යුතු ය.

ආරම්භ කිරීම සඳහා වූ තීරණය.

18. (1) ඉල්ලුම් පත්‍රයෙහි ලබා දී ඇති සාක්ෂිවල නිරවද්‍යතාව සහ ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කිරීමෙන් පසු, විමර්ශනයක් ආරම්භ කිරීම සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇත්ද යන්න ඔහු විසින් තීරණය කරනු ලැබිය යුතු ය. තීරණයකට එළඹීමේ දී අවශ්‍ය අවස්ථාවන්හි දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් තවදුරටත් තොරතුරු ලබාගත හැකි ය.

(2) (අ) ඉල්ලුම්පත්‍රය ශ්‍රී ලාංකීය කර්මාන්තයක් විසින් හෝ ඒ වෙනුවෙන් ඉදිරිපත් කර ඇති බවට; හෝ

(ආ) මේ පනතේ අර්ථානුකූලව ප්‍රපාතනය, හානි සිදුකිරීම සහ හේතුකාරක සබඳතාවයක් පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය ලැබී දින හතළිහක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් ආරම්භ කරන්නේ ද නැද්ද යන්න තීරණය කරනු ලැබිය යුතු ය.

ස්වයං ආරම්භ කිරීම.

**19.** යම් විමර්ශනයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලාංකික කර්මාන්තයක් විසින් හෝ එය වෙනුවෙන් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් නොකොට -

(අ) විමර්ශනයක් ආරම්භ කිරීම සාධාරණීකරණය කිරීම සඳහා මේ පනතේ අර්ථානුකූලව ප්‍රපාතනයක්, හානි සිදු කිරීමක්, සහ හේතුකාරක සබඳතාවයක් පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන අවස්ථාවක; සහ

(ආ) ඉදිරිපත් වී ඇති සාක්ෂිවල පදනම මත විමර්ශනයක් ආරම්භ කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා නිර්දේශ කරන අවස්ථාවක,

අමාත්‍යවරයා විසින් විශේෂ අවස්ථානුගත කරුණුවලදී විමර්ශනයක් ආරම්භ කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කරනු ලැබිය හැකි ය.

සැලකිල්ලට ගත යුතු නැති ආනයන පරිමාණ සහ සුළු ප්‍රමාණයක ප්‍රපාතන ආන්තිකයන්.

**20.** මේ පනතේ 18 වන වගන්තියේ සහ 19 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබී ඇති තොරතුරු අනුව -

(අ) විමර්ශනයට භාජන වී ඇති රටවලින් ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනයේ ආනයන ශ්‍රී ලංකාවේ ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන සහ සමාන නිෂ්පාදනවල ආනයනවලින් සියයයට තුනකට වඩා තනිව සංයුක්ත වන සහ, සාමූහිකව එම ආනයන ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන සහ සමාන නිෂ්පාදනවල ආනයනයෙන් සියයට හතකට වැඩි ප්‍රමාණයක් සංයුක්ත වන අවස්ථාවල දී හැර, අදාළ රටෙන් ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනයේ ආනයන ශ්‍රී ලංකාවේ ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන සහ දේශීය සමාන නිෂ්පාදනවල මුළු ආනයනයෙන් සියයට තුනකට වඩා අඩු ප්‍රමාණයක් වන බවට;

(ආ) අපනයන මිලේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රපාතන ආන්තිකය සියයට දෙකට වඩා අඩු බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් ආරම්භ කරනු නොලැබිය යුතු ය.

විමර්ශනයක් ආරම්භ කිරීමේ තීරණය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

**21.** (1) මේ පනතේ මේ කොටස යටතේ විමර්ශනයක් ආරම්භ කරනු ලැබූ අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ බවට හඳුනාගත් අපනයනකරුවන්ට, ආනයනකරුවන්ට සහ ආනයන සහ අපනයනකරුවන්ගේ සංගම්වල නියෝජිතයන්ට මෙන්ම අපනයන රටවල නියෝජිතයන්ට, පැමිණිලිකරුවන්ට සහ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට, එම විමර්ශනය පිළිබඳ දැනුම් දිය යුතු ය; සහ

(ආ) ශ්‍රී ලංකාවෙහි පුළුල් ලෙස සංසරණය වන යම් පුවත්පතක භාෂා තුනෙන් ම දැන්වීමක් පළ කිරීම මගින් මහජනතාවට දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් නිවේදනය සහ ප්‍රසිද්ධ දැන්වීමෙහි පහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු අන්තර්ගත විය යුතු යː-

(අ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ අපනයන රටේ හෝ රටවල නම් හෝ ඊට වෙනස් නම්, ආරම්භක රටේ හෝ රටවල නම්;

(ආ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ තාක්ෂණික ලක්ෂණ සහ ප්‍රයෝජන ද, එහි සාමූහික භාණ්ඩ විස්තරය සහ සංකේත පද්ධති වර්ගීකරණය ද ඇතුළු එම නිෂ්පාදනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක්;

(ඇ) ප්‍රපාතන චෝදනාව සඳහා වූ පදනම ඇතුළු විමර්ශනය කළ යුතු, කරන ලදැයි කියනු ලබන ප්‍රපාතනය පිළිබඳ විස්තරයක්;

(ඈ) හානිය සහ හේතුකාරක සබඳතාවය පිළිබඳ චෝදනා පදනම් වී ඇත්තේ යම් කරුණු මත ද, එම කරුණු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්;

(ඉ) තොරතුරු සහ මත පළකිරීම් ඉදිරිපත් කරනු ලැබිය හැකි ලිපිනය;

(ඊ) විමර්ශනය ආරම්භ කිරීමේ දිනය; සහ

(උ) විමර්ශනය පැවැත්වීම සඳහා යෝජිත සැලැස්ම.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියමිත දැන්වීම පළකරනු ලැබූ දිනයේ දී විමර්ශනයක් ආරම්භ වූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

**ඉල්ලීම පිළිබඳව හෙළිකිරීම.**

**22.** (1) රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීමට අදාළව 25 වන වගන්තියේ අඩංගු විධිවිධානවලට යටත්ව, විමර්ශනයක් ආරම්භ කළ වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 14 වන වගන්තිය යටතේ තමා වෙත ලැබී ඇති ලිඛිත ඉල්ලීමේ අඩංගු සම්පූර්ණ කරුණු සියලුම හඳුනාගත් අපනයනකරුවන්ට සහ විදේශීය නිෂ්පාදකයන්ට ද, අපනයන රටේ බලධාරීන්ට ද දැනුම් දිය යුතු අතර, ඉල්ලා සිටි විටකදී එම විමර්ශනය පිළිබඳව උනන්දුවක් දක්වන වෙනත් යම් පාර්ශ්වයක් වෙත ද එම ඉල්ලීම පිළිබඳ තොරතුරු ලබා දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අදාළ අපනයනකරුවන්ගේ සංඛ්‍යාව විශාල වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රයෙහි අඩංගු කරුණු යම් අදාළ වෙළෙඳ සංගමයකට හෝ එසේ කිරීම අපහසු නම් අපනයන රටේ බලධාරීන්ට ලබා දිය හැකි ය.

## විමර්ශනය පැවැත්වීම

**විමර්ශනයක් පැවැත්වෙන කාලසීමාව.**

**23.** විශේෂ අවස්ථානුගත කරුණුවල දී හැර, ප්‍රපාතන විරෝධී විමර්ශනයක් ආරම්භ කොට මාස දොළහක කාලසීමාවක් ඇතුළත සහ එය ආරම්භ කොට මාස දහඅටක කාලසීමාවක් ගතවීමට පෙර එම විමර්ශනය අවසන් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

**රේගු නිෂ්කාශනය.**

**24.** ප්‍රපාතන විරෝධී විමර්ශනයක් ආරම්භ කිරීම මගින් රේගු නිෂ්කාශන කාර්ය පටිපාටියට හානියක් සිදු නොවිය යුතු අතර, පියවර ගනු ලැබූ විට, එම පියවර අදාළ කර ගැනීම සඳහා අවශ්‍ය නියමයන්ට වඩා අතිරේක නියමයන් කිසිවක් අදාළ කර නොගත යුතු ය.

රහස්‍යභාවය.

**25.** (1) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රහස්‍යභාවය රැකීම සඳහා හිමිකම් ඇති, ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රහස්‍ය ලෙස තබාගත යුතු අතර, එම තොරතුරු ඉදිරිපත් කරන පාර්ශ්වයේ විශේෂ අවසරයක් නොමැතිව, ඒවා හෙළිකරනු නොලැබිය යුතු ය.

(2) තොරතුරු ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් රහස්‍ය ලෙස නම් කර ඇති, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ හෙළිදරව් කිරීමෙන් ආරක්ෂා කර ඇති සෑම තොරතුරක් ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රහස්‍ය ලෙස සැලකිය යුතු ය.

(3) පහත දැක්වෙන ආකාරයේ තොරතුරු, එම තොරතුරු ඉදිරිපත් කරනු ලබන තැනැත්තා විසින් රහස්‍ය ලෙස නම් කරනු ලැබ ඇත්නම්, (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5 (1) වන වගන්තියේ (i) වන ඡේදයට අනුව, රහස්‍ය ආකාරයෙන් සපයන ලද බව සැලකිය යුතු ය -

(අ) නිෂ්පාදනයක ස්වභාවයට, නිෂ්පාදන ක්‍රියාවලියට, මෙහෙයුම්වලට, නිෂ්පාදන උපකරණවලට හෝ යන්ත්‍රෝපකරණවලට අදාළ ව්‍යාපාර හෝ වාණිජ රහස්;

(ආ) සමාගමක මූල්‍ය තත්ත්වයට අදාළ ප්‍රසිද්ධ කර නොමැති තොරතුරු; සහ

(ඇ) පිරිවැය, ගනුදෙනුකරුවන් හඳුනාගැනීම, අලෙවිය, ඉන්වෙන්ටරි පොත්, නැව්බඩු තොග, යම් නිෂ්පාදනයක් නිපදවීම සහ විකිණීමට අදාළ යම් ආදායමක, ලාභයක, අලාභයක හෝ වියදමක ප්‍රමාණය හෝ මූලාශ්‍රය පිළිබඳ තොරතුරු.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දී ඇති ඇතැම් තොරතුරු සඳහා රහස්‍ය තත්ත්වය ලබා දෙන ලෙස, එවැනි සැලකීමක් ඉල්ලා සිටීම සඳහා වන හේතු ද සමග, තොරතුරු ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීමක් මාර්ගයෙන් ඉල්ලා සිටීමට විමර්ශනයක පාර්ශ්වකරුවකුට හැකි ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවැනි ඉල්ලීම් පිළිබඳව ඉක්මණින් සලකා බැලිය යුතු අතර, එසේ රහස්‍ය ලෙස සැලකීමට ඉඩ ලබා නොදෙන

බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්, ඒ බව තොරතුරු ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත දැනුම් දිය යුතු ය.

(5) විමර්ශනයක පාර්ශ්වකරුවන් විසින් රහස්‍ය ලෙස සැලකීම අපේක්ෂා කරනු ලබන සියලු තොරතුරුවල රහස්‍ය නොවන සාරාංශයක් ඉදිරිපත් කළ යුතු අතර, එම සාරාංශය, රහස්‍ය පිටපතෙහි සපයා ඇති සංඛ්‍යාවල සුචිගත කිරීමක් වශයෙන් හෝ එම ලේඛනයෙහි ලකුණු කරන ලද ඉවත් කිරීම් වශයෙන් දැක්විය යුතු ය; තවද එම සාරාංශය මගින් රහස්‍ය ලෙස ඉදිරිපත් කරන ලද තොරතුරුවල අන්තර්ගත කරුණු සාධාරණ ලෙස තේරුම් ගැනීමට ඉඩ සැලැස්විය යුතු ය.

(6) විශේෂ අවස්ථානුගත කරුණුවල දී රහස්‍යභාවය අපේක්ෂා කරන තොරතුරු සාරාංශයකින් දැක්විය නොහැකි බව පාර්ශ්වයන් විසින් සඳහන් කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවල දී සාරාංශය ලබාදීමට නොහැකි වීමට හේතු පිළිබඳ ප්‍රකාශයක් එම පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) (5) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද රහස්‍ය නොවන සාරාංශය මගින් එම වගන්තියේ නියමයන් සපුරාලීමට අපොහොසත් වන බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, රහස්‍ය බවට සැලකීම සඳහා කරන ලද ඉල්ලීමට ඉඩ ලබා නොදෙන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවල දී තොරතුරු සපයන තැනැත්තා එම තොරතුරු ප්‍රසිද්ධ කිරීමට අකමැති වන්නේ නම්, තොරතුරු සත්‍ය වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට පෙන්වා දෙනු ලැබ ඇත්තේ නම් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තොරතුරු සැලකිල්ලට නොගත යුතු අතර, එම තොරතුරු ඒවා ඉදිරිපත් කළ පාර්ශ්වයන් වෙත ආපසු යැවිය යුතු ය.

ලැබී ඇති තොරතුරු පිළිබඳ විශ්වාසය තැබීම.

**26.** (1) විමර්ශනයක් අතරතුර යම් අවස්ථාවක දී, උනන්දුවක් දක්වන යම් පාර්ශ්වයක් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන කාලය ඇතුළත යම් අවශ්‍ය තොරතුරුවලට ප්‍රවේශය ලබාදීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක හෝ වෙනත් යම් ආකාරයකින් එම තොරතුරු නොසපයන අවස්ථාවක; හෝ

(ආ) අන්‍යාකාරයකින් විමර්ශනයේ කටයුතු සැලකිය යුතු ලෙස අඩාළ කරන අවස්ථාවක,

ඉල්ලුම් පත්‍රයේ අන්තර්ගත තොරතුරු ඇතුළු ලැබී ඇති තොරතුරුවල පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයාට මූලික සහ අවසාන තීරණවලට (අස්ත්‍යාර්ථ නැතහොත් නිශේධනීය) එළැඹිය හැකි ය. මේ උපවගන්තිය යටතේ තීරණයකට එළඹීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ පළමුවන උපලේඛනයේ විධිවිධාන අනුගමනය කළ යුතු ය.

(2) ඉල්ලා ඇති තොරතුරු සැපයීමේ දී, උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින්, විශේෂයෙන් ම කුඩා සමාගම් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා සැලකිල්ලට ගත යුතු අතර, අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රායෝගික සහායක් ලබා දිය යුතු ය. නැතහොත් යම් නිශ්චිත තොරතුරක් ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය.

ප්‍රසිද්ධ ලිපිගොනුව සහ ඊට ප්‍රවේශය.

**27.** (1) මේ පනත යටතේ පවත්වනු ලබන එක් එක් විමර්ශනයකට හෝ සමාලෝචනයකට අදාළව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ ලිපිගොනුවක් සකස් කොට පවත්වාගෙන යා යුතු ය. 25 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ප්‍රසිද්ධ ලිපිගොනුවේ පහත සඳහන් දෑ ඇතුළත් කළ යුතු යः-

(අ) විමර්ශනයට හෝ සමාලෝචනයට අදාළ සියලු ප්‍රසිද්ධ දැන්වීම්;

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නමාලා, එම ප්‍රශ්නමාලාවලට දක්වන ලද ප්‍රතිචාර සහ ලිඛිත සන්නිවේදන ඇතුළු සියලු ලේඛන;

(ඇ) 33 වන වගන්තිය යටතේ සකස් කරන ලද සත්‍යායන වාර්තා ඇතුළු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සකස් කරන ලද හෝ ලබාගන්නා ලද වෙනත් සියලු තොරතුරු; සහ

(ඈ) ප්‍රසිද්ධ කිරීම සඳහා උචිත බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන වෙනත් යම් ලේඛන.

(2) විමර්ශනය, සමාලෝචනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස වූ අධිකරණමය සමාලෝචනයක් පවතින මුළු කාලය තුළදී ම, මහජනතාව විසින් සමාලෝචනය සහ පිටපත් කිරීම සඳහා එම ප්‍රසිද්ධ ලිපිගොනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලයේ තැබිය යුතු ය.

**විමර්ශන කාර්ය පටිපාටිය**

විමර්ශනය සඳහා වූ යෝජිත සැලැස්ම.

**28.** විමර්ශනයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් 21 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිත තර්ක ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජිත කාලසීමාව, යම් විභාගයක් ඉල්ලා සිටින්නේ නම් ඒ සඳහා වූ යෝජිත දිනය, මූලික තීරණය සඳහා වූ යෝජිත දිනය හා අවසාන තීරණය සඳහා වූ යෝජිත දිනය ඇතුළු විමර්ශනය පැවැත්වීම සඳහා යෝජිත කාර්ය පටිපාටිය ඇතුළත් කරනු ලැබිය යුතු ය.

තොරතුරු එක්රැස් කිරීම.

**29.** (1) විමර්ශනයක් ආරම්භ කළ විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, දේශීය නිෂ්පාදකයන්, ආනයනකරුවන්, අපනයනකරුවන් සහ විදේශීය නිෂ්පාදකයන් ඇතුළු විමර්ශනයට අදාළ තොරතුරු සතුව ඇතැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විශ්වාස කරන යම් තැනැත්තකු වෙත, ප්‍රශ්න මාලාවක් යවනු ලැබිය යුතු ය.

(2) ප්‍රශ්න මාලාව වගඋත්තරකරු වෙත යවනු ලැබූ දින සිට හෝ එය අපනයන රටේ නියමිත තානාපති නිලධරයාට හෝ නිල නියෝජිතයාට සම්ප්‍රේෂණය කරනු ලැබූ දින සිට ආරම්භවන දින තිස් හතකට නොඅඩු කාලසීමාවක්, පිළිතුරු දීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රශ්න මාලාව යවනු ලැබූ අපනයනකරුවන්ට සහ විදේශීය නිෂ්පාදකයන්ට ලබාදිය යුතු ය. පිළිතුරු දීම සඳහා ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම සඳහා වූ යම් ඉල්ලීමක් පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා නිසි සැලකිල්ලක් දැක්විය යුතු අතර, ප්‍රමාණවත් හේතු පෙන්වා දීමක දී, විමර්ශනය අවසන් කිරීම සඳහා නියම කර ඇති කාලසීමාව සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රායෝගිකව සිදු කළ හැකි කවර හෝ අවස්ථාවක දී එම කාලය දීර්ඝ කිරීම ප්‍රදානය කළ යුතු ය.

(3) ප්‍රශ්න මාලාව සඳහා වූ යම් පිළිතුරක්, ලබා දී ඇති කාලසීමාව තුළ දී ඉදිරිපත් කරනු නොලබන විට හෝ එම පිළිතුර එවනු ලැබිය යුතු බවට ඉල්ලා සිටින ලද ආකෘතිය අනුව එය ඉදිරිපත් කරනු

නොලැබූ විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම පිළිතුර සැලකිල්ලට නොගත හැකි ය.

(4) අතිරේක ප්‍රශ්නමාලා ආකාරයෙන් හෝ පැහැදිලි කිරීම් හෝ අතිරේක තොරතුරු සඳහා වූ ලිඛිත ඉල්ලීම් වශයෙන් තවදුරටත් තොරතුරු ලබාදෙන ලෙස විමර්ශනයක් අතරතුර දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. අර්ථවත් පිළිතුරක් එවීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් කාලය සැලකිල්ලට ගනිමින් පිළිතුර ඉදිරිපත් කළ යුතු දිනය එම ඉල්ලීම්වල සඳහන් විය යුතු ය.

(5) විමර්ශනයට අදාළ වන බවට යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් සලකනු ලබන යම් තොරතුරක් එම පාර්ශ්වය විසින් සිය මෙහෙයවීමෙන් ම ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර, එසේ සලකා බැලීම අනිසි වගකීමක් නොවන්නේ නම් හෝ විමර්ශනය කලට වේලාවට පවත්වාගෙන යාමට බාධාවක් නොවන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තොරතුරු සලකා බලනු ලැබිය යුතු ය.

(6) ප්‍රපාතනය, හානි සිදුවීම සහ හේතුකාරක සබඳතාවය පිළිබඳව සිය තක්සේරුව නිර්ණය කරන ලද කාලසීමාවට අදාළ දත්ත මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පදනම් කරගත යුතු අතර, එම කාලසීමාව-

(අ) ප්‍රපාතනය සම්බන්ධයෙන් වන විට, දත්ත ලබා දී ඇති විමර්ශනයක් ආරම්භ කිරීමේ දිනයට පෙරාතුව වූ මාස හයකට නොඅඩු සහ මාස දොළහකට නොවැඩි කාලසීමාවක් සාමාන්‍යයෙන් ආවරණය විය යුතු ය; සහ

(ආ) හානි සිදු කිරීම සම්බන්ධයෙන් වන විට, සාමාන්‍යයෙන් මාස තිස් හයක කාලසීමාවක් ආවරණය විය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලාංකික කර්මාන්තය සම්බන්ධයෙන් සහ විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ස්වභාවය සම්බන්ධයෙන් ලැබී ඇති තොරතුරු සැලකිල්ලට ගෙන, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත අවස්ථාවන්හි දී, අවස්ථාවෝචිත පරිදි කෙටි හෝ දීර්ඝ කාලසීමාවක් තීරණය කරනු ලැබිය හැකි ය.

මූලික ලිඛිත තර්ක.

**30.** උනන්දුවක් දක්වනු ලබන පාර්ශ්වයන් විසින්, මූලික තීරණය සඳහා නියමිත දිනයට පෙර දින පහළොවක කාලසීමාවක් නොඉක්මවන කාලයක් තුළ දී, විමර්ශනයට අදාළ යම් කරුණක් පිළිබඳව ලිඛිත තර්ක ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

මූලික තීරණය.

**31.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එවකට ලැබී ඇති සියලු තොරතුරු පදනම් කරගෙන, විමර්ශනය ආරම්භ කිරීමෙන් පසු මාස දෙකක කාලසීමාවකට පෙර නොවන සහ මාස පහක කාලසීමාවකට පසු නොවන කාලයක් තුළ දී ඔහු විසින් ප්‍රපාතනය, හානි සිදු කිරීම සහ හේතුකාරක සබඳතාවය පිළිබඳ මූලික තීරණයක් කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මූලික තීරණය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු අතර, රහසිගත තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතාව පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින්, විසඳිය යුතු සිද්ධිමය කරුණු පිළිබඳ ප්‍රශ්න සහ නීතිය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ සහ නිගමන පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු එම ප්‍රසිද්ධ දැන්වීමේ ඇතුළත් විය යුතු අතර, එහි පහත සඳහන් කරුණු ද ඇතුළත් විය යුතු ය:–

(අ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ හඳුනාගත් අපනයනකරුවන්ගේ සහ නිෂ්පාදකයන්ගේ නම්;

(ආ) සාමූහික භාණ්ඩ විස්තරය සහ සංකේත පද්ධති වර්ගීකරණය ඇතුළුව, රේගු කාර්ය සඳහා ප්‍රමාණවත් වන පරිදි විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ විස්තරයක්,

(ඇ) සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල තීරණය කිරීමේ දී භාවිත කරන ලද ක්‍රමවේදය පිළිබඳ විස්තරයක් සහ සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල සංසන්දනය කිරීමේ දී කරන ලද වෙනස්කම් ඇතුළු ප්‍රපාතන ආන්තිකයක් තිබෙන බවට පෙනී ගොස් ඇත්නම්, එම ප්‍රපාතන ආන්තිකයේ ප්‍රමාණය සහ එසේ තීරණය කිරීම සඳහා වූ පදනම;

(ඈ) මේ පනතේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති සංසන්දනය කිරීමේ ක්‍රමය භාවිත කරනු ලැබුවහොත්, එම උපවගන්තිය මගින් නියමිත පැහැදිලි කිරීම;

(ඉ) මේ පනතේ 13 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රතිචාරවල පදනම මත යම් පුද්ගල ප්‍රපාතන ආන්තිකයක් තීරණය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, එම තීරණය සඳහා වූ පදනම;

(ඊ) සැලකිල්ලට ගනු ලැබ ඇති ප්‍රපාතන ආනයන හැර, වෙනත් සිද්ධිමය කරුණු පිළිබඳ තොරතුරු ඇතුළුව, හානිය සහ හේතුකාරක සබඳතාවය තීරණය කිරීමට හේතු වූ සිද්ධිමය කරුණු; සහ

(උ) අදාළ කරගත යුතු තාවකාලික පියවරවල ප්‍රමාණය සහ විමර්ශනය සිදුවන කාලය තුළ හානියක් සිදුවීම වැළැක්වීම සඳහා එවැනි තාවකාලික පියවර අවශ්‍ය වීමට හේතු.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ දැන්වීම ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවෙහි පුළුල් ලෙස සංසරණය වන යම් පුවත්පතක භාෂා තුනෙන්ම පළකරනු ලැබිය යුතු අතර, එම දැන්වීමේ පිටපතක් විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනය අපනයනය කරන රටට හෝ රටවලට ද, වෙනත් යම් හඳුනාගත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

මිල පොරොන්දුවක් භාරගැනීම.

**32.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) 44 වන වගන්තිය යටතේ මිල පොරොන්දුවක් භාරගෙන ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවෙහි පුළුල් ලෙස සංසරණය වන යම් පුවත්පතක භාෂා තුනෙන් ම පළ කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) 44 වන වගන්තිය යටතේ මිල පොරොන්දුවක් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ හේතු ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් අපනයනකරුට ලබා දිය යුතු ය.

(2) පොරොන්දුවක් භාරගැනීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමෙහි එම පොරොන්දුවෙහි රහස්‍ය නොවන කොටස ඇතුළත් විය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වැදගත් යයි සලකන විසඳීමට ඇති

සියලුම සිද්ධිමය කරුණු සහ නීතිමය කරුණු පිළිබඳ තීරණ සහ නිගමන පිළිබඳ ප්‍රමාණවත් කරුණු එම දැන්වීමේ සඳහන් විය යුතු ය; තවද, එම දැන්වීම එම තීරණයට යටත් වන නිෂ්පාදන අයත් රටට හෝ රටවලට ද වෙනත් යම් හඳුනාගත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 46 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් දිගටම පවත්වාගෙන යන අවස්ථාවක දී, අවසාන තීරණය සඳහා වූ යෝජිත දිනය පිළිබඳව සහ විමර්ශනය පැවැත්වීම සඳහා අනුගමනය කරනු ලබන යෝජිත කාර්ය පටිපාටියට සිදු කරනු ලබන වෙනත් යම් වෙනස් කිරීම් පිළිබඳව සඳහන් කරමින්, විමර්ශනය දිගටම පවත්වාගෙන යාම පිළිබඳ දැන්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පළකරනු ලැබිය යුතු ය. එවැනි දිගටම පවත්වාගෙන යන ලද විමර්ශනයක අවසාන තීරණය එවැනි දැන්වීමක් පළ කිරීමෙන් මාස හයක කාලසීමාවක් ඇතුළත ගනු ලැබිය යුතු ය.

තොරතුරු සත්‍යායනය කිරීම.

33. (1) 26 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති අවස්ථානුගත කරුණුවලදී හැර, විමර්ශනයක් පවත්වන අතරතුර දී, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණ පදනම් වනුයේ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින් සපයන ලද යම් තොරතුරු මත ද, එම තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් විය යුතු ය.

(2) සපයන ලද තොරතුරු සත්‍යායනය කිරීමේ හෝ වැඩිදුර විස්තර ලබා ගැනීමේ කාර්යය සඳහා, අදාළ ව්‍යාපාර ආයතනවල පූර්ව කැමැත්ත ඇතිව සහ අදාළ ප්‍රශ්නගත රටේ ආණ්ඩුවේ නියෝජිතයන් වෙත දැනුම් දීමෙන් පසුව, අවශ්‍ය අවස්ථාවන්හි දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනත් රටවල දී ද විමර්ශන සිදු කළ හැකි ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටි, (2) වන උපවගන්තිය යටතේ වෙනත් රටවල භූමි ප්‍රදේශ තුළ පවත්වනු ලබන සත්‍යායනයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ පවත්වනු ලබන යම් සත්‍යායනයක් පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළියෙළ කළ යුතු අතර, එම වාර්තාව එය අදාළ වන සමාගම වෙත ලබා දිය යුතු ය. එම වාර්තාවේ රහස්‍ය නොවන පිටපතක්, 27 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ප්‍රසිද්ධ ලිපිගොනුවෙහි ගොනුකර තැබිය යුතු ය.

(5) විමර්ශනයේ විභාග කිරීමේ යම් දිනයකට පෙර යම් සත්‍යායනයක් අවසන් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑම උත්සාහයක් ම දැරිය යුතු ය.

ලිඛිත තර්ක.

**34.** (1) (අ) විභාග කිරීමක් ඉල්ලා නොමැති විමර්ශනයක දී, අවසාන තීරණය සඳහා යෝජිත දිනයට පෙර මාස එකහමාරකට පසුව නොවන කාලසීමාවක් තුළ, විමර්ශනයට අදාළ වන බවට යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් සලකනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන්, එම පාර්ශ්වය විසින් ලිඛිත තර්ක ඉදිරිපත් කරනු ලැබිය හැකි ය;

(ආ) විභාගයක් පවත්වනු ලබන විමර්ශනයක දී, එම විමර්ශනයට අදාළ බවට යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් සලකනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන්, එම පාර්ශ්වය විසින් විභාගය සඳහා නියම කර ඇති දිනයට පෙර දින දහයකට පසුව නොවන කාලයක් ඇතුළත ලිඛිතව කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) විභාගයෙන් පසුව, එම විභාගයට සහභාගි වූ උනන්දුවක් දක්වන පාර්ශ්ව විසින් එම විභාගයේ දී ඉදිරිපත් කරන ලද තර්කවලට සහ තොරතුරුවලට ප්‍රතිචාර වශයෙන්, දින දහයක කාලසීමාවක් ඇතුළත තවදුරටත් වූ ලිඛිත කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

විභාග කිරීම.

**35.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මූලික තීරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු එක් මාසයක කාලසීමාවක් ඉක්මවීමට පෙරාතුව, උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන් විසින් තොරතුරු සහ තර්ක ඉදිරිපත් කරනු ලැබිය හැකි විභාගයක් සඳහා, අවසාන තීරණය සඳහා යෝජිත දිනයට පෙර සති තුනක කාලසීමාවක් නොඉක්මවන්නා වූත්, එක් මාසයක කාලසීමාවකට නොවැඩි වූත් දිනයක් නියම කරනු ලැබිය යුතු ය.

(2) විභාගයකට පෙනී සිටිය යුතු බවට උනන්දුවක් දක්වන කිසිම පාර්ශ්වයක් වෙත කිසිම බැඳීමක් නොතිබිය යුතු අතර, එසේ පැමිණීමට අපොහොසත්වීම නිසා එම පාර්ශ්වයේ කාරණයට අහිතකර බලපෑමක් සිදු නොවිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා

විසින් විභාග කිරීම්, හැකිතාක්දුරට උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වකරුවන්ගේ පහසුව සැලකිල්ලට ගනිමින් සංවිධානය කරනු ලැබිය යුතු ය.

(3) විභාගයේ දී පෙනී සිටීමට අදහස් කරනු ලබන උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින්, විභාග දිනයට දින හතකට නොඅඩු කාලයකට පෙර විභාගයට පෙනී සිටින නියෝජිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(4) විභාග කිරීම්වල දී අධ්‍යක්ෂ ජනරාල්වරයා මුලසුන දැරිය යුතු අතර, රහස්‍යභාවය සුරකින බවට ඔහු සහතික විය යුතු ය. එමෙන්ම සහභාගි වන සියලුම පාර්ශ්වයන්ට ඔවුන්ගේ මතයන් ඉදිරිපත් කිරීමේ ප්‍රමාණවත් අවස්ථාවක් ලැබෙන බව සහතික වන ආකාරයට විභාගය සංවිධානය කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාගය පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු අතර, යම් රහස්‍ය තොරතුරු හැර, එම විභාගය පිළිබඳ වාර්තාව ප්‍රසිද්ධ ලිපිගොනුවෙහි ගොනුකර තබනු ලැබිය යුතු ය.

**කර්මාන්තවල භාවිත කරන්නන් සහ පාරිභෝගික සංවිධානවල නියෝජිතයන්ගේ දායකවීම.**

**36.** (1) පියවර පැනවීමේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික අභිවෘද්ධිය ඇතුළු විමර්ශනයට අදාළ කරුණු සම්බන්ධයෙන් තොරතුරු සැපයීම සහ ලිඛිත තර්ක ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි සිටින විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය, නිෂ්පාදන කර්මාන්තවල භාවිත කරන්නන් සඳහා සහ පාරිභෝගික සංවිධානවල නියෝජිතයන් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවස්ථා ලබා දිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වූ සියලු තොරතුරු ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, විමර්ශනයක් අතරතුර දී පවත්වනු ලබන යම් විභාගයක දී වාචික නියෝජන ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය, කර්මාන්තවල භාවිත කරන්නන්ට සහ පාරිභෝගික සංවිධානවල නියෝජිතයන්ට ඉඩ දිය යුතු ය.

**අත්‍යවශ්‍ය කරුණු.**

**37.** (1) අවසාන තීරණය සඳහා වූ යෝජිත දිනයට අවම වශයෙන් සති තුනක කාලසීමාවකට පෙර, 25 වන වගන්තිය යටතේ වන රහස්‍යභාවය පිළිබඳ නියමයන්ට යටත්ව, ස්ථිර පියවර අදාළ කර ගත යුතු ද යන්න තීරණය කිරීම සඳහා පදනම සකස් විය යුතු වූ,

සැලකිල්ලට භාජන වී ඇති අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන් වෙත ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් දැනුම් දිය යුතු ය.

(2) උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔවුන් වෙත හෙළිකරන ලද තොරතුරු පිළිබඳව යම් මත ප්‍රකාශ කිරීමක් ඇත්නම්, එම මත ප්‍රකාශ කිරීම එසේ හෙළිකිරීමෙන් පසු එක් සතියක කාලසීමාවක් ඇතුළත හෝ විශේෂ අවස්ථානුගත කරුණුවල දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි දීර්ඝ කරන ලද කාලසීමාවක් ඇතුළත දී, ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

අවසාන තීරණය.

38. (1) මූලික තීරණයේ දින සිට සාමාන්‍යයෙන් මාස හයක කාලසීමාවක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ප්‍රපාතනය, හානිය හා හේතුකාරක සබඳතාවය පිළිබඳ සිය අවසාන තීරණය ගත යුතු අතර, 25 වන වගන්තිය යටතේ රහස්‍යභාවය පිළිබඳ නියමයන්ට යටත්ව, උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත හෙළි කරනු ලැබුවා වූ ද, විමර්ශනය අතරතුර දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා ගන්නා වූ ද සියලු තොරතුරු මත, එකී අවසාන තීරණය පදනම් විය යුතු ය.

(2) ප්‍රපාතනය සිදු වී ඇති බවටත්, එම ප්‍රපාතනයේ ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුවන බවටත් අවසාන තීරණයෙන් හෙළි වී ඇති අවස්ථාවක සහ වෙනත් කරුණු අතර -

(අ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනය සඳහා වූ දේශීය තරගය පිළිබඳ තත්ත්වය; සහ

(ආ) අදාළ අවස්ථාවන් හි දී කර්මාන්ත සඳහා භාවිත කරන්නන්ගේ අවශ්‍යතාවය සහ අවසාන පාරිභෝගිකයන්ගේ යහපත,

යන කරුණු සැලකිල්ලට ගෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික යහපත උදෙසා ප්‍රපාතන විරෝධී බදු පැනවීම අවශ්‍ය වන අවස්ථාවක, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් පැනවීම සඳහා වූ යෝජනාවක් අන්තර් අමාත්‍යාංශ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් පැනවීමේ උචිතභාවය පිළිබඳ ව සලකා බැලීම අන්තර් අමාත්‍යාංශ කමිටුවේ කාර්යයක් වන අතර, එම කමිටුව විසින් එම යෝජනාව තමන් වෙත ලැබී වැඩ කරන දින දහයක කාලසීමාවක් ඇතුළත අමාත්‍යවරයා හරහා මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ කර්මාන්තයට සිදුවන හානිය ඉවත් කිරීම සඳහා සම්පූර්ණ ප්‍රපාතන ආන්තිකයට වඩා අඩු බද්දක් පැනවීම ප්‍රමාණවත් ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කර බැලිය යුතු ය. හානිය ඉවත් කිරීම සඳහා එවැනි අඩු බද්දක් පැනවීම ප්‍රමාණවත් බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, පනවනු ලබන අවසාන ප්‍රපාතන විරෝධී බදු ප්‍රමාණය එම අඩු බද්දට වඩා වැඩි නොවිය යුතු ය.

(5) ප්‍රපාතනය පිළිබඳ කිසිදු සාක්ෂියක් නොමැති බවත්, එම නිසා ශ්‍රී ලංකාවේ කර්මාන්තවලට කිසිදු හානියක් සිදු නොවන බව හෝ ප්‍රපාතනය පිළිබඳව සාක්ෂි ඇතත් ශ්‍රී ලංකාවේ කර්මාන්තවලට හානියක් සිදුවීම පිළිබඳව සාක්ෂි නොමැති බව හෝ ප්‍රපාතන විරෝධී බදු පැනවීම ශ්‍රී ලංකාවේ ආර්ථික අභිවෘද්ධියට අනුව අවශ්‍ය නොවන බව අවසාන තීරණය වන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වහාම විමර්ශනය අවසාන කරනු ලැබිය යුතු ය.

බදු පැනවීම සහ මහජනතාව වෙත දැනුම්දීම.

**39.** (1) ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් පැනවිය යුතු බවට අන්තර් අමාත්‍යාංශ කමිටුව විසින් නිර්දේශ කරන අවස්ථාවක, අන්තර් අමාත්‍යාංශ කමිටුවේ නිර්දේශ තමන් වෙත ලැබී වැඩ කරන දින දාහතරක් ඇතුළත, ශ්‍රී ලංකාවේ ආර්ථික අභිවෘද්ධිය සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් පැනවිය යුතු ද නැද්ද යන්න සහ පැනවිය යුතු බද්දක් ඇත්නම් එහි ප්‍රමාණය ද තීරණය කරනු ලැබිය යුතු ය; තව ද පනවනු ලබන බද්ද, පවතින බවට සොයාගන්නා ලද ප්‍රපාතන ආන්තිකයට වඩා වැඩි නොවිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) අවසාන තීරණය (අස්ථාර්ථ ද නැතහොත් නිෂේධනීය ද යන්න); සහ

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන යම් බද්දක් ඇත්නම්, එම බදු ප්‍රමාණය,

පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම දැන්වීම ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස සංසරණය වන පුවත්පතක ද භාෂා තුනෙන් ම පළ කරනු ලැබිය යුතු ය.

(3) (අ) රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම සඳහා ඇති නියමය යථාපරිදි සැලකිල්ලට ගනිමින්, නීතිය පිළිබඳ කරුණු සහ සිද්ධිමය කරුණු පිළිබඳ සියලු අදාළ තොරතුරු සහ අවසාන තීරණයට බලපෑ හේතු ද ඇතුළුව අවසාන තීරණය; සහ

(ආ) මේ වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් තොරතුරු,

අන්තර්ගත වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සකස් කළ යුතු අතර, එම වාර්තාව පරීක්ෂා කිරීම සඳහා මහජනතාව වෙත ලබා දිය යුතු ය; තවද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ගාස්තුවක් ගෙවීමෙන් එම වාර්තාවේ පිටපත් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) වාර්තාවේ ඇතුළත් කළ යුතු බවට (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියම කර ඇති තොරතුරු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ හඳුනාගත් අපනයනකරුවන්ගේ සහ නිෂ්පාදකයන්ගේ නම්;

(ආ) සාමූහික භාණ්ඩ විස්තර සහ සංකේත පද්ධති වර්ගීකරණය ඇතුළු රේගු කාර්ය සඳහා ප්‍රමාණවත් වන විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ විස්තරයක්;

(ඇ) සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල තීරණ කිරීමේ දී භාවිත කරන ලද ක්‍රමවේදය පිළිබඳ විස්තරයක් සහ සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල සංසන්දනය කිරීමේ දී කරන ලද වෙනස්කම් ඇතුළු, ප්‍රපාතන ආන්තිකයක් තිබෙන බවට පෙනී ගොස් ඇත්නම්, එම ප්‍රපාතන ආන්තිකයේ ප්‍රමාණය සහ එසේ තීරණය කිරීම සඳහා වූ පදනම;

(ඇ) මේ පනතේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති සංසන්දනය කිරීමේ ක්‍රමය භාවිත කරනු ලැබුවහොත් එම උපවගන්තිය මගින් කළ යුතු යැයි නියමිත පැහැදිලි කිරීම;

(ඉ) මේ පනතේ 13 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ස්වේච්ඡාවෙන් කරන ලද ප්‍රතිචාරවල පදනම මත යම් පුද්ගල ප්‍රපාතන ආන්තිකයක් තීරණය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් එම තීරණය සඳහා පදනම;

(ඊ) සැලකිල්ලට ගනු ලැබ ඇති ප්‍රපාතන ආනයන හැර වෙනත් සිද්ධිමය කරුණු පිළිබඳ තොරතුරු ඇතුළුව, හානිය සහ හේතුකාරක සබඳතාවය තීරණය කිරීමට හේතු වූ සිද්ධිමය කරුණු;

(උ) අපනයනකරුවන් සහ ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අදාළ තර්ක හෝ හිමිකම් පෑම් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට තුඩුදුන් හේතු;

(ඌ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් යම් ප්‍රපාතන විරෝධී බද්දක් පනවනු ලැබ ඇත්නම්, එම බද්දේ ප්‍රමාණය; සහ

(එ) අවසාන ප්‍රපාතන විරෝධී බදු අයකර ගැනීමට ඇත්තේ තාවකාලික පියවර අදාළ කරගනු ලැබූ ආනයන සම්බන්ධයෙන් නම්, එසේ තීරණය කිරීම සඳහා වූ හේතු.

(5) (3) වන උපවගන්තිය යටතේ වාර්තාව මහජනයා විසින් පරීක්ෂා කිරීම සඳහා ඉඩ ලබා දී දින හතක කාලසීමාවක් ඇතුළත, එම වාර්තාවේ දක්නට ලැබෙන යම් ලිවීමේ දෝෂ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දෙන අවස්ථාවක, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, එම දෝෂ නිවැරදි කරනු ලැබිය හැකි ය.

(6) (2) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමේ පිටපතක් සහ (3) වන උපවගන්තිය යටතේ සකස් කරන ලද වාර්තාවේ පිටපතක් අවසාන තීරණය සඳහා භාජන වූ නිෂ්පාදනය කළ රටට හෝ රටවලට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු

ලැබිය හැකි උනන්දුවක් දක්වන වෙනත් යම් පාර්ශ්වයක් වෙත යවනු ලැබිය යුතු ය.

**හෙළිකිරීම.**

**40.** මේ පනතේ 39 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් පළ කිරීමෙන් පසු දින පහළොවක කාලසීමාවක් ඇතුළත කරන ලද ඉල්ලීමක් මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් වෙනුවෙන් අවසන් වශයෙන් අදාළ කරගනු ලැබූ ප්‍රපාතනය ගණන් බැලීමේ ක්‍රමවේදය පැහැදිලි කිරීම සඳහා රැස්වීමක් පවත්වන ලෙස ඉල්ලා සිටින අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් සමග, වෙන් වෙන් වශයෙන් හෙළිකිරීමේ රැස්වීම් පැවැත්විය යුතු ය.

## තාවකාලික පියවර

**තාවකාලික පියවර පැනවීම.**

**41.** (1) ප්‍රපාතනය, හානිය සහ ප්‍රපාතනය සහ හානිය අතර හේතුකාරක සබඳතාවයක් පැවතීම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අස්ත්‍යාර්ථ මූලික තීරණයක් සිදුකරනු ලැබ, විමර්ශනය අතරතුර දී හානිය තවදුරටත් සිදුවීම වැළැක්වීම සඳහා තාවකාලික පියවර අවශ්‍ය බවට මතයක් දරන අවස්ථාවක, ඔහු විසින් සිය මතය අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එම මතය මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) තාවකාලික පියවර ගතයුතු ද නැද්ද යන්න සහ තාවකාලික බදු පැනවිය යුතු නම් එම බද්දේ ප්‍රමාණය පිළිබඳව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා තීරණය කළ යුතු අතර, එසේ පනවන ලද බද්ද පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස සංසරණය වන පුවත්පතක භාෂා තුනෙන්ම පළ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) ප්‍රපාතනය පිළිබඳ නිෂේධනීය මූලික තීරණයක් මගින් විමර්ශනය ස්වයංක්‍රීයව අවසන් නොවන නමුත්, එවැනි අවස්ථාවක දී කිසිදු තාවකාලික පියවරක් පනවනු නොලැබිය යුතු ය.

**පැනවිය යුතු තාවකාලික බදු ප්‍රමාණය.**

**42.** 41 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන තාවකාලික බද්ද, 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පළ කරනු ලැබූ මූලික තීරණය පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමෙහි සඳහන් කර ඇති

ඇස්තමේන්තුගත කළ ප්‍රපාතන ආන්තිකයට වඩා වැඩි නොවිය යුතු ය.

තාවකාලික පියවර අදාළ කර ගැනීමේ කාලසීමාව.

**43.** (1) විමර්ශනය ආරම්භ කිරීමේ දින සිට මාස දෙකකට නොඅඩු කාලයක් ගතවන තුරු තාවකාලික පියවර නොපැනවිය යුතු අතර, සාමාන්‍යයෙන් මාස හයකට නොවැඩි කාලයක් සඳහා ඒවා අදාළ විය යුතු ය.

(2) අදාළ කර්මාන්තයේ සැලකිය යුතු ප්‍රතිශතයක් නියෝජනය කරන අපනයනකරුවන් විසින් තත් කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තියේ සඳහන් තාවකාලික පියවර අදාළ කර ගැනීමේ කාලසීමාව, මාස නවයක් නොඉක්මවන කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) 41 වන වගන්තිය යටතේ පනවනු ලබන තාවකාලික පියවර අදාළ කර ගැනීමේ දී, මේ පනතේ 48 වන සහ 49 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අනුගමනය කළ යුතු ය.

## මිල පොරොන්දුවීම

මිල පොරොන්දුවලට අදාළ පොරොන්දු.

**44.** (1) මිල ප්‍රතිශෝධනය කිරීමට හෝ ප්‍රශ්නයට තුඩු දී ඇති ප්‍රදේශවලට ප්‍රපාතන මිල මත අපනයනය කිරීම් නැවැත්වීමට යම් අපනයනකරුවකුගෙන් සෑහීමට පත් විය හැකි ස්වේච්ඡා පොරොන්දු ලැබීම මත සහ ප්‍රපාතනයෙන් සිදුවන අහිතකර බලපෑම ඉවත් කරනු ලැබ ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වීම මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තාවකාලික පියවර ගැනීමකින් තොරව හෝ ප්‍රපාතන විරෝධී බදු පැනවීමකින් තොරව, විමර්ශනයක් අත්හිටවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද පොරොන්දුවක ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලබන මිල ඉහළ දැමීම, ප්‍රපාතන ආන්තිකය ඉවත් කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු අතර, ශ්‍රී ලාංකීය කර්මාන්තයට සිදුවන හානිය ඉවත් කිරීම සඳහා අඩු මිල ඉහළ දැමීමක් ප්‍රමාණවත් බව ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, පනවනු ලබන මිල ඉහළ දැමීම, ප්‍රපාතන ආන්තිකයට වඩා අඩු විය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා වූ මිල පොරොන්දුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යෝජනා කරනු ලැබිය හැකි නමුත්, එවැනි පොරොන්දුවකට ඇතුළත් වන ලෙස කිසිම අපනයනකරුවකුට බලපෑම් නොකළ යුතු ය.

(4) අපනයනකරුවන් විසින් යම් මිල පොරොන්දු අර්පණය නොකිරීම හෝ එසේ කරන ලෙසට කරන ආරාධනයක් පිළිනොගැනීම මගින් කිසිදු ආකාරයකින් මෙම කාරණය සලකා බැලීම කෙරෙහි අහිතකර ලෙස බලපෑමක් සිදු නොවිය යුතු නමුත්, ප්‍රපාතනය කරනු ලබන ආනයන දිගටම ආනයනය කරනු ලැබුවහොත්, හානිය පිළිබඳ තර්ජනයක් බොහෝ දුරට ඇතිවීමට ඉඩ ඇති බවට තීරණය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාහට නිදහස ඇත්තේ ය.

(5) විශේෂ අවස්ථානුගත කරුණුවල දී හැර, අවසාන තීරණය සඳහා යෝජිත දිනයට පෙර මාස දෙකකට නොඅඩු යම් කාලයක් තුළ අපනයනකරුවකු විසින් (1) වන උපවගන්තිය යටතේ මිල පොරොන්දුවක් අර්පණය කළ හැකි ය.

**මිල පොරොන්දුවක් භාරගැනීම සඳහා වූ කොන්දේසි.**

**45.** (1) ප්‍රපාතනය, හානිය සහ හේතුකාරක සබඳතාවය පිළිබඳ මූලික අස්ත්‍යාර්ථ තීරණයක් කරන තුරු, අපනයනකරුවන්ගෙන් මිල පොරොන්දුවක් සඳහා යෝජනා කිරීමක් නැතහොත් එවැනි මිල පොරොන්දුවක් භාරගැනීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා අපේක්ෂා නොකළ යුතු ය.

(2) නියම අපනයනකරුවන් ප්‍රමාණය හෝ අපනයනකරුවන් විය හැකි ප්‍රමාණය විශාල වැඩි නම් හෝ සාමාන්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ වූ හේතු ඇතුළුව වෙනත් යම් හේතු නිසා අර්පණය කරන ලද මිල පොරොන්දු භාරගැනීම ප්‍රායෝගික නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකනු ලබන්නේ නම්, අර්පණය කරන මිල පොරොන්දු ඔහු විසින් භාරගනු නොලැබිය හැකි ය.

(3) යම් පොරොන්දුවක් භාර නොගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, පොරොන්දුවක් භාර ගැනීම උචිත නොවන ලෙස සැලකීමට හේතු ඔහු විසින් අපනයනකරු වෙත ලබා දී, ඒ පිළිබඳ ලිඛිත අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් එම අපනයනකරුට ලබා දිය යුතු ය.

(4) මිල පොරොන්දුවක් පිළිගෙන ඇත්තේ යම් අපනයනකරුවකුගෙන් ද, එම පොරොන්දුව ඉටු කිරීමට අදාළ තොරතුරු කලින් කල ඉදිරිපත් කරන ලෙස ද, එසේ ඉදිරිපත් කරන තොරතුරු සත්‍යායනය කිරීමට ඉඩ දෙන ලෙසද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අපනයනකරුට නියම කරනු ලැබිය හැකි ය. එම දත්ත සන්නිවේදනය කිරීම රහස්‍යභාවයට අදාළ වගන්තියේ විධිවිධානවලට යටත්ව සිදුවිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා ඇති තොරතුරු සැපයීමට අපොහොසත්වීම මිල පොරොන්දුව උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය හැකි ය.

(5) අර්පණය කරන ලද මිල පොරොන්දු නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ නියම කරනු ලැබිය හැකි ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමෙන් බලාත්මක කරනු ලැබිය යුතු ය.

විමර්ශනය අවසන් කිරීම.

**46.** (1) මිල පොරොන්දු එකක් හෝ වැඩි ප්‍රමාණයක් පිළිගැනීම නොතකා, ප්‍රපාතනය සහ හානිය පිළිබඳ විමර්ශනයක් අවසන් කළ යුතු බවට අපනයනකරුවකු අදහස් කරන අවස්ථාවක හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම විමර්ශනය අවසන් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් අවසන් කරනු ලබන විට සහ-

(අ) ප්‍රපාතනය හෝ හානිය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිෂේධනීය තීරණයක් ගනු ලැබූ විට, එම තීරණය ගනු ලැබුවේ ප්‍රධාන වශයෙන් එවැනි පොරොන්දුවක් තිබීම නිසා වන අවස්ථාවක දී හැර එම මිල පොරොන්දුව ස්වයංක්‍රීයව අවසන් විය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන සාධාරණ කාලයක් සඳහා එම පොරොන්දුව පවත්වාගෙන යා යුතු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය;

(ආ) ප්‍රපාතනය හෝ හානිය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අස්ත්‍යාර්ථ තීරණයක් ගනු ලැබූ විට, එම තීරණයට අවශ්‍ය තාක් දුරට පොරොන්දුව වෙනස්කිරීම් සහිතව පවත්වාගෙන යා යුතු ය.

පොරොන්දු කඩකිරීම.

**47.** 44 වන වගන්තිය යටතේ දෙන ලද පොරොන්දුවක් කඩ කරනු ලැබූ අවස්ථාවක දී, මේ පනතේ විධිවිධානවලට අනුකූලව,

ලැබී ඇති හොඳම තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් තාවකාලික පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවලදී එම තාවකාලික පියවර අදාළ කර ගැනීමට මාස තුනක කාලසීමාවක් නොවැඩි කාලයකට පෙර, පරිභෝජනය සඳහා ආනයනය කරන ලද භාණ්ඩ මත මේ පනතට අනුකූලව ස්ථිර බදු අයකරගනු ලැබිය හැකි ය. එහෙත් පොරොන්දුව කඩ කිරීමට පෙර ඇතුළත් වූ ආනයන සම්බන්ධයෙන්, එම තක්සේරුව අදාළ නොවිය යුතු ය.

### ප්‍රපාතන විරෝධී බදු පැනවීම සහ එකතු කිරීම

ප්‍රපාතන විරෝධී බදු පැනවීම සහ එකතු කිරීම.

48. (1) ප්‍රපාතන විරෝධී බදු *අඩ් වැලෝරම්* හෝ නිශ්චිත බදුවල ස්වරූපය ගත යුතු අතර, අදාළ ආනයනය කරන ලද භාණ්ඩ මත පනවනු ලබන වෙනත් ආනයන බදුවලට අමතරව එම ප්‍රපාතන විරෝධී බදු පනවනු ලැබිය යුතු ය.

(2) ප්‍රපාතන විරෝධී බදු රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කර ගනු ලැබිය යුතු අතර, බදු අයකර ගැනීමට අදාළව රේගු ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම බදු එකතු කර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (4) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති අවස්ථානුගත කරුණුවල දී හැර, අදාළ ප්‍රපාතන ආනයනවල හඳුනාගත් එක් එක් අපනයනකරු හෝ නිෂ්පාදකයා සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පුද්ගල ප්‍රපාතන විරෝධී බද්දක් නියම කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 13 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කිරීම සීමා කරනු ලැබූ අවස්ථාවක, පරීක්ෂණයට ඇතුළත් කර නොමැති අපනයනකරුවන්ගෙන් හෝ නිෂ්පාදකයන්ගෙන් ලැබෙන ආනයනවලට අදාළ කරගනු ලබන ප්‍රපාතන විරෝධී බද්දක්, තෝරාගත් අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් සම්බන්ධයෙන් සකස් කරන ලද ගණනය කරනු ලැබූ ප්‍රපාතන ආන්තිකයේ සාමාන්‍යයට වඩා වැඩි නොවිය යුතු ය:

එසේ වුවද මේ උපවගන්තියේ කාර්යය සඳහා, යම් ශුන්‍ය හෝ සුළු ප්‍රමාණයක ආන්තික සහ 26 වන වගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණු යටතේ සකස් කළ ආන්තික පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා සැලකිල්ලට නොගත යුතු ය.

(5) මේ පනතේ 13 වන වගන්තියයේ (4)වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර, විමර්ශනය අතරතුර දී අවශ්‍ය තොරතුරු සපයා ඇති වූ ද, පරීක්ෂණයට ඇතුළත් කර නොමැති වූ ද අපනයනකරුවන්ගෙන් හෝ නිෂ්පාදකයන්ගෙන් ලැබෙන ආනයන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙන් වශයෙන් වූ බදු අදාළ කර ගත යුතු ය.

(6) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින්, අවසාන තීරණය ගනු ලැබූ අවස්ථාවේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා දැන නොසිටි අපනයනකරුවන්ගේ සහ ආනයනකරුවන්ගේ ආනයන සඳහා ප්‍රපාතන විරෝධී බදු අනුප්‍රමාණ අදාළ කරගනු ලැබිය හැකි ය. එම ප්‍රපාතන විරෝධී බදු අනුප්‍රමාණ, මේ පනතේ 26 වන වගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණු යටතේ සකස් කරන ලද ආන්තික හැර, විමර්ශනය අතරතුර දී පරීක්ෂා කරන ලද අපනයනකරුවන් සහ නිෂ්පාදනයක් සඳහා සකස් කරන ලද පුද්ගල ප්‍රපාතන ආන්තිකවල ගණනය කරන ලද සාමාන්‍ය නොඉක්මවිය යුතු ය.

*ප්‍රපාතන ආන්තිකය ඉක්මවා ගෙවන ලද බදු ආපසු ගෙවීම.*

**49.** (1) බදු ගෙවනු ලැබූවේ යම් ප්‍රපාතන ආන්තිකයක් පදනම් කරගෙනද, එම ප්‍රපාතන ආන්තිකය ඉවත් කරනු ලැබ ඇති බවට හෝ තත්කාලයේ බලපවත්නා බදුවල මට්ටමට වඩා පහත් මට්ටමකට අඩුකරනු ලැබ ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කර ගන්නා ලද බදු ආනයනකරුවකු වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(2) යම් මාස හයක කාලසීමාවක් අවසන්වී මාස දෙකක කාලසීමාවක් ගතවීමට පෙර, එම මාස හය ඇතුළත එකතු කර ගන්නා ලද ප්‍රපාතන විරෝධී බදු ආපසු ලබාගැනීම සඳහා ආනයනකරුවකු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය. එම කාලසීමාව සඳහා ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටින ප්‍රපාතන විරෝධී බදු ප්‍රමාණය පිළිබඳ තොරතුරු සහ එම මුදල ගණනය කිරීමට සහ ගෙවීමට අදාළ සියලුම රේගු ලියකියවිලි, එම ඉල්ලුම් පත්‍රයෙහි අන්තර්ගත විය යුතු ය. බද්ද අදාළ වන අපනයනකරු හෝ නිෂ්පාදකයා සඳහා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වටිනාකම සහ අපනයන මිල පිළිබඳ සාක්ෂි ද එහි ඇතුළත් විය යුතු ය.

(3) ආනයනකරු, නිෂ්පාදකයා හෝ අපනයනකරු සමග සම්බන්ධතාවක් නොමැති අවස්ථාවක දී සහ (2) වන උපවගන්තියේ සඳහන් තොරතුරු වහාම ලබාගත නොහැකි අවස්ථාවක දී හෝ නිෂ්පාදකයා හෝ අපනයනකරු එම තොරතුරු ආනයනකරුට

මුදාහැරීමට අකමැති අවස්ථාවක දී, ප්‍රපාතන ආන්තිකය අඩු කරනු ලැබී ඇති බවට හෝ ඉවත් කරනු ලැබ ඇති බවට නිෂ්පාදකයාගෙන් හෝ අපනයනකරුගෙන් ලබා ගත් ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රයට ඇතුළත් විය යුතු අතර, අදාළ තහවුරු කිරීමේ සාක්ෂි අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෘජුවම ඉදිරිපත් කළ යුතු ය. එම සාක්ෂි සාධාරණ කාල සීමාවක් තුළ අපනයනකරුගෙන් හෝ නිෂ්පාදකයාගෙන් නොලැබෙන අවස්ථාවක දී, ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(4) බදු ආපසු ගෙවීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් විභාග කිරීමේ දී, විමර්ශනයක් පැවැත්වීමට අදාළ මේ පනතේ විධිවිධාන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය තීරණය සඳහා අදාළ කරගත යුතු ය. විශේෂයෙන්, අපනයන මිලක් නොමැතිවීම හේතුවෙන් ආනයන නිෂ්පාදන ස්වාධීන මිලදී ගන්නෙකුට ප්‍රථමයෙන් ප්‍රතිවිකුණුම් කරනු ලබන මිල මත අපනයන මිල සංකෝචනය වීමේ දී ආපසු ගෙවීම් කළ යුතු ද සහ කවර ප්‍රමාණයකට කළ යුතු ද යන්න තීරණය කරනු ලබන විටෙක හෝ 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාර අපනයන මිල අවිශ්වාස කටයුතු බව පෙනී යන විටෙක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාමාන්‍ය වටිනාකමෙහි ඇති යම් වෙනසක් පිළිබඳව , ආනයනය කිරීම සහ ප්‍රතිවිකිණුම අතරතුර දී උපචිත වූ පිරිවැයෙහි  යම් වෙනස්වීමක් පිළිබඳව සහ ප්‍රතිවිකුණුම් මිලෙහි යථා පරිදි නිරූපනය වූ ප්‍රතිවිකුණුම් මිලෙහි සිදු වී ඇති චලනයක් පිළිබඳව ද සැලකිල්ලට ගත යුතු අතර, ඉහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි සපයනු ලැබූ විට ගෙවන ලද ප්‍රපාතන විරෝධී බදු ප්‍රමාණය සඳහා කිසිදු අඩුකිරීමක් නොමැතිව, අපනයන මිල ගණනය කරනු ලැබිය යුතු ය.

(5) බදු ආපසු ගෙවීම සඳහා වූ ඉල්ලීමට අදාළ තීරණය සඳහා වූ හේතු සම්බන්ධයෙන් වූ විස්තරාත්මක කරුණු පැහැදිලි කිරීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලීම ඉදිරිපත් කළ ආනයනකරු වෙත ලබාදිය යුතු ය.

(6) බදු ආපසු ගෙවීම සාමාන්‍යයෙන් ආපසු ගෙවීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දින සිට මාස දොළහක කාලයක් සහ කිසිසේත් මාස දහඅටක් නොඉක්මවන කාලයක් ඇතුළත දී සිදු කළ  යුතු ය. අනුමත කරන ලද ආපසු ගෙවීමක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එසේ ආපසු ගෙවීම් ප්‍රදානය තීරණය කළ දින සිට මාස තුනක කාලයක් ඇතුළත දී සිදු කළ යුතු ය.

ප්‍රශ්නයට තුඩු දී ඇති බදු අදාළ කර ගැනීමේ තීරණය අධිකරණමය සමාලෝචන නඩු කටයුත්තකට යටත්ව ඇති අවස්ථාවක දී, මේ උපවගන්තියේ සඳහන් කර ඇති කාලසීමාවන් පිළිපැදීමට නොහැකි විය හැකි ය.

(7) මේ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, විෂය කරුණ අධිකරණමය සමාලෝචනයකට භාජන වී තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන්, මේ වගන්තියේ සඳහන් කාලසීමාවන් අනුගමනය කිරීමට නොහැකි වන අවස්ථාවක දී, එසේ එම කාලසීමාවන් තදින්ම අනුගමනය කරනු නොලැබිය හැකි ය.

අත්හිටුවීම.

**50.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා සහ අන්තර් අමාත්‍ය කමිටුවේ නිර්දේශය මත මේ පනත යටතේ පනවා ඇති තාවකාලික පියවර අදාළ කර ගැනීම හෝ ප්‍රපාතන විරෝධී බදු අයකර ගැනීම, යම් නිශ්චිත කාලයක් සඳහා අත්හිටවනු ලැබිය හැකි ය.

(2) තාවකාලික පියවරක් හෝ ප්‍රපාතන විරෝධී බදු අදාළ කර ගැනීම අත්හිටුවීමේ තීරණය, ජාතික ආර්ථික අභිවෘද්ධිය සලකා බලමින් -

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වෙළෙඳපළ තත්ත්වයන් ඇතුළු කරුණු පිළිබඳ පරීක්ෂණයකින් පසු; සහ

(ආ) ශ්‍රී ලාංකීය කර්මාන්තයට ස්වකීය මත පළ කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු,

ගනු ලැබිය යුතු ය.

## ඉකුත් කාලයට බලපෑම

ඉකුත් කාලයට බලපෑමේ ප්‍රතිපත්තිය.

**51.** මේ පනතේ 47 වන, 52 වන සහ 53 වන වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර, මේ පනතේ ඉහතින් ම වූ විධිවිධාන

යටතේ පවත්වන ලද විමර්ශනයක දී අස්ථ්‍යාර්ථක, මූලික හෝ අවසාන තීරණයක් ප්‍රකාශයට පත් කිරීමේ දින හෝ එදිනට පසුව, නැතහොත් මේ පනතේ 57 සිට 59 දක්වා වූ වගන්ති යටතේ පවත්වන ලද සමාලෝචනයක දිනයේ දී හෝ ඉන් පසුව පරිභෝජනය සඳහා ශ්‍රී ලංකාවට ගෙන එන ලද නිෂ්පාදනවලට පමණක් තාවකාලික පියවර සහ ප්‍රපාතන විරෝධී බදු අදාළ විය යුතු ය.

ඇතැම් අවස්ථානුගත කරුණුවල දී ස්ථිර බදු ඉකුත් කාලයට බලපාන පරිදි අදාළ කර ගැනීම.

**52.** ප්‍රශ්නයට තුඩු දී ඇති ප්‍රපාතන නිෂ්පාදන සම්බන්ධයෙන්-

(අ) හානියක් සිදු කළ ප්‍රපාතන ඉතිහාසයක් ඇති බවට හෝ අපනයනකරු විසින් ප්‍රපාතනය සිදුකරන බව සහ එසේ ප්‍රපාතනය මගින් හානියක් සිදුවන බව ආනයනකරු දැනසිටි බව හෝ දැන සිටිය යුතුව තිබුණ බවට; සහ

(ආ) අදාළ ආනයනකරුවන්ට මත ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ලබා දී ඇත්නම් හැර ප්‍රපාතනය කරන ලද ආනයන එසේ ප්‍රපාතනය කරන ලද කාලය සහ ආනයන ප්‍රමාණය සහ (ආනයනය කරන ලද නිෂ්පාදනවල බඩු ලැයිස්තු සීඝ්‍රයෙන් ගොඩ ගැසීම) වැනි වෙනත් අවස්ථානුගත කරුණු ආශ්‍රයෙන්, ඉතා සුළු කාලයක් ඇතුළත යම් නිෂ්පාදනයක ආනයන විශාල වශයෙන් ප්‍රපාතනය කිරීම මගින් හානියක් සිදු වී ඇති බවටත්, එමගින් අදාළ කරගත යුතු ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දේ ප්‍රතිකර්මීය බලපෑම කෙරෙහි දැඩි ලෙස හානියක් සිදුවිය හැකි බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, තාවකාලික පියවර අදාළ කරගැනීමේ දිනයට මාස තුනක කාලසීමාවකට නොවැඩි කාලයක් ඇතුළත, පරිභෝජනය සඳහා ගෙන එන ලද නිෂ්පාදන මත ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් අයකර ගනු ලැබිය හැකි ය.

තාවකාලික බදු ස්ථිර වශයෙන් එකතු කිරීම.

**53.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හානිය පිළිබඳව (එහෙත් හානියක් පිළිබඳ තර්ජනයක් හෝ කර්මාන්තයක් පිහිටුවීමට සැලකිය යුතු බාධාවක් හෝ පිළිබඳව නොවන) අවසාන තීරණයක් ගනු ලැබූ අවස්ථාවක හෝ හානියක තර්ජනයක් පිළිබඳව අවසාන තීරණයකට එළඹීමේ දී, තාවකාලික පියවර නොමැතිව එම ආනයන

ද්‍රව්‍ය ප්‍රපාතනයේ බලපෑම, හානියක් පිළිබඳව තීරණය කිරීමට තුඩු දිය හැකිව තිබෙන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකන අවස්ථාවක, තාවකාලික පියවර අදාළ කරගෙන තිබේ නම්, එසේ අදාළ කරගෙන තිබෙන යම් කාලසීමාවක් වෙනුවෙන්, ඉකුත් වූ කාලයට බලපාන පරිදි ස්ථිර ප්‍රපාතන විරෝධී බදු අයකර ගනු ලැබිය හැකි ය.

(2) ස්ථිර ප්‍රපාතන විරෝධී බද්ද තාවකාලික පියවර පිළිබඳ කාර්යය සඳහා ගණනය කළ මුදලට වඩා වැඩිවන අවස්ථාවක දී, වෙනස්වන ප්‍රමාණය එකතු නොකළ යුතු නමුත්, ආරක්ෂාව පිළිබඳ කාර්යය සඳහා ගණනය කරන ලද මුදලට වඩා ස්ථිර බද්ද අඩුවන අවස්ථාවක දී, එම වෙනස ප්‍රතිපූර්ණය කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හානිය පිළිබඳ තර්ජනය හෝ වැදගත් බාධාවක් පිළිබඳව තීරණයක් කරනු ලබන අවස්ථාවක දී, එම හානිය පිළිබඳ තර්ජනය හෝ වැදගත් බාධාව පිළිබඳ තර්ජනය පිළිබඳ තීරණයේ දින සිට පමණක් ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් පනවනු ලැබිය හැකි ය. ගෙවන ලද ඕනෑම තාවකාලික බද්දක් මාස එකහමාරක කාලසීමාවක් ඇතුළත ප්‍රතිපූර්ණය කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිෂේධනීය අවසාන තීරණයක් ගනු ලබන අවස්ථාවක දී, අදාළ කිරීමේ කාලසීමාව තුළ දී ගෙවන ලද යම් තාවකාලික බද්දක් මාස එකහමාරක කාලසීමාවක් ඇතුළත ප්‍රතිපූර්ණය කරනු ලැබිය යුතු ය.

### පියවර ගැනීමෙන් තොරව අවසන් කිරීම

ප්‍රමාණවත් නොවන සාක්ෂි, සුලු ප්‍රපාතන ආන්තික හෝ නොසැලකිය යුතු අන්දමේ ප්‍රමාණ හේතුවෙන් අවසන් කිරීම.

**54.** (1) විමර්ශනය දිගටම පැවැත්වීම සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රපාතනය පිළිබඳව හෝ හානිය පිළිබඳව හෝ ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ඕනෑම අවස්ථාවක දී, විමර්ශනය අවසන් කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රපාතන ආන්තිකය සුලු බවට හෝ සත්‍ය හෝ සිදුවිය හැකි ප්‍රපාතන ආනයනවල ප්‍රමාණය හෝ හානිය නොසැලකිය යුතු තරම් වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්, ඔහු විසින් විමර්ශනයක් අවසන් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා -

(අ) ප්‍රපාතන ආන්තිකය අපනයන මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් සඳහන් කළ විට එම ආන්තිකය සියයට දෙකකට වඩා අඩු නම්, ප්‍රපාතන ආන්තිකය සුළු බවට සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ විමර්ශනයට භාජන වී ඇති සියලු රටවල ආනයන තනි තනිව ගත් කල විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ සහ ශ්‍රී ලංකාවේ සමාන නිෂ්පාදනවල සම්පූර්ණ ආනයන ප්‍රමාණයෙන් සියයට තුනකට වඩා අඩු ප්‍රමාණයක් සංයුක්ත වන අතර, විමර්ශනයට භාජන වී ඇති සහ ශ්‍රී ලංකාවේ සමාන නිෂ්පාදනවල ආනයන ප්‍රමාණයෙන් සියයට හතකට වැඩි ප්‍රමාණයක් සාමූහිකව සංයුක්ත වන්නේ නම් මිස, යම් විශේෂිත රටකින් ලැබුණු විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයේ ප්‍රපාතනය කරන ලද ආනයන ප්‍රමාණය, විමර්ශනයට භාජන වූ සහ ශ්‍රී ලංකාවේ සමාන නිෂ්පාදනවල සම්පූර්ණ ආනයනවලින් සියයට තුනකට වඩා අඩු ප්‍රමාණයක් සංයුක්ත වන බවට දැනගැනීමට ලැබුණහොත්, ප්‍රපාතන ආනයනවල ප්‍රමාණය සාමාන්‍යයෙන් ඉතා සුළු ප්‍රමාණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**55.** ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව විමර්ශනයක් අවසන් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වූ නියමයට නිසි සැලකිල්ලක් දක්වමින් නිකුත් කරනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, පිළිගනු ලැබූ හෝ ප්‍රතික්ෂේප කරන ලද තර්කවලට හේතු සාධක වූ සිද්ධිමය කරුණු සහ නීතිමය කරුණු ද ඇතුළත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිල්ලට ගනු ලැබූ සිද්ධිමය කරුණු සහ නීතිමය කරුණුවලට අදාළ විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳ සොයා ගැනීම් සහ නිගමන සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු, එම ප්‍රසිද්ධ දැන්වීමේ සඳහන් විය යුතු ය. ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව විමර්ශනයක් අවසන් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

**ප්‍රපාතන විරෝධී බදු සහ මිල පොරොන්දුවීම් පිළිබඳ කාලසීමාව සහ ඒවා සමාලෝචනය කිරීම.**

**56.** (1) හානියක් සිදුවන ප්‍රපාතනයට එරෙහිව ක්‍රියා කිරීම සඳහා වන තාක් දුරට සහ එසේ අවශ්‍ය ප්‍රමාණයට, යම් ප්‍රපාතන විරෝධී බද්දක් බලාත්මකව පැවතිය යුතු ය. ප්‍රපාතන විරෝධී බද්දක කාල සීමාව.

(2) ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් පැනවූ දින සිට අවුරුදු පහක කාලසීමාවකට වඩා පසුව නොවන දිනයක දී හෝ 57 වන වගන්තිය යටතේ කරන ලද ආසන්නතම සමාලෝචනයක් මගින් ප්‍රපාතනය සහ හානිය යන දෙකම ආවරණය වී ඇත්තම්, එම ප්‍රතිශෝධනයේ දින සිට, යම් ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් අවසන් විය යුතු ය.

(3) යම් ප්‍රපාතන විරෝධී බද්දක් නුදුරු අනාගතයේ දී අවසන් වීම පිළිබඳව දැන්වීමක් එම ප්‍රපාතන විරෝධී බද්ද අවසන් වන දිනයට පෙරාතුව වූ මාස තුනකට පසුව නොවන කාලසීමාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් *ගැසට් පත්‍රයේ* සහ ශ්‍රී ලංකාවේ පුළුල්ව සංසරණය වන යම් පුවත්පතක භාෂා තුනෙන් ම පළකරනු ලැබිය යුතු ය. ස්ථිර ප්‍රපාතන විරෝධී බද්දක් අවසන් වීමේ දිනයට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය මෙහෙයවීමෙන් ම අරඹන ලද සමාලෝචනයක් අනුව හෝ අදාළ ස්ථිර ප්‍රපාතන විරෝධී බද්ද නුදුරු අනාගතයේ දී අවසන්වීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමේ දින සිට මාස එකහමාරක කාලසීමාවක් ඇතුළත ශ්‍රී ලංකාවේ කර්මාන්තය විසින් හෝ එය වෙනුවෙන් කරන ලද යථා පරිදි සනාථ කරනු ලැබූ ඉල්ලීමක් මත හෝ බද්ද අවසන්වීම හේතුකොටගෙන ප්‍රපාතනය සහ හානිය දිගටම සිදුවීමට හෝ පුනරාවර්තනය වීමට ඉඩ ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්, එම ස්ථිර ප්‍රපාතන විරෝධී බද්ද අවසන් කරනු නොලැබිය හැකි ය. එම බද්ද සමාලෝචනයේ තීරණය ලැබෙන තුරු බලාත්මකව පැවතිය හැකි ය.

අවස්ථානුගත කරුණු වෙනස් කිරීම සඳහා වූ සමාලෝචනය.

**57.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ ස්ථිර ප්‍රපාතන විරෝධී බද්ද පැනවීමෙන් පසු සාධාරණ කාලයක් ගත වී ඇති අවස්ථාවක, සමාලෝචනයක් කිරීමේ අවශ්‍යතාව සනාථ කරන ධනාත්මක තොරතුරු ඇතුළත් කරමින් යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත හෝ ප්‍රපාතන විරෝධී බද්දක් දිගටම බලාත්මකව පැවතීම සඳහා වන අවශ්‍යතාව, අවශ්‍ය අවස්ථාවන්හි දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සමාලෝචනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ යටතේ සමාලෝචනයක් ආරම්භ කිරීමේ දී එම සමාලෝචනය ආරම්භ කිරීම පිළිබඳ වූ දැන්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් *ගැසට් පත්‍රයේ* සහ ශ්‍රී ලංකාවේ පුළුල්ව සංසරණය වන යම් පුවත්පතක භාෂා තුනෙන් ම පළ කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සමාලෝචනයක් සිදු කිරීමේ දී, උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමක් ප්‍රකාර -

(අ) ප්‍රපාතනය වැළැක්වීම සඳහා බද්ද දිගටම පනවා තිබීම අවශ්‍ය වන්නේ ද යන්න;

(ආ) බද්ද ඉවත් කරනු ලැබුවහොත් හෝ වෙනස් කරනු ලැබුවහොත් හානිය දිගටම සිදුවීමට හෝ නැවත ඇතිවීමට ඉඩ ඇද්ද යන්න; හෝ

(ඇ) එම සිද්ධි දෙකම සිදුවන්නේ ද යන්න,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කර බලනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ සමාලෝචනයක ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රපාතන විරෝධී බද්ද තවදුරටත් අවශ්‍ය නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක, එම බද්ද වහාම අවසන් කළ යුතු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය.

නව ප්‍රවේශක සමාලෝචනය.

**58.** (1) යම් නිෂ්පාදනයක් ස්ථිර ප්‍රපාතන විරෝධී බදුවලට යටත්වන අවස්ථාවක, විමර්ශන කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවට අදාළ නිෂ්පාදනය අපනයනය නොකළ අදාළ අපනයන රටේ යම් අපනයනකරුවන් සඳහා හෝ නිෂ්පාදකයන් සඳහා වෙන වෙනම ප්‍රපාතන ආන්තික තීරණය කිරීමේ කාර්යය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වහාම සමාලෝචනයක් කළ යුතු ය. එසේ වුව ද, ආනයනය කරන ලද විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය මත ප්‍රපාතන විරෝධී බදුවලට යටත් වන අපනයන රටේ යම් නිෂ්පාදකයන් හෝ අපනයනකරුවන් සමග සම්බන්ධතාවක් නොමැති බව ඉහත කී අපනයනකරුවන්ගේ හෝ නිෂ්පාදකයින් විසින් පෙන්නුම් කරනු ලැබිය හැකි ය. අදාළ නිෂ්පාදකයා හෝ අපනයනකරු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් ලැබුණු දිනයට පසුව එළඹෙන එක් මාසයක කාලසීමාවක් ඇතුළත, එවැනි සමාලෝචනයක් ආරම්භ කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සමාලෝචනයක් සාමාන්‍යයෙන් එය ආරම්භ කොට මාස හයක කාලසීමාවක් ඇතුළත අවසන්

කරනු ලැබිය යුතු අතර, කවර අවස්ථාවක දී වුවත් එය ආරම්භ කිරීමේ දින සිට මාස දොළහකට නොවැඩි කාලසීමාවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සමාලෝචනයක් කරගෙන යනු ලබන්නේ යම් අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන්ගේ ඉල්ලීම මත ද, එවැනි අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන්ගේ ආනයන මත සමාලෝචනය සිදු කරන අතරතුර දී කිසිදු ප්‍රපාතන විරෝධී බද්දක් අය කරනු නොලැබිය යුතු ය. එසේ වුව ද, සමාලෝචනයේ ප්‍රතිඵලයක් වශයෙන් එම නිෂ්පාදකයන් හෝ අපනයනකරුවන් සම්බන්ධයෙන් ප්‍රපාතනය පිළිබඳ තීරණයක් කරනු ලැබුවහොත්, සමාලෝචනය ආරම්භ කළ දින පටන් අතීතයේ සිට ක්‍රියාත්මකව ප්‍රපාතන විරෝධී බදු අයකළ හැකි බවට වගබලා ගැනීම පිණිස, මේ පනතේ 48 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ නිශ්චය කළ අවශේෂ ප්‍රපාතන විරෝධී බදු අනුප්‍රමාණයට අනුකූල මුදල් ප්‍රමාණය සඳහා ඇප සපයන ලෙස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිය හැකි ය.

මිල පොරොන්දුවල කාල සීමාව සහ එය සමාලෝචනය කිරීම.

**59.** (අ) මේ පනතේ 44 සිට 47 දක්වා වූ වගන්තිවල විධිවිධාන යටතේ භාරගනු ලැබූ මිල පොරොන්දු සම්බන්ධයෙන් මේ පනතේ 56 සහ 57 වන වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ආ) මේ පනතේ 21, 25, 26, 27, 29, 32, 33, 34, 35, 36, 37, 38, 39 සහ 40 වන වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනතේ මේ කොටස යටතේ සිදු කරනු ලබන යම් සමාලෝචනයකට අදාළ විය යුතු ය; සහ

(ඇ) ඉතා කඩිනමින් සිදු කළ යුතු වූ ද, එම සමාලෝචනය ආරම්භ කොට මාස දොළහක කාලසීමාවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු වූ ද, මේ පනතේ 56 සහ 57 වන වගන්ති යටතේ පවත්වනු ලබන්නා වූ ද යම් සමාලෝචනයකට, මේ පනතේ 22 වන වගන්තිය අදාළ විය යුතු ය.

### මගහැරීම වැළැක්වීම

ප්‍රපාතන විරෝධී බදු මගහැරීම.

**60.** (1) ප්‍රපාතන විරෝධී බදු පැනවීමේ කාර්යය සඳහා දැනුම් දෙනු ලැබූ ආරම්භක රට හෝ අපනයනය කරන රට ඇතුළු යම් රටකින් ප්‍රපාතන විරෝධී බදුවලට යටත් යම් භාණ්ඩයක් එකලස්

නොකළ, අවසන් නොකළ හෝ සම්පූර්ණ නොකළ ආකාරයට ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ, ශ්‍රී ලංකාවේ දී හෝ එම අදාළ රටේ දී එම භාණ්ඩය එකලස් කරනු ලබන, අවසන් කරනු ලබන හෝ සම්පූර්ණ කරනු ලබන අවස්ථාවක දී -

(අ) ප්‍රපාතන විරෝධී විමර්ශනයට පසුව හෝ ඊට ස්වල්ප කලකට පෙර මෙහෙයුම් කටයුතු ආරම්භ වූයේ නම් හෝ වැඩිකරනු ලැබුයේ නම් සහ ප්‍රපාතන විරෝධී බදු පැනවීමේ කාර්යය සඳහා දැනුම් දෙනු ලැබූ ආරම්භක රටෙන් හෝ අපනයනය කරනු ලබන රටෙන් කොටස් සහ උපාංග ආනයනය කරනු ලබන්නේ නම්; සහ

(ආ) එම භාණ්ඩය එකලස් කිරීමට, අවසන් කිරීමට හෝ සම්පූර්ණ කිරීමට පසුව භාණ්ඩයේ වටිනාකම එකලස් කරන ලද, අවසන් කරන ලද හෝ සම්පූර්ණ කරන ලද භාණ්ඩයේ පිරිවැයෙන් සියයට තිස්පහකට වඩා අඩු නම්,

එම එකලස් කිරීම, අවසන් කිරීම හෝ සම්පූර්ණ කිරීම බලාත්මකව පවතින ප්‍රපාතන විරෝධී බදු මගහැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රපාතන විරෝධී බදුවලට යටත් යම් භාණ්ඩයක් එම භාණ්ඩයේ විස්තරය, නම හෝ සංයුතිය වෙනස් කිරීම ඇතුළත් වන යම් ක්‍රියාවලියකට යටත් කිරීමෙන් පසුව ප්‍රපාතන විරෝධී බදු අය කිරීම සඳහා දැනුම් දෙනු ලැබූ ආරම්භක රටෙන් හෝ අපනයනය කරනු ලබන රටෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන අවස්ථාවක, ප්‍රපාතන විරෝධී බදුවලට යටත් භාණ්ඩයේ විස්තරය හෝ නම හෝ සංයුතිය වෙනස් කිරීම මගින් එකී භාණ්ඩයේ ස්වරූපය හෝ පෙනුම සුළු වශයෙන් හෝ වෙනස් වීමේ ප්‍රතිඵලය ඇති කරන්නේ නම්, බදු වර්ගීකරණයේ වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස නොතකා, එම වෙනස් කිරීම, බලපවත්නා ප්‍රතාපන විරෝධී බදු මගහැරීමට කරන ලද වෙනස් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ප්‍රපාතන විරෝධී බදුවලට යටත් යම් භාණ්ඩයක් ප්‍රපාතන විරෝධී බදුවලට යටත් නොවන අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් හරහා නැතහොත් එවැනි රටක් හරහා ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන අවස්ථාවක, ප්‍රපාතන විරෝධී බදු පැනවීම සඳහා දැනුම් දෙනු ලැබූ අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන්,

ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රපාතන විරෝධී බදුවලට යටත් නොවන අපනයනකරුවන් හෝ නිෂ්පාදකයන් හරහා හෝ එවැනි රටක් හරහා ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සඳහා භාණ්ඩයට අදාළ ඔවුන්ගේ වෙළෙඳ පරිචය, වෙළෙඳාම් ක්‍රමය හෝ අලෙවි කිරීමේ මාර්ග වෙනස් කරන්නේ නම් එම අපනයන බලාත්මකව පවතින ප්‍රපාතන විරෝධී බදු මගහරින ලෙස සලකනු ලැබිය යුතු ය.

මගහැරීම තීරණය කිරීම සඳහා විමර්ශන ආරම්භ කිරීම.

**61.** (1) මෙහි පහත විධිවිධාන සලසා ඇති පරිදි හැර, ශ්‍රී ලාංකීය කර්මාන්තය විසින් හෝ එය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් ලැබීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පනතේ 2 (1) වගන්තිය යටතේ අය කරනු ලබන, මගහරින ලදැයි කියනු ලබන පරිදි ප්‍රපාතන විරෝධී බදු මගහැරීමක් සිදු වී ඇති බව සහ එහි බලපෑම තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් ආරම්භ කළ හැකි ය.

(2) අදාළ ඉල්ලීමේ වෙනත් කරුණු අතර මගහැරීමට එරෙහි වූ විමර්ශනයක් ආරම්භ කිරීම සාධාරණීකරණය කිරීම සඳහා අවස්ථානුගත කරුණු පැවතීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි තිබිය යුතු ය.

(3) (1) වන ඡේදයේ සඳහන් කරුණු නොකතා, බලාත්මකව පවතින ප්‍රපාතන විරෝධී බදු මගහැරීමක් පෙන්නුම් කරන අවස්ථානුගත කරුණු පැවතීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට උනන්දුවක් දක්වන පාර්ශ්වයකින් ලැබුණු තොරතුරුවලින් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය මෙහෙයවීමෙන් ම විමර්ශනයක් ආරම්භ කළ හැකි ය.

(4) බලාත්මකව පවතින ප්‍රපාතන විරෝධී බදු මගහැර ඇති භාණ්ඩයක් ආනයනය කර එම භාණ්ඩ ප්‍රපාතනය කර ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, බලාත්මකව පවතින ප්‍රපාතන විරෝධී බදු මගහරින ලදැයි කියනු ලබන පරිදි මගහැරීමක් සිදුවීම හා එහි බලපෑම තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විමර්ශනයක් ආරම්භ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් විමර්ශනයක් ආරම්භ කිරීමට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භාණ්ඩය අපනයනය කරන රටේ ආණ්ඩුවට ඒ බව දැනුම් දිය යුතු ය.

(5) මේ පනත යටතේ ප්‍රපාතන විරෝධී විමර්ශනයක් පැවැත්වීම සම්බන්ධයෙන් වූ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තිය යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක් අදාළ විය යුතු ය.

(6) එවැනි විමර්ශනයක් මාස දොළහක කාලසීමාවක් ඇතුළත අවසන් කළ යුතු අතර, කවර අවස්ථාවක දී හෝ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව වාර්තාගත කළ යුතු හේතු අනුව එවැනි විමර්ශනයක් ආරම්භ කිරීමේ දින සිට මාස දහඅටක කාලසීමාවකට නොවැඩි කාලයක් තුළ අවසන් කළ යුතු ය.

මගහැරීම තීරණය කිරීම.

**62.** (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රපාතන විරෝධී බදු මගහැරීමක් පවතින බවට තීරණය කිරීමෙන් පසු, දැනට පවත්නා ප්‍රපාතන විරෝධී බදු මගහරින බවට සොයාගනු ලැබූ භාණ්ඩ ආනයනවලට හෝ දැනටමත් ප්‍රපාතන විරෝධී බදු පැනවීමේ කාර්යය සඳහා දැනුම් දෙනු ලැබූ රටවල් හැර වෙනත් රටවලින් ආරම්භ වන හෝ ආනයනය කරනු ලබන ආනයනික භාණ්ඩවලට ප්‍රපාතන විරෝධී බදු පැනවිය යුතු බවට අන්තර් අමාත්‍යාංශ කමිටුවට නිර්දේශ කරනු ලැබිය හැකි අතර, එම බදු 61 වන වගන්තිය යටතේ විමර්ශනයක් ආරම්භ කිරීමේ දින සිට ඉකුත් කාලයට අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන නිර්දේශයක යෝග්‍ය බව සලකා බැලීම අන්තර් අමාත්‍යාංශ කමිටුවේ කාර්යය විය යුතු අතර, එම කමිටුව විසින් එහි නිර්දේශ එම යෝජනාව ලැබුණ දින සිට වැඩ කරන දින දහයක කාලසීමාවක් ඇතුළත අමාත්‍යවරයා හරහා මුදල් විෂයය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

මගහැරීම සමාලෝචනය කිරීම.

**63.** (1) අවශ්‍ය අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ පියවර ගැනීමෙන් පසු සාධාරණ කාලයක් ගතවී තිබිය දී සමාලෝචනයේ අවශ්‍යතාවය ධනාත්මක තොරතුරු ඉදිරිපත් කරමින් සනාථ කරන යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බද්ද දිගටම පැනවීමේ අවශ්‍යතාව සමාලෝචනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආරම්භ කරන ලද යම් සමාලෝචනයක් එය ආරම්භ කළ දින සිට මාස 12 කට වැඩි නොවන කාලයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## ප්‍රතිතෝලන බදු

**ප්‍රතිතෝලන බදු පනවනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු.**

**64.** (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව ආරම්භකොට පවත්වනු ලබන විමර්ශනයක ප්‍රතිඵලයක් වශයෙන් -

(අ) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය සම්බන්ධයෙන් මේ පනතේ අර්ථානුකූලව තහනම් කළ සහනාධාරයක් හෝ ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාරයක් ලබාදෙන බවට;

(ආ) ශ්‍රී ලාංකීය කර්මාන්තයට හානියක් සිදුවන බවට; සහ

(ඇ) සහනාධාර දෙනු ලැබූ ආනයනය සහ සිදු වූ හානිය අතර හේතුකාරක සම්බන්ධතාවයක් ඇති බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද නිෂ්පාදන මත ප්‍රතිතෝලන බද්දක් පනවනු ලැබිය හැකි ය.

(2) එක් රටකට වැඩි රටවල් ප්‍රමාණයකින් ආනයනය කරන සමාන නිෂ්පාදන සමගාමී ප්‍රතිතෝලන බදු විමර්ශනයකට යටත්ව ඇති අවස්ථාවක, හානියක් සිදු වී ඇද්ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා පහත සඳහන් අවස්ථාවල දී පමණක්, ශ්‍රී ලංකාවේ කර්මාන්තය සම්බන්ධයෙන් එසේ සහනාධාර ලැබූ ආනයනවල බලපෑම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සාමූහිකව තක්සේරු කරනු ලැබිය හැකි ය**:-**

(අ) 14 වන වගන්තිය යටතේ පෙත්සම් ගොනු කරනු ලැබ ඇත්නම්;

(ආ) එක් එක් රටෙන් ආනයනය කරන ලද ආනයනවලට අදාළව සකස් කරන ලද ප්‍රතිතෝලන සහනාධාර ප්‍රමාණය 74 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට සුළු අගයකට වඩා වැඩිවන අතර, එක් එක් රටෙන් ආනයනය කරනු ලබන ආනයන ප්‍රමාණය 74 වන වගන්තියේ

නිශ්චිතව දක්වා ඇති පරිදි ගණන් ගත නොහැකි තරම් සුළු නොවන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්; සහ

(ඇ) ආනයනය කරන ලද නිෂ්පාදන අතර පවතින තරඟයේ තත්ත්වය සහ ආනයනය කරන ලද නිෂ්පාදන සහ දේශීය වශයෙන් ඇති සමාන නිෂ්පාදන අතර ඇති තරඟයේ තත්ත්වය සැලකිල්ලට ගැනීමේ දී, ආනයනවල බලපෑම පිළිබඳ සාමූහික තක්සේරුවක් කිරීම උචිත බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන්නේ නම්.

*සහනාධාරයක් ප්‍රතිතෝලන බද්දකට යටත් කළ හැක්කේ කුමන අවස්ථාවක දී ද යන්න.*

**65.** (1) මේ පනතේ 64 වන වගන්තියේ විධිවිධාන යටතේ, සහනාධාරයක් -

(අ) තහනම් කළ සහනාධාරයක්;

(ආ) ක්‍රියාත්මක කළ හැකි සහනාධාරයක්,

වන්නේ නම්, ප්‍රතිතෝලන බද්දකට යටත් කරනු ලැබිය හැකි ය.

(2) යම් සහනාධාරයක් -

(අ) මේ පනතේ 66 වන වගන්තියේ අර්ථානුකූලව යම් විශේෂිත සහනාධාරයක් නොවන බවට; හෝ

(ආ) මේ පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් සහනාධාරයක් බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, එම සහනාධාරය ප්‍රතිතෝලන බද්දකට යටත් නොවිය යුතු අතර, එය මේ පනතේ අර්ථානුකූලව ක්‍රියාමාර්ගයක් ගත නොහැකි සහනාධාරයක් බවට සලකනු ලැබිය යුතු ය.

*සහනාධාරයේ විශේෂත්වය සහ හඳිසිභාවය.*

**66.** (1) යම් සහනාධාරයක් එය ප්‍රදානය කරන අධිකාරයේ බලසීමාව ඇතුළත වූ (මේ වගන්තියේ "ඇතැම් ව්‍යවසාය" යනුවෙන් සඳහන් කරනු ලබන) ව්‍යවසායකට හෝ කර්මාන්තයකට නැතහොත් ව්‍යවසාය හෝ කර්මාන්ත සමූහයකට විශේෂිත වන්නේ ද යන්න, මේ පනතේ 65 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්යය සඳහා නිශ්චය කිරීම පිණිස පහත දැක්වෙන මූලධර්ම අදාළ විය යුතු ය:-

(අ) ප්‍රදානය කිරීමේ අධිකාරය විසින් හෝ ප්‍රදානය කිරීමේ අධිකාරය ක්‍රියාත්මක වන්නේ යම් නීතියක් ප්‍රකාරව ද එම නීතිය මගින් හෝ ඇතැම් ව්‍යවසායවලට සහනාධාරයක් ලබාදීම පැහැදිලිවම සීමා කරන අවස්ථාවක දී, එම සහනාධාරය විශේෂිත විය යුතු ය;

(ආ) ප්‍රදානය කිරීමේ අධිකාරය විසින් හෝ ප්‍රදානය කිරීමේ අධිකාරය ක්‍රියාකරනු ලබන්නේ යම් නීතියකට අනුගාමීව ද, එකී නීතිය මගින් හෝ සහනාධාරවලට ඇති සුදුසුබව සහ එහි ප්‍රමාණය ස්ථාපිත කරනු ලබන අවස්ථාවක දී, සුදුසු බව ස්වයංක්‍රීයව ලබා ඇති සහ එහි උපමාන සහ කොන්දේසි සත්‍යායනනය කළ හැකි පරිදි එකී නීතියේ හෝ වෙනත් යම් නිල ලේඛනයක පැහැදිලිව ප්‍රකාශ කොට ඇති සහ තදින් ම අනුගමනය කොට ඇති විටක දී, විශේෂත්වයක් නොපැවැතිය යුතු ය.

(ඇ) මෙම උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් කර ඇති මූලධර්ම අදාළකර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විශේෂතාවක් නොමැති බවක් පෙනී ගිය ද සහනාධාරය ඇත්ත වශයෙන් ම විශේෂිත විය හැකි බවට විශ්වාස කිරීමට හේතු ඇත්නම්, පහත දැක්වෙන සාධක සැලකිල්ලට ගනු ලැබිය හැකි ය. එනම්:-

(i) ඇතැම් සීමාසහිත ව්‍යවසාය සංඛ්‍යාවක් විසින් සහනාධාර වැඩ පිළිවෙළක් භාවිත කිරීම, ඇතැම් ව්‍යවසාය විසින් සහනාධාරය කැපී පෙනෙන ලෙස විශාල වශයෙන් භාවිත කිරීම, ඇතැම් ව්‍යවසායවලට සහනාධාර විසමානුපාතිකව විශාල ප්‍රමාණවලින් ලබාදීම සහ සහනාධාරයක් ප්‍රදානය කිරීමට තීරණය කිරීමේ දී ප්‍රදානය කිරීමේ අධිකාරය විසින් අභිමතය ක්‍රියාත්මක කර ඇති ආකාරය; සහ

(ii) ප්‍රදානය කිරීමේ අධිකාරයේ බලසීමාව ඇතුළත ආර්ථික කටයුතු විවිධාංගීකරණය කර ඇති ප්‍රමාණය සහ සහනාධාර වැඩපිළිවෙළ ක්‍රියාත්මකව තිබූ කාලසීමාවේ දීර්ඝත්වය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්යය සඳහා, විෂය මූලික උපමාන හෝ කොන්දේසි යන්නෙන්, මධ්‍යස්ථ වන්නා වූ ද, යම් ව්‍යවසායන් අභිබවා ඇතැම් ව්‍යවසායවලට පක්ෂග්‍රාහීව කටයුතු නොකරන්නා වූ ද, ආර්ථිකමය ස්වභාවයෙන් යුක්ත වූ ද, අදාළ කර ගැනීමේ දී සමාන්තරභාවයක් ඇත්තා වූ ද, ව්‍යවසායේ සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව හෝ ව්‍යවසායේ ප්‍රමාණය වැනි උපමාන හෝ කොන්දේසි අදහස් වේ.

(3) පොදුවේ අදාළවන බදු අනුප්‍රමාණ සකස් කිරීම හෝ වෙනස් කිරීම විශේෂිත සහනාධාරයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) සහනාධාරයක් ප්‍රදානය කරන අධිකාරයේ බලසීමාව ඇතුළත පිහිටි, නම් කරන ලද භූගෝලීය ප්‍රදේශයක පිහිටි ඇතැම් ව්‍යවසායවලට සීමා වූ සහනාධාරයක්, විශේෂිත සහනාධාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ යම් විශේෂිත භාවයක් තීරණය කිරීම ධනාත්මක සාක්ෂිවල පදනම මත කරනු ලැබිය යුතු ය.

**සහනාධාරයක් ප්‍රදානය කිරීම මගින් ප්‍රතිලාභ තීරණය කිරීම.**

**67.** (1) මේ පනතේ 85 වන වගන්තියේ අර්ථකථනය කර ඇති පරිදි "සහනාධාරය" යන්නෙහි කාර්යය සඳහා "ප්‍රතිලාභයක් ලබාදීම" යන්න තීරණය කිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන මාර්ගෝපදේශ සැලකිල්ලට ගත යුතු ය**:-**

(අ) ආයෝජන තීරණය යම් රටක භූමි ප්‍රදේශය තුළ පෞද්ගලික ආයෝජකයන්ගේ අවදානම් ප්‍රාග්ධනය සැපයීම ඇතුළු සාමාන්‍ය ආයෝජන පරිචයට අනනුකූල වන බවට සලකනු ලැබිය හැකිනම් මිස, ආණ්ඩුව විසින් ව්‍යාපාර කොටස් ප්‍රාග්ධනය සැපයීම, ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය;

(ආ) ආණ්ඩුවෙන් යම් ණය මුදලක් ලබන සමාගමක් විසින්, එම ණය මුදල මත ආණ්ඩුවට ගෙවන මුදල සහ එම සමාගම විසින් වෙළඳපළෙහි ඇත්ත වශයෙන් ලබාගත හැකිව තිබූ සංසන්දනාත්මක වාණිජ ණයක් මත ගෙවිය හැකි මුදල අතර වෙනසක් ඇත්නම් මිස, ආණ්ඩුවක් විසින් ලබාදෙන ණය මුදලක් ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීමක්

වශයෙන් සලකනු නොලැබිය යුතු අතර, එවැනි අවස්ථාවක දී ප්‍රතිලාභය විය යුත්තේ එම මුදල් ප්‍රමාණ දෙක අතර ඇති වෙනස ය;

(ඇ) ආණ්ඩුවෙන් ණය ඇපකරයක් ලබන සමාගමක් විසින් එම ණය මුදල මත ගෙවන මුදල සහ ආණ්ඩුවේ ඇපකරයක් නොමැතිව සංසන්දනාත්මක වාණිජ ණයක් මත එම සමාගම ගෙවිය හැකි මුදල අතර වෙනසක් ඇත්නම් මිස, ආණ්ඩුව විසින් ණය ඇපකරයක් ලබාදීම ප්‍රතිලාභයක් ලබාදීම වශයෙන් සලකනු නොලැබිය යුතු ය; තවද එවැනි අවස්ථාවක දී ගාස්තුවල යම් වෙනසක් සඳහා ගැලපීම් කරන ලද එම මුදල් ප්‍රමාණ දෙක අතර ඇති වෙනස ප්‍රතිලාභය විය යුතු ය; සහ

(ඈ) ආණ්ඩුව විසින් භාණ්ඩ හෝ සේවා සැපයීම සිදුකරනු ලබන්නේ ප්‍රමාණවත් පාරිශ්‍රමිකයකට වඩා අඩු මුදලකට නම් මිස හෝ ආණ්ඩුව විසින් භාණ්ඩ මිලදී ගනු ලබන්නේ ප්‍රමාණවත් පාරිශ්‍රමිකයකට වැඩි මුදලකට නම් මිස, ආණ්ඩුව විසින් භාණ්ඩ හෝ සේවා සැපයීම නැතහොත් භාණ්ඩ මිලදී ගැනීම ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්ය සඳහා පාරිශ්‍රමිකයේ ප්‍රමාණවත්භාවය, මිල, තත්ත්වය, සුලභතාව, විකිණීමේ හැකියාව, ප්‍රවාහනය සහ විකිණීමට හෝ මිලදී ගැනීමට අදාළ වෙනත් කොන්දේසි ඇතුළත්ව සැපයීම කරන රටේ හෝ මිල දී ගනු ලබන රටේ අදාළ භාණ්ඩ හෝ සේවා සඳහා තත්කාලීනව පවත්නා වෙළඳපළ තත්ත්වයන්ට අනුව තීරණය කරනු ලැබිය යුතු ය.

**68.** (1) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තනි තනිව විමර්ශනය කරනු ලැබූ නිෂ්පාදනයට අදාළව හඳුනාගත් එක් එක් අපනයනකරු හෝ නිෂ්පාදකයා සඳහා තනි පුද්ගල ප්‍රතිතෝලන බදු අනුප්‍රමාණයක් අදාළ කර ගැනීම සම්බන්ධයෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අමාත්‍යවරයා මගින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය. ප්‍රතිතෝලන බදු අනුපාතය සකස් කිරීම.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එක් එක් උනන්දුවක් දක්වන පාර්ශවය හෝ විමර්ශනයට භාජන වූ සියලුම නිෂ්පාදන හෝ තනිතනිව පරීක්ෂා කිරීම ප්‍රායෝගික නොවන ප්‍රමාණයට

අපනයනකරුවන්ගේ, නිෂ්පාදකයන්ගේ, ආනයනකරුවන්ගේ හෝ විමර්ශනයට භාජන වූ නිෂ්පාදන වර්ගවල ප්‍රමාණය ඉතා විශාලවන අවස්ථාවක, තේරීම සිදු කරන අවස්ථාවේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබී ඇති තොරතුරුවල පදනම මත, සංඛ්‍යාලේඛන වශයෙන් වලංගුවන සාම්පල භාවිත කිරීම මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂණය උනන්දුවක් දක්වන පාර්ශව හෝ විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදන සාධාරණ සංඛ්‍යාවකට, නැතහොත් සාධාරණ වශයෙන් විමර්ශනය කළ හැකි, අදාළ රටේ අපනයන ප්‍රමාණයෙන් වැඩිම ප්‍රතිශතයට, එම පරීක්ෂණය සීමා කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අපනයනකරුවන්, නිෂ්පාදකයන්, ආනයනකරුවන්, හෝ විමර්ශනයට භාජන වන නිෂ්පාදන වර්ගවල තෝරාගැනීමක් අදාළ අපනයනකරුවන්ගේ, නිෂ්පාදකයන්ගේ හෝ ආනයනකරුවන්ගේ කැමැත්ත විමසා සිදු කරනු ලැබිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ සීමිත පරීක්ෂණයක් සිදු කරනු ලැබූ අවස්ථාවක දී, තනි තනිව පරීක්ෂා කරන සියලුම අපනයනකරුවන් සහ නිෂ්පාදකයන් සඳහා සකස් කරන ලද ප්‍රතිතෝලන බදු අනුප්‍රමාණවල ගණනය කරන ලද සාමාන්‍යයට සමාන අනුප්‍රමාණයක්, විමර්ශනයට ඇතුළත් කරනු නොලැබූ යම් අපනයනකරුවකු හෝ නිෂ්පාදකයකු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ කරගනු ලැබිය යුතු ය. එසේ වුවද, මේ උපවගන්තියේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ශූන්‍ය හෝ ගණන් ගත නොහැකි තරම් සුළු වශයෙන් සලකනු ලැබූ ප්‍රතිතෝලන සහනාධාරයක් සැලකිල්ලට නොගත යුතු ය.

**විමර්ශනය සහ සමාලෝචනය ආරම්භ කිරීම, පැවැත්වීම සහ අවසන් කිරීම.**

මේ පනතේ මේ කොටස යටතේ විමර්ශනය ආරම්භ කිරීම.

**69.** මේ පනතේ මේ කොටස යටතේ ප්‍රතිතෝලන බදු විමර්ශනයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන්, මේ පනතේ 14 සිට 22 දක්වා වූ වගන්තිවල (එම වගන්ති දෙක ද ඇතුළුව) විධිවිධාන පහත දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම විමර්ශනයට සහ එම විමර්ශනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:-

(අ) ප්‍රතිතෝලන බදු විමර්ශනයක් ආරම්භ කිරීමට පෙර සහ එම විමර්ශනය පවත්වන අතරතුර දී, විමර්ශනයට අදාළ

සහ අන්‍යෝන්‍ය වශයෙන් එකඟත්වයට පැමිණිය හැකි විසඳුමකට එළැඹීමට අදාළ යම් කරුණක් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා අදහස් විමසීමේ අවස්ථාවක්, උනන්දුවක් දක්වන යම් විදේශ ආණ්ඩුවක් වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදිය යුතු ය;

(ආ) විමර්ශනය පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා ක්‍රියාකිරීම හෝ එම විමර්ශනයට අදාළව තාවකාලික හෝ අවසාන තීරණයකට එළඹීම (අ) ඡේදය යටතේ වූ අදහස් විමසීමක් මගින් කිසිම ආකාරයකින් වළක්වනු නොලැබිය යුතු ය; සහ

(ඇ) 16 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඉල්ලුම්පත්‍රයේ අදාළ නියමයන් සපුරා ඇති අවස්ථාවක, විමර්ශනයක් ආරම්භ කිරීම පිළිබඳ තීරණය එක් එක් අපනයන රටේ ආණ්ඩුව වෙත දැනුම්දීමේ අවශ්‍යතාවය මේ පනතේ මේ කොටස යටතේ ආරම්භ කරන ලද විමර්ශනයකට අදාළ නොවිය යුතු ය.

මේ පනතේ මේ කොටස යටතේ විමර්ශනයක් පැවැත්වීම සහ අවසන් කිරීම.

**70.** මේ පනතේ 23 සිට 43 දක්වා වූ වගන්තිවල විධිවිධාන, (එම වගන්ති දෙක ද ඇතුළුව) තාවකාලික පියවර නියම කිරීම ද ඇතුළුව මේ පනතේ මේ කොටස යටතේ විමර්ශනයක් පැවැත්වීම සහ අවසන් කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන සුළු වෙනස් කිරීම්වලට යටත්ව, එම විමර්ශනයට සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතු යː-

(අ) විමර්ශනයක් ආරම්භ කිරීමේ දී ප්‍රශ්න මාලාවක් යැවීම සඳහා මේ පනතේ 29 වන වගන්තිය යටතේ වූ අවශ්‍යතාවය මේ පනතේ මේ කොටස යටතේ පවත්වන විමර්ශනයක් සම්බන්ධයෙන් වන විට, උනන්දුවක් දක්වන සාමාජිකයන් වෙත හෝ උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙත එම ප්‍රශ්න මාලාව යැවීම ද ඇතුළත් විය යුතු ය;

(ආ) මේ පනතේ මේ කොටස යටතේ වූ විමර්ශනයක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ 41 වන වගන්තිය යටතේ ගනු ලබන තාවකාලික පියවර, තාවකාලිකව ගණන් බලනු ලැබූ සහනාධාර ප්‍රමාණයට සමාන වන මුදල් තැන්පතුවල හෝ බැඳුම්කරවල ස්වරූපය ගත යුතු ය;

(ඇ) මේ පනතේ මේ කොටස යටතේ වන විමර්ශනයක දී ගනු ලැබූ තාවකාලික පියවර සම්බන්ධයෙන් වන විට, මේ පනතේ 43 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් පරිදි ගනු ලැබූ යම් තාවකාලික පියවරක් අදාළ කර ගැනීමේ කාලසීමාව මාස හතරක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය; සහ

(ඈ) පනවනු ලැබූ තාවකාලික පියවර අදාළ කර ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීමට අදාළව 43 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, මේ පනතේ මේ කොටස යටතේ වූ විමර්ශනයකට අදාළ නොවිය යුතු ය.

**මිල පොරොන්දුව.**

71. (1) (අ) සහනාධාරය ප්‍රදානය කරන ආණ්ඩුව සහනාධාරය ඉවත් කිරීමට හෝ සීමා කිරීමට, නැතහොත් එහි බලපෑමට අදාළ වෙනත් පියවර ගැනීමට එකඟවන බවට; හෝ

(ආ) එම සහනාධාරය ප්‍රදානය කිරීම මගින් සිදුවන අහිතකර බලපෑම ඉවත් වන ලෙස එහි මිල ප්‍රතිශෝධනය කිරීමට අදාළ අපනයනකරු එකඟවන බවට,

සහනාධාරය ප්‍රදානය කරන ආණ්ඩුවෙන් හෝ අදාළ අපනයනකරුගෙන් සෑහීමට පත්විය හැකි පරිදි ස්වේච්ඡාවෙන් පොරොන්දුවක් ලැබීම මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තාවකාලික පියවර ගැනීමකින් තොරව මේ පනතේ මේ කොටස යටතේ වූ විමර්ශනයක් අත්හිටුවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ දෙන ලද මිල පොරොන්දුවක ප්‍රතිඵලයක් වශයෙන් සිදු කරනු ලබන යම් මිල වැඩිකිරීමක්, සහනාධාර ප්‍රමාණය ඉවත් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතු අතර, එම පනවන ලද මිල වැඩි කිරීම ශ්‍රී ලංකාවේ කර්මාන්තයට සිදුවන හානිය ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් නම්, එය සහනාධාරයේ මුදල් ප්‍රමාණයට වඩා අඩු වීම වඩා යෝග්‍ය ය.

(3) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා මිල පොරොන්දු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යෝජනා කරනු ලැබිය හැකි නමුත්, එවැනි මිල පොරොන්දුවලට ඇතුළත්වන ලෙසට අදාළ අපනයනකරුවන්ට බල නොකළ යුතු ය.

(4) අදාළ අපනයනකරු විසින් යම් මිල පොරොන්දුවක් අර්පණය නොකිරීම හෝ එසේ අර්පණය කිරීම සඳහා වූ ආරාධනයක් භාර නොගැනීම, කිසිදු ආකාරයකින් ඔහුගේ කාරණය සලකා බැලීම කෙරෙහි අගතියක් නොවිය යුතු නමුත්, සහනාධාර ලබා දී ඇති ආනයන දිගටම සිදු කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකාවේ කර්මාන්තයට හානියක් පිළිබඳ තර්ජනයක් ඇතිවීම යථාර්ථයක් වීමට ඉඩ ඇති බවට තීරණය කිරීමට නිදහස අධ්‍යක්ෂ ජනරාල්වරයාට තිබිය යුතු ය.

71 වන වගන්තිය යටතේ දෙන ලද ස්වේච්ඡා පොරොන්දුවල ප්‍රතිඵල.

**72.** මේ පනතේ 71 වන වගන්තිය යටතේ අපනයනකරුවකුගෙන් ස්වේච්ඡා මිල පොරොන්දු භාර ගැනීමේ කොන්දේසිවලට සහ එවැනි පොරොන්දු භාරගැනීම්වල ප්‍රතිඵලවලට සහ ඒවා සම්බන්ධයෙන් මේ පනතේ 45 සිට 47 දක්වා වූ වගන්තිවල විධිවිධාන, (එම වගන්ති දෙක ද ඇතුළුව) අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

මේ පනතේ මේ කොටස යටතේ ප්‍රතිතෝලන බදු පැනවීම සහ අයකර ගැනීම ආදිය.

**73.** (1) මේ පනතේ මේ කොටස යටතේ සිදු කරනු ලබන විමර්ශනයක දී ප්‍රතිතෝලන බදු පැනවීම සහ එකතුකර ගැනීම, ඉකුත් කාලයේ සිට ක්‍රියාත්මක වීම, විමර්ශනයක් අවසන් කිරීම, ප්‍රතිතෝලන බදුවල කාලසීමාව හා එම බදු සමාලෝචනය සහ ස්වේච්ඡා මිල පොරොන්දු සම්බන්ධයෙන්, මේ පනතේ 54 වන වගන්තියේ විධිවිධාන හැර, 48 සිට 57 දක්වා වූ වගන්තිවල විධිවිධාන (එම වගන්ති දෙක ද ඇතුළුව) සහ 59 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව එම කරුණුවලට සහ ඒවා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, මේ පනතේ මේ කොටස යටතේ පවත්වන ලද විමර්ශනයක දී (සහයෝගය දීමට ප්‍රතික්ෂේප කිරීම හැර වෙනත් යම් හේතුවක් නිසා) ඇතුළත් කරනු නොලැබූ අපනයනකරුවකු විසින් අපනයනය කරන ලද නිෂ්පාදන මත ප්‍රතිතෝලන බද්දක් පනවනු ලැබ ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වහාම මේ පනතේ මේ කොටස යටතේ විමර්ශනයක් ආරම්භ කොට එය අප්‍රමාදව සමාලෝචනය කළ යුතු අතර, ඊට හා ඒ සම්බන්යෙන් මේ පනතේ 58 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

**74.** (අ) ප්‍රතිතෝලන සහනාධාර ප්‍රමාණය සුළු බවට හෝ සහනාධාර දෙන සත්‍ය හෝ විය හැකි ආනයනයේ ප්‍රමාණය නැතහොත් එමගින් ශ්‍රී ලංකාවේ කර්මාන්තයට සිදුවන හානිය නොසලකා හැරිය යුතු තරම් වන බවට; හෝ

(ආ) විමර්ශනය දිගටම පවත්වාගෙන යාම සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවට,

මේ පනතේ මේ කොටස යටතේ ප්‍රමාණවත් සාක්ෂි නොතිබීම නිසා විමර්ශනයක් අවසන් කිරීම.

අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවකදී, මේ පනතේ මේ කොටස යටතේ වූ විමර්ශනයක් කවර අවස්ථාවක දී වුව ද අවසන් කරනු ලැබිය යුතු ය.

සාකච්ඡා.

**75.** (1) අධක්ෂ ජනරාල්වරයාට තමාගේම දැනීමෙන් හෝ යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින් සපයන ලද තොරතුරු මත, ශ්‍රී ලංකාවට අපනයනය කරනු ලබන යම් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් සාමාජිකයකු විසින්, තහනම් කරන ලද හෝ ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාරයක් ලබා දෙනු ලබන බවට හෝ පවත්වාගෙන යනු ලබන බවට විශ්වාස කිරීමට හේතු ඇති විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තොරතුරු අමාත්‍යවරයාට දැනගැනීමට සැලැස්විය යුතු ය.

(2) මේ පනත යටතේ ගනු ලැබිය හැකි වෙනත් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින්, තහනම් කරන ලද හෝ ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාරයක් සපයන ලදැයි කියනු ලබන සාමාජිකයාගෙන් ඒ සම්බන්ධව තත්ත්වය පැහැදිලි කිරීමේ හා දෙපාර්ශවයටම එකඟ විය හැකි විසඳුමක් කරා ළඟා වීමේ අරමුණ ඇතිව, සාකච්ඡාවකට පැමිණෙන ලෙස ඉල්ලා සිටිය හැකි ය. එසේ වුව ද, යම් විසඳුමක් අවසානාත්මක කිරීමට පළමුව ශ්‍රී ලාංකීය කර්මාන්තයට විභාග කිරීමක් ලබා දිය යුතු ය.

(3) මේ පනතේ II වන කොටස යටතේ ආරම්භ කරන ලද යම් විමර්ශනයක්, (2) වන උපවගන්තිය යටතේ එළැඹෙන ලද විසඳුමක දී අත්හිටවනු ලැබිය හැකි ය. එසේ වුව ද, හුදෙක් ම (2) වන වගන්තිය යටතේ යම් සාකච්ඡාවක් සඳහා ඉල්ලීමක් කිරීම හෝ එවැනි සාකච්ඡාවක් ආරම්භ කිරීම හේතුවෙන් ම, එවැනි විමර්ශන තහනම් කරනු නොලැබිය යුතු සහ අත්හිටවනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාකච්ඡාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක්, එවැනි තහනම් කරන ලද හෝ ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාරයක පැවැත්ම සහ එවැනි සහනාධාරයක ස්වභාවය පිළිබඳ පවත්නා සියලු සාක්ෂි ඇතුළත් ප්‍රකාශයක් සමග කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### සාමාන්‍ය

හානිය තීරණය කිරීම.

**76.** (1) මේ පනතේ 2 වන වගන්තියේ (ආ) ඡේදයේ සහ 64 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, හානියක් පිළිබඳ තීරණයක් ධනාත්මක සාක්ෂි මත පදනම් විය යුතු අතර එවැනි තීරණයකට -

(අ) ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙනු ලැබූ ආනයනවල ප්‍රමාණය සහ සමාන නිෂ්පාදන සඳහා දේශීය වෙළඳපළෙහි මිල පිළිබඳව ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙනු ලැබූ ආනයනවල බලපෑම; සහ

(ආ) එවැනි සමාන නිෂ්පාදනවල දේශීය නිෂ්පාදකයන් මත එම ආනයන වලින් සිදුවන ආනුෂාංගික බලපෑම,

සම්බන්ධ විෂයබද්ධ වූ පරීක්ෂණයක් ඇතුළත් විය යුතු ය.

(2) ශ්‍රී ලාංකීය කර්මාන්තය කෙරෙහි සහනාධාරය දෙනු ලැබූ හෝ ප්‍රපාතනය කරන ලද ආනයනවල බලපෑම පරීක්ෂා කිරීමේ දී එම කර්මාන්තයේ තත්ත්වය කෙරෙහි බලපෑමක් සිදුවන පහත දැක්වෙන කරුණු ඇතුළුව, එම කර්මාන්තයට අදාළ සියලු ආර්ථික සාධක සහ දර්ශක ඇගයීම මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය පරීක්ෂණය පදනම් කරගත යුතු යː-

(අ) නිමැවුම, විකිණීම්, වෙළෙඳපළ කොටස්, ලාභ, ඵලදායීතාවය, ආයෝජනයෙන් ලැබෙන ලාභ හෝ හැකියාව ප්‍රයෝජනයට ගැනීම යන කරුණුවල සැබෑ සහ විභව පිරිහීම;

(ආ) දේශීය මිල කෙරෙහි බලපාන සාධක;

(ඇ) ප්‍රපාතන විරෝධී විමර්ශනයක් සම්බන්ධයෙන් වන විට, ප්‍රපාතන ආන්තිකයේ විශාලත්වය;

(ඇ) මුදල් ගලනය, ඉන්වෙන්ටරි, සේවා නියුක්තිය, පඩිනඩි, ප්‍රාග්ධනයේ හෝ ආයෝජනයේ වර්ධනය හෝ ඒවා ඉහළ යාමේ හැකියාව කෙරෙහි ඇති සැබෑ සහ විභව නිෂේධ බලපෑම; සහ

(ඉ) කෘෂිකර්මයට අදාළ ප්‍රතිතෝලන බදු විමර්ශනයක් සම්බන්ධයෙන් වන විට, ආණ්ඩුව සහාය දක්වන වැඩසටහන් කෙරෙහි වැඩි වූ බරක් ඇති වී තිබේද යන වග.

(3) (2) වන උපවගන්තියේ ලැයිස්තුගත කර ඇති සාධක සහ දර්ශක පරිපූර්ණ ලෙස සලකනු නොලැබිය යුතු අතර, එවැනි සාධකයක් හෝ දර්ශකයක් අවශ්‍යයෙන්ම අවසානාත්මක ලෙස සලකනු නොලැබිය යුතු ය.

හේතුකාරක සබඳතාවය.

**77.** (1) මෙම පනතේ 2 වගන්තියේ (ඇ) ඡේදයේ හෝ 64 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කාර්යය සඳහා, විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයෙන් ශ්‍රී ලාංකීය කර්මාන්තයට සිදු කරන ලද හානිය සහ අවස්ථාවෝචිත පරිදි, ප්‍රපාතනය හෝ ප්‍රතිතෝලන සහනාධාරයක් ප්‍රදානය කිරීම අතර හේතුකාරක සබඳතාවයක් තිබේද යන්න තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනත් කරුණු අතර, පහත සඳහන් කරුණු ද සලකා බලනු ලැබිය යුතු යː-

(අ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනයට හෝ පරිභෝජනයට අදාළව හෝ සම්පූර්ණයෙන්ම ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවල, සැහෙන වැඩිවීමක් තිබේ ද යන්න;

(ආ) දේශීය වශයෙන් ඇති සමාන නිෂ්පාදනයේ මිල සමඟ සංසන්දනය කිරීමේ දී ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවලින් සැහෙන ප්‍රමාණයකට මිල අඩු කිරීමක් සිදු වී ඇත්ද යන්න; සහ

(ඇ) ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවල බලපෑම නිසා මිල සැහෙන ප්‍රමාණයකින් අවපාතයට භාජන වී ඇත්ද, නැතහොත් සැහෙන ප්‍රමාණයකට අන්‍යාකාරයකින් වැඩිවීමට ඉඩ තිබූ මිල වැඩිවීම වළක්වා ඇද්ද යන්න.

(2) නිෂ්පාදන ක්‍රියාවලිය, නිෂ්පාදකයන්ගේ විකුණුම් සහ ලාභ වැනි නිර්ණායකවලට අනුකූලව, නිෂ්පාදනය වෙන් වශයෙන් හඳුනාගැනීමට ලබාගත හැකි දත්ත මගින් ඉඩ ලැබෙන අවස්ථාවක, සමාන නිෂ්පාදනයක් දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමට අදාළව, ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවල බලපෑම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තක්සේරු කරනු ලැබිය යුතු ය.

(3) නිෂ්පාදනය වෙන් වශයෙන් හඳුනාගැනීම සිදුකළ නොහැකි නම්, අවශ්‍ය විස්තර සපයා දිය හැකි, සමාන දේශීය නිෂ්පාදන ද ඇතුළත් වන නිෂ්පාදනවල ඉතා කුඩාම කාණ්ඩයේ හෝ පංතියේ නිෂ්පාදනය පිළිබඳව පරීක්ෂා කිරීම මගින්, ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවල බලපෑම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තක්සේරු කරනු ලැබිය යුතු ය.

(4) ප්‍රපාතන විරෝධී විමර්ශනයකට අදාළව, ප්‍රපාතනය කරන ලද ආනයන සහ ශ්‍රී ලාංකීය කර්මාන්තයට සිදුවන හානිය අතර හේතු කාරක සබඳතාවයක් පවතින බව පෙන්වීම, අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට ඇති සියලු අදාළ සාක්ෂි පරීක්ෂා කිරීමක් මත පදනම් විය යුතු ය.

(5) ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයන හැර එම කාලයේ දී ශ්‍රී ලංකාවේ කර්මාන්තයට හානි සිදු කරන වෙනත් යම් හඳුනාගත් සාධක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකා බලනු ලැබිය හැකි සාධකවලට, වෙනත් කරුණු අතර පහත දැක්වෙන කරුණු ද ඇතුළත් විය හැකි යः-

(අ) ප්‍රශ්නයට තුඩු දී ඇති භාණ්ඩවල සහනාධාර රහිතව ආනයනය කළ ප්‍රමාණය සහ මිල, නැතහොත් ප්‍රපාතන මිලට විකුණනු නොලැබූ ආනයනවල ප්‍රමාණය සහ මිල;

(ආ) ඉල්ලුම් අඩුවීම හෝ පරිභෝජන රටාවේ වෙනස්වීම්;

(ඇ) විදේශීය සහ ශ්‍රී ලාංකික නිෂ්පාදකයන්ගේ වෙළෙඳාම සීමාකිරීමේ පරිචයන් සහ ඔවුන් අතර තරගය;

(ඈ) තාක්ෂණවේදයේ වර්ධනය; සහ

(ඉ) ශ්‍රී ලාංකීය කර්මාන්තයේ අපනයන කාර්ය සාධනය සහ ඵලදායිතාවය.

(7) ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවලින් හැර වෙනත් සාධක මගින් ශ්‍රී ලාංකීය කර්මාන්තයට සිදුවන හානිය, ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර දෙන ලද ආනයනවලින් සිදුවූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

දැඩි හානියක් පිළිබඳ තර්ජනය.

**78.** (1) මේ පනතේ කාර්යය සඳහා ශ්‍රී ලාංකීය කර්මාන්තයට සිදුවන දැඩි හානියක තර්ජනයක් පිළිබඳ තීරණය කිරීම, හුදෙක් චෝදනා, අනුමාන හෝ දුරස්ථ ශක්‍යතාව මත නොව සිද්ධිමය කරුණු මත පදනම් විය යුතු අතර, ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර ලැබූ නිෂ්පාදන මගින් හානියක් සිදුවන තත්ත්වයක් නිර්මාණය විය හැකි අන්දමේ සිද්ධිමය කරුණුවල වෙනස්වීමක් පැහැදිලිව පෙර දැකිය යුතු අතර එම හානිය අත්‍යාසන්නද විය යුතු ය.

(2) දැඩි හානියක් පිළිබඳ තර්ජනයක් ඇද්ද යන්න තීරණය කිරීමේ දී, වෙනත් කරුණු අතර පහත දැක්වෙන කරුණු විශේෂ අවධානයක් ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිල්ලට ගත යුතු යː-

(අ) ආනයන සැහෙන ප්‍රමාණයකින් වැඩිවීමේ හව්‍යතාව පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ වෙළෙඳපළට ප්‍රපාතනය කරනු ලැබූ හෝ සහනාධාර ලැබූ ආනයන පරිමාණයෙහි සැලකිය යුතු වැඩිවීමක්;

(ආ) යම් අතිරේක අපනයන අවශෝෂණය කිරීම සඳහා වෙනත් අපනයන වෙළෙඳපළ තිබීම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ වෙළෙඳපළට විශාල වශයෙන් ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර ලැබුණු අපනයන වැඩිවීමේ හව්‍යතාව පෙන්නුම් කරන අපනයනකරුගේ නිදහසේ අලෙවි කිරීමේ හැකියාව හෝ එම හැකියාවේ අත්‍යාසන්න වැඩිවීමක් පැවතීම ;

(ඇ) ආනයනය කරන ලද නිෂ්පාදන, ශ්‍රී ලංකාවේ මිල කෙරෙහි ප්‍රබල අවපාතක හෝ පීඩාකාරී බලපෑමක් ඇති මිලකට හෝ ආනයන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම තවදුරටත්

වැඩි කරවන සුලු මිලකට වෙළෙඳපලට ඇතුළුවන්නේ ද යන්න;

(ඈ) විමර්ශනය කෙරෙන නිෂ්පාදන පිළිබඳ ඉන්වෙන්ටරි; සහ

(ඉ) ප්‍රතිතෝලන බදු විමර්ශනයක් සම්බන්ධයෙන් වන විට, අදාළ ප්‍රශ්නගත සහනාධාරයේ හෝ සහනාධාරවල ස්වභාවය සහ එයින් පැන නැගීමට ඉඩ තිබෙන වෙළෙඳ බලපෑම්.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සාධකවලින් කිසිම සාධකයක් මඟින් පමණක් යම් තීරණාත්මක මඟපෙන්වීමක් අවශ්‍යයෙන් ම සිදුකරන බවට සලකනු නොලැබිය යුතු නමුත්, සලකා බලනු ලැබූ සමස්ත සාධක අනුව ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර ලැබූ නිෂ්පාදන තවදුරටත් ආනයනය කිරීම අත්‍යාසන්න බවටත්, වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගනු නොලැබුවහොත් හානියක් සිදුවිය හැකි බවටත් නිගමනය කළ යුතු ය.

**79.** (1) මේ පනතේ කාර්ය සඳහා ශ්‍රී ලාංකීය කර්මාන්තය ස්ථාපනය වීමට දැඩි බාධා සිදුවන බව තීරණය කිරීම - දැඩි බාධා සිදුවීම.

(අ) සමාන නිෂ්පාදන නිපදවන ශ්‍රී ලාංකීය කර්මාන්තය ස්ථාපනය වෙමින් පවතින බවට;

(ආ) එම කර්මාන්තය ජීව්‍යබවට;

(ඇ) එවැනි කර්මාන්තයක් ස්ථාපනය වීම අත්‍යාසන්න බවට; සහ

(ඈ) ප්‍රපාතනය කිරීමේ හෝ ප්‍රතිතෝලන සහනාධාරයේ බලපෑම හරහා, ප්‍රපාතනය කරන ලද හෝ සහනාධාර ලැබූ ආනයනවලින්, එවැනි කර්මාන්තයක් ස්ථාපනයවීම සම්බන්ධයෙන් දැඩි ලෙස බාධා සිදුවන බවට,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන තීරණයක් මත පදනම් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනත් කරුණු අතර, නව ආයෝජන ව්‍යාපෘති සඳහා හෝ දැනට පවත්නා යන්ත්‍රාගාර පුළුල් කිරීම අරමුණු කොටගෙන යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයන, ඉල්ලුම්

කරන ණය සහ ගිවිසුම් වැනි සාධක සහ එවැනි කර්මාන්තයක් ස්ථාපනය කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදුකර තිබේ ද යන්න, සැලකිල්ලට ගත යුතු ය.

රහස්‍ය තොරතුරු හෙළිදරව් නොකළ යුතු බව.

**80.** මේ පනත යටතේ පවත්වන ලද විමර්ශනයක් අතරතුර දී හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් ලබාගන්නා ලද, 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රහස්‍ය තොරතුරු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් තිබෙන තොරතුරු, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

අධිකරණමය සමාලෝචනය.

**81.** මේ පනත යටතේ යම් විමර්ශනයකට, සමාලෝචනයකට හෝ මුදල් ආපසු ගෙවීමේ කාර්යය පටිපාටියකට සහභාගි වූ යම් උනන්දුවක් දක්වන පාර්ශ්වයක් විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ එම කරුණු පිළිබඳ අධිකරණමය සමාලෝචනයක් ඉල්ලා සිටිය හැකි ය.

අන්තර් අමාත්‍යාංශ කමිටුවේ සංයුතිය.

**82.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා පිහිටුවනු ලබන අන්තර් අමාත්‍යාංශ කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) අන්තර් අමාත්‍යාංශ කමිටුවේ සභාපතිවරයා විය යුතු අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(ඇ) කර්මාන්ත සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(ඈ) අභ්‍යන්තර වෙළඳාම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(ඉ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(ඊ) විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්;

(උ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක්; සහ

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන තැනැත්තෙක්.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවේ ස්වභාවය සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් සාමාජිකයන් විමසා, සභාපතිවරයා විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවල දී, අන්තර් අමාත්‍යාංශ කමිටුවට තවත් සාමාජිකයන් දෙදෙනකුට නොවැඩි සංඛ්‍යාවක් තෝරා බඳවා ගනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා පැමිණ සිටී නම් අන්තර් අමාත්‍යාංශ කමිටුවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු අතර එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් අයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා නම් කරනු ලැබිය යුතු ය.

(4) අන්තර් අමාත්‍යාංශ කමිටුවේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූර්ණය හතර දෙනෙකු විය යුතු අතර, එහි රැස්වීම් පැවැත්වීම සහ එහි කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වූ කාර්යය පටිපාටිය අන්තර් අමාත්‍යාංශ කමිටුව විසින් විධිමත් කරගනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පැවරීම.

**83.** (1) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍යය සහ බලතල අතරින් යම් කර්තව්‍යයක් හෝ බලයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාණිජ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයට වඩා අඩු නොවන තනතුරක නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් කර්තව්‍යයක් හෝ බලයක් පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද, එම නිලධරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙනු ලැබිය හැකි විධානවලට යටත්ව එම කර්තව්‍යය හෝ බලතල ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් බලය පැවරීමක් නොතකා එසේ පවරන ලද යම් කර්තව්‍යයක් ඉටු කිරීමට හෝ බලයක් ක්‍රියාත්මක කිරීමට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අයිතිවාසිකම තිබිය යුතු ය.

නියෝග.

**84.** (1) නියෝග සෑදීමට මේ පනත මගින් නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය පවරා ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝග එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට අවලංගු විය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ, *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**85.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"ක්‍රියාමාර්ගයක් ගත හැකි සහනාධාරය" යන්නෙන් —

(අ) මේ පනතේ 66 වන වගන්තියේ අර්ථානුකූලව විශේෂිත වන්නා වූ ද;

(ආ) ප්‍රදානය කිරීම මගින් මේ පනතේ 67 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රතිලාභයක් ලැබෙන්නා වූ ද; සහ

(ඇ) මේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා නොමැති වූ ද;

සහනාධාරයක් අදහස් වේ;

"රට" යන්නට, රේගු සංගමයක් හෝ රේගු බල ප්‍රදේශයක් ඇතුළත් වේ;

"දෙපාර්තමේන්තුව" යන්නෙන්, වාණිජ දෙපාර්තමේන්තුව අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නට, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ එම යෙදුමට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"දේශීය සමාන නිෂ්පාදන" යන්නෙන්, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයට "සමාන නිෂ්පාදනයක්" වූ ද දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබුවා වූ ද නිෂ්පාදනයක් අදහස් වන අතර, ඊට යම් කෘෂිකාර්මික නිෂ්පාදනයක් හෝ පශුසම්පත් නිෂ්පාදනයක් ද ඇතුළත් වේ;

"ප්‍රපාතනය" යන්නෙන්, නිෂ්පාදනයක් සාමාන්‍ය මිලට වඩා අඩු මිලකට ශ්‍රී ලංකාවේ වෙළෙඳාමට හඳුන්වා දීම අදහස් වේ;

"ප්‍රපාතන ආන්තිකය" යන්නෙන්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව අපනයන මිල සහ සාමාන්‍ය මිල යන දෙක සංසන්දනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපනයන මිලෙහි ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන අපනයන මිල සහ සාමාන්‍ය මිල අතර ඇති වෙනස අදහස් වේ;

"හානිය" යන්න, අන්‍යාකාරයකට නිශ්චිතව දක්වනු ලැබුවහොත් මිස, ශ්‍රී ලාංකීය කර්මාන්තයකට සිදුවන දැඩි හානියක් හෝ ශ්‍රී ලාංකීය කර්මාන්තයකට දැඩි හානියක් සිදු වීම පිළිබඳ තර්ජනයක් හෝ, ශ්‍රී ලාංකීය කර්මාන්තයක් ස්ථාපනය වීම කෙරෙහි බලපාන දැඩි බාධාවක් අදහස් වේ;

"විමර්ශනයට භාජන වූ නිෂ්පාදනය" යන්නෙන්, විමර්ශනයක් ආරම්භ කරන බවට වූ දැන්වීමෙහි විස්තර කර ඇති පරිදි, ප්‍රපාතන විරෝධී විමර්ශනයකට භාජන වූ නිෂ්පාදනයක් හෝ සහනාධාර ලබා දෙන ලද ආනයන අදහස් වේ;

"සමාන නිෂ්පාදන" යන්නෙන්, සියලු අංශවලින් විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයට සමාන වූ නිෂ්පාදනයක් අදහස් වන අතර, එවැනි නිෂ්පාදනයක් නොමැති විට, විමර්ශනයට භාජන වී ඇති නිෂ්පාදනයට සියලු අංශවලින් සමාන නොවුව ද, එයට බොහෝ සෙයින් සමාන ගති ලක්ෂණ ඇත්තා වූ වෙනත් නිෂ්පාදනයක් ද, අදහස් වේ;

"සාමාජිකයා" යන්නෙන්, 1994 අප්‍රේල් මස 15 වන දින ඇතුළත් වූ "මාරාකේෂ්" ගිවිසුම මගින් පිහිටුවනු ලැබූ ලෝක වෙළෙඳ සංවිධානයේ සාමාජික රටක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, වෙළෙඳාම පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"ක්‍රියා මාර්ගයක් ගත නොහැකි සහනාධාරය" යන්නෙන්, මේ පනතේ 65 වන වගන්තියේ (2) වන උපවගන්තිය

යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි, ප්‍රතිතෝලන බද්දකට යටත් නොවන්නා වූ සහනාධාරයක් අදහස් වේ;

"උනන්දුවක් දක්වන පාර්ශ්වය" යන්නෙන් —

(i) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ අපනයනකරු හෝ විදේශීය නිෂ්පාදකයා;

(ii) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ ආනයනකරු;

(iii) විමර්ශනයට භාජන වූ නිෂ්පාදනයේ නිෂ්පාදකයන්, අපනයනකරුවන් හෝ ආනයනකරුවන් වැඩි පිරිසක් සාමාජිකයන් වශයෙන් සිටින වෙළෙඳ හෝ ව්‍යාපාර සංගම්;

(iv) අපනයන රටේ ආණ්ඩුව;

(v) ශ්‍රී ලංකාවේ දේශීය වශයෙන් සමාන නිෂ්පාදනයක් නිපදවන නිෂ්පාදකයා;

(vi) දේශීය වශයෙන් සමාන නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවේ නිපදවන සාමාජිකයන් බහුතරයක් සිටින වෙළෙඳ සහ ව්‍යාපාර සංගම්,

අදහස් වේ;

"තහනම් කළ සහනාධාරය" යන්නෙන් —

(අ) මේ පනතේ හතර වන උපලේඛනයේ නිශ්චිතව දක්වා තිබෙන කොන්දේසි ඇතුළුව නීතිමය හෝ සිද්ධිමය වශයෙන් තනිව හෝ වෙනත් කොන්දේසි කිහිපයක් අතර එක් කොන්දේසියක් වශයෙන්, අපනයන කාර්ය සාධනය කෙරෙහි සම්භාව්‍ය බැඳීමක් සහිත සහනාධාර (එම සහනාධාරය දීම සත්‍ය හෝ පූර්වාපේක්ෂිත අපනයන හෝ අපනයන ඉපයුම් සමග සත්‍ය වශයෙන් බැඳී

තිබෙන බව ඊට අදාළ සිද්ධිමය කරුණුවලින් නිරූපණය වන අවස්ථාවක) එම සහනාධාර;

(ආ) තනිව හෝ වෙනත් කොන්දේසි කිහිපයකින් එකක් ලෙස, ආනයන භාණ්ඩ වෙනුවට දේශීය භාණ්ඩ පරිභෝජනය මත සම්භාව්‍ය ලෙස රඳා පවත්නා සහනාධාර,

අදහස් වේ;

"තාවකාලික පියවර" යන්නෙන් -

(අ) මේ පනතේ I වන කොටසට අදාළව, තාවකාලික බද්දක් ගෙවීමට නියම කිරීම හෝ මූලික තීරණයේ දී සොයා ගන්නා ලද ඇස්තමේන්තුගත කළ ප්‍රපාතන ආන්තිකයේ ප්‍රමාණයට සමාන ඇපයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම; හෝ

(ආ) මේ පනතේ II වන කොටසට අදාළව, තාවකාලික බද්දක් ගෙවීමට හෝ මූලික තීරණයේ දී සොයා ගන්නා ලද ඇස්තමේන්තු කළ සහනාධාරයට සමාන වන ඇපයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම,

අදහස් වේ;

"ශ්‍රී ලාංකීය කර්මාන්තය" යන්නෙන්, දේශීය සමාන නිෂ්පාදනය හෝ නිෂ්පාදන නිපදවන සමස්ත දේශීය නිෂ්පාදකයන් හෝ එම නිෂ්පාදනයේ හෝ නිෂ්පාදනවල සමස්ත දේශීය නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් සංයුක්ත වන්නේ යම් නිෂ්පාදකයන්ගේ නිෂ්පාදනවලින් ද ඒ නිෂ්පාදකයන් අදහස් වේ. එහෙත් නිෂ්පාදකයන් අපනයනකරුවන්ට හෝ ආනයනකරුවන්ට සම්බන්ධතාවයක් ඇති විට හෝ නිෂ්පාදකයන් විසින්ම ප්‍රපාතනය කරන ලදැයි කියනු ලබන නිෂ්පාදනය නිපදවන විට ''ශ්‍රී ලාංකීය කර්මාන්තය'' යන යෙදුම නිෂ්පාදකයන්ගේ ඉතිරි කොටස පිළිබඳව කරන සඳහනක් ලෙස අර්ථ නිරූපණය කළ හැකි ය. මේ අර්ථ නිරූපණයේ කාර්ය සඳහා නිෂ්පාදකයන්,

ආනයනකරුවන් හෝ අපනයනකරුවන් සමග සම්බන්ධිත ලෙස සැලකිය යුත්තේ -

(i) ඔවුන් අතරින් එක් අයෙකු ඍජුවම හෝ වක්‍රව අනෙක් තැනැත්තා පාලනය කරනු ලබයි නම්;

(ii) ඔවුන් දෙදෙනා තුන්වන තැනැත්තකු විසින් ඍජුව හෝ වක්‍රව පාලනය කරනු ලබන්නේ නම්; හෝ

(iii) ඔවුන් එක්ව ඍජුව හෝ වක්‍රව තුන්වන තැනැත්තා පාලනය කරන්නේ නම්,

පමණක් වන අතර, එසේ වුවත් එම සම්බන්ධතාවයේ බලපෑම වන්නේ අදාළ නිෂ්පාදකයාට අසම්බන්ධිත නිෂ්පාදකයන්ට වඩා වෙනස්ව ක්‍රියා කිරීමට සැලැස්වීම බව විශ්වාස කිරීමට හෝ සැක කිරීමට හේතු තිබේ. මේ අර්ථ නිරූපණයේ කාර්ය සඳහා එක් තැනැත්තෙක් වෙනත් තැනැත්තකු පාලනය කරන ලෙස සැලකිය යුත්තේ පළමු කී තැනැත්තා දෙවනු කී තැනැත්තා කෙරෙහි වාරණයක් හෝ විධානයක් ක්‍රියාත්මක කිරීමට, නීතිමය වශයෙන් හෝ ක්‍රියාකාරී වශයෙන් හැකි  තත්ත්වයක සිටින විට ය; සහ

"සහනාධාරය" යන්නෙන්, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදනවලට අදාළව -

(අ) පහත දැක්වෙන දෑ ඇතුළත්ව, අපනයනය කරන රටේ රජය විසින් හෝ රාජ්‍ය ආයතනයක් විසින් කරන ලද මූල්‍ය ආධාරයක් -

(i) ඒ රජය විසින් හෝ රාජ්‍ය ආයතනය විසින් ප්‍රදාන, ණය, ව්‍යාපාර කොටස් ආදී වශයෙන් ඍජු අරමුදල් පැවරීමක්;

(ii) ඒ රජය හෝ රාජ්‍ය ආයතනය විසින් (ණය ඇපකරු ආදී වශයෙන්) විභව්‍ය ඍජු අරමුදල් හෝ බැරකම් පැවරීමක්;

(iii) ඒ රජයට හෝ රාජ්‍ය ආයතනයට අයවිය යුතු (බදු, ණය ආදී පිස්කල් දිරිදීමනා) අය කිරීමෙන් වැළකීමක් හෝ අය නොකිරීමක්;

(iv) සාමාන්‍ය යටිතල පහසුකම් සැපයීමේ වැඩපිළිවෙළක දී හැර, අන්‍යාකාරයකින් ඒ රජය හෝ රාජ්‍ය ආයතනය විසින් භාණ්ඩ හෝ සේවා සැපයීම;

(v) ඒ රජය හෝ රාජ්‍ය ආයතනය මගින් නිෂ්පාදන මිලදී ගැනීම; හෝ

(vi) අරමුදල් සැපයීමේ යාන්ත්‍රණයට ගෙවීම් කිරීම හෝ සාමාන්‍යයෙන් ආණ්ඩුව වෙත පැවරෙන, මෙහි ඉහත (i) සිට (iv) දක්වා වූ ඡේදවල සඳහන් කර්තව්‍ය එකක් හෝ වැඩි ගණනක් කිරීම පෞද්ගලික පුද්ගල මණ්ඩලයකට භාරදීම හෝ විධාන කිරීම; එම ක්‍රියා පිළිවෙත ආණ්ඩු විසින් සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙතට කිසි ආකාරයකින් වෙනස් නොවන පිළිවෙතක් වේ; හෝ

(ආ) 1994 තීරුබදු සහ වෙළඳාම් පිළිබඳ වූ පොදු ගිවිසුමේ XVI වන වගන්තියේ සඳහන් කරන ලද ආකාරයට, යම් රජයකින් හෝ රාජ්‍ය ආයතනයකින් ලැබුණු කිසියම් ආකාරයක ආදායමක් හෝ මිල අනුග්‍රාහකයක් සහ එමගින් ප්‍රදානය කරන ලද ප්‍රතිලාභයක් අදහස් වන නමුත්, සමාන නිෂ්පාදනයක් දේශීය පරිභෝජනය සඳහා නියම කරන ලද විට, කිසියම් අපනයන නිෂ්පාදනයක් තීරුගාස්තු සහ බදුවලින් නිදහස් කිරීමක දී හෝ එවැනි තීරු ගාස්තු සහ බදු ඒ මත උපචිත වී ඇති ප්‍රමාණය නොඉක්මවන පරිදි ඒ රජය විසින් ලිහිල් කිරීමක දී හැර, ඒ රජය විසින් ඒ සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද සහනාධාරයක්,

මේ අර්ථ නිරූපණයේ අර්ථානුකූලව "සහනාධාරයක්" ලෙස සලකනු නොලැබිය යුතු ය.

**86.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පළමුවන උපලේඛනය

[26 (1) වන වගන්තිය]

**පවත්නා තොරතුරු මත විශ්වාසය තැබීම**

1. විමර්ශනයක් ආරම්භ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, උනන්දුවක් දක්වන යම් පාර්ශ්වයක් විසින් සැපයිය යුතු තොරතුරු විස්තර සහිතව නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, එයට ප්‍රතිචාර දැක්වීමේ දී උනන්දුවක් දක්වන පාර්ශ්වය විසින් ඒ තොරතුරු ව්‍යුහාත්මකව දැක්විය යුතු ආකාරය ද, එසේම නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. තොරතුරු ලබාගැනීම සඳහා වූ ඉල්ලීමේ සඳහන් කරන ලද කාලසීමාව ඇතුළත තොරතුරු සපයනු නොලැබුවහොත්, විමර්ශනයක් ආරම්භ කරන ලෙසට ශ්‍රී ලාංකීය කර්මාන්තය විසින් කරන ලද ඉල්ලීමේ ඇතුළත් කරුණු ද ඇතුළුව, තමා වෙත තිබෙන කරුණු පදනම් කරගෙන තීරණයකට එළඹීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නිදහස තිබෙන බවට ඒ පාර්ශ්වය දැනුවත්ව සිටින බවට ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා වගබලාගත යුතු ය.

2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උනන්දුවක් දක්වන පාර්ශ්වයක ප්‍රතිචාරය විශේෂ මාධ්‍යයකින්, උදාහරණයක් ලෙස පරිගණක පටිගත කිරීම් හෝ පරිගණක භාෂාවකින් සපයන ලෙසට ඉල්ලා සිටිය හැකි ය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ විට කැමති මාධ්‍යයකින් හෝ පරිගණක භාෂාවකින් ප්‍රතිචාර දැක්වීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයට සාධාරණ හැකියාවක් තිබේද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිල්ලට ගත යුතු අතර, ව්‍යාපාර ආයතනය විසින් භාවිත කරන පරිගණක පද්ධති හැර වෙනත් පරිගණක පද්ධතියක් ඔවුන්ගේ ප්‍රතිචාරය දැක්වීම සඳහා භාවිත කරන මෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ආයතනයෙන් ඉල්ලා සිටිනු නොලැබිය හැකි ය. උනන්දුවක් දක්වන පාර්ශ්වය පරිගණකගත ගිණුම් පවත්වාගෙන නොයන්නේ නම් සහ ඉල්ලා සිටින පරිදි ප්‍රතිචාර දැක්වීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයට අසාධාරණ අමතර බරක් දැරීමට සිදුවන්නේ නම්, එනම් එයින් අසාධාරණ අමතර පිරිවැයක් දැරීමට සහ කරදරයක් විඳීමට සිදුවන්නේ නම්, පරිගණකගත ප්‍රතිචාරයක් දක්වන ලෙසට ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගෙන නොයා යුතු ය. යම් විශේෂිත මාධ්‍යයකින් හෝ පරිගණක භාෂාවකින් ප්‍රතිචාර දක්වන ලෙසට ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගෙන යාම, අදාළ උනන්දුවක් දක්වන පාර්ශ්වය එහි පරිගණකගත ගිණුම් එම විශේෂ මාධ්‍යයෙන් හෝ

පරිගණක භාෂාවෙන් පවත්වාගෙන නොයන්නේ නම් සහ ඉල්ලා සිටින ආකාරයට ප්‍රතිචාර දැක්වුවහොත් එය උනන්දුවක් දක්වන පාර්ශ්වයට අසාධාරණ අමතර බරක් වන්නේ නම්, එනම් එයින් නොසෑහෙන අමතර පිරිවැයක් දැරීමට සහ කරදරයක් විදීමට සිදුවන්නේ නම් නොකළ යුතු ය.

3. නිසි ආකාරයකින් ඉදිරිපත් කර තිබෙන බැවින් අනවශ්‍ය බාධකවලින් තොරව විමර්ශනයක දී භාවිත කරනු ලැබිය හැකි ලෙස උචිත ආකාරයට සපයා ඇත්තා වූ ද, නිසි කාලය තුළ සපයා ඇත්තා වූ ද, අදාළ අවස්ථාවන්හි දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා ඇති මාධ්‍යයකින් හෝ පරිගණක භාෂාවකින් සපයා ඇත්තා වූ සත්‍යායනය කළ හැකි සියලු තොරතුරු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණ ගැනීමේ දී සැලකිල්ලට ගනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා කැමති වූ මාධ්‍යයෙන් හෝ පරිගණක භාෂාවෙන් යම් පාර්ශ්වයක් ප්‍රතිචාර දක්වා නොමැති නමුත්, (2) වන ඡේදයේ දැක්වෙන අවස්ථාගත කරුණු සපුරා ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, මෙයින් විමර්ශනයට සැලකිය යුතු බාධකයක් වන ලෙස නොසැලකිය යුතු ය.

4. විශේෂිත මාධ්‍යයකින් (උදාහරණ ලෙස පරිගණක පටවලින්) තොරතුරු සපයා ඇත්නම් සහ ඒ තොරතුරු පිළියෙල කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකියාවක් නොමැති අවස්ථාවක, ඒ තොරතුරු ලිඛිත කරුණු ආකාරයෙන් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිළිගත හැකි වෙනත් යම් ආකාරයකින් සැපයිය යුතු ය.

5. සපයන ලද තොරතුරු සියලු ආකාරයෙන් උත්කෘෂ්ට නොවිය හැකි වුවත්, උනන්දුවක් දක්වන පාර්ශ්වය විසින් තොරතුරු සැපයීමේ දී ඔවුන්ගේ උපරිම හැකියාවෙන් ක්‍රියාකර ඇත්නම්, එම තොරතුරු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නොසලකා හැරීමට එය සාධාරණ හේතුවක් නොවිය යුතු ය.

6. සාක්ෂි හෝ තොරතුරු පිළිගත නොහැකි නම් එයට හේතු නොපමාව එම තොරතුරු සැපයූ පාර්ශ්වය වෙත දැනුම් දිය යුතු අතර, විමර්ශන කාලසීමාව යථා පරිදි සැලකිල්ලට ගෙන සාධාරණ කාලයක් තුළ වැඩිදුර පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් එම පාර්ශ්වයට ලබාදිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ පැහැදිලි කිරීම් සතුටුදායක නොවන බව සලකන්නේ නම් ඒ සාක්ෂි හෝ තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට බලපෑ හේතු පළකරනු ලබන නිගමනවල ගෙනහැර දැක්විය යුතු ය.

7. විමර්ශනයක් ආරම්භ කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු ඇතුළු ද්විතීයික මූලාශ්‍රයන්ගෙන් ලබාගත් තොරතුරු මත සාමාන්‍ය වටිනාකම පිළිබඳ තීරණ ඇතුළුව තම තීරණ පදනම් කර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට සිදුවී ඇත්නම්, විශේෂ සුපරීක්ෂාවකින් යුතුව එම තීරණවලට එළඹෙනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවලදී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනත් ස්වාධීන මූලාශ්‍රයන්ගෙන් ප්‍රයෝගිකව හැකි අවස්ථා වලදී ඔවුන් එම භාණ්ඩ අලෙවි කරන අවස්ථාවේ ඇති ප්‍රකාශිත මිල දර්ශන, නිල ආනයන සංඛ්‍යාලේඛන සහ රේගු වාර්තා යනාදී තොරතුරු සහ විමර්ශන කාලය තුළ දී වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් ලබාගත් තොරතුරු ද පරීක්ෂාකර බැලිය යුතු ය. කෙසේ වුවත්, උනන්දුවක් දක්වන පාර්ශ්වයක් සහයෝගීව ක්‍රියානොකරන්නේ නම් සහ ඒ අනුව අදාළ තොරතුරු බලධාරීන්ට ලබා නොදී සිටින්නේ නම්, මෙම තත්ත්වය එම පාර්ශ්වය සහයෝගීතාවයෙන් ක්‍රියා කළේ නම් ලබා ගත හැකිව තිබූ ප්‍රතිඵලයට වඩා අඩු වාසි සහගත ප්‍රතිඵලයකට තුඩු දිය හැකි ය.

දෙවන උපලේඛනය

[33 (3) වන වගන්තිය]

### 33 වන වගන්තියට අනුව එම ස්ථානයේම පවත්නා විමර්ශනයක් සඳහා වූ ක්‍රියාමාර්ගය

1. විමර්ශනයක් ආරම්භ කිරීමේ දී, එම ස්ථානයේම පවත්නා විමර්ශනයක් පවත්වාගෙන යාම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිප්‍රාය පිළිබඳව, අපනයන කරන රටේ බලධාරීන්ට සහ මේ හා සම්බන්ධතා පවතින බවට දැනගන්නට ඇති ව්‍යාපාර ආයතනවලට, ඔහු විසින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

2. විශේෂ අවස්ථානුගත අවස්ථාවලදී විමර්ශන කණ්ඩායමට රාජ්‍ය නොවන විද්වතුන් ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන්නේ නම්, ව්‍යාපාර ආයතනවලට සහ අපනයන කරන රටේ බලධාරීන්ට ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබිය යුතු ය. එවැනි රාජ්‍ය නොවන විද්වතුන්, මේ පනතේ 80 වන වගන්තියෙන් පනවන ලද රහස්‍යභාවය පිළිබඳ නියමයන් කඩකිරීම සඳහා වූ දණ්ඩනවලට යටත් විය යුතු ය.

3. සංචාරය අවසන් වශයෙන් නියම කිරීමට පෙරාතුව, අපනයනය කරන රටෙහි මේ හා අදාළ ව්‍යාපාර අයතනවල නිශ්චිත එකඟතාව ලබාගැනීම සම්මත ක්‍රියාමාර්ගය විය යුතු ය.

4. අදාළ ව්‍යාපාර ආයතනවලින් එකඟතාව ලබාගත් විගසම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සංචාරය කළ යුතු එම ව්‍යාපාර ආයතනවල නම් සහ ලිපින සහ ගිවිසගත් දින පිළිබඳව අපනයනය කරන රටේ බලධාරීන්ට නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සංචාරය කරනු ලැබීමට පෙරාතුව අදාළ ව්‍යාපාර ආයතනවලට ප්‍රමාණවත් පූර්ව දැනුම් දීමක් කළ යුතු ය.

6. අපනයනය කරන ව්‍යාපාර ආයතනයක ඉල්ලීමක් මත පමණක් ප්‍රශ්නාවලියක් ගැන කරුණු දැක්වීම සඳහා වූ සංචාරයක් කරනු ලැබිය යුතු ය. අදාළ රටේ රජයේ අනුයෝජිතයන්ට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දෙන්නේ නම් සහ සංචාරය කෙරෙහි ඔවුන්ගේ විරෝධතාවක් නොමැති නම් පමණක්, එවැනි සංචාරයක් සිදු කරනු ලැබිය හැකි ය.

7. එම ස්ථානයේම පවත්නා විමර්ශනයක් තිබීමේ මූලික අරමුණ, සපයන තොරතුරු සත්‍යායනය කරගැනීම හෝ වැඩිදුරටත් වූ තොරතුරු ලබාගැනීම වන බැවින් එවැනි විමර්ශනයක් පැවැත්විය යුත්තේ, ප්‍රශ්නාවලියට ප්‍රතිචාර ලැබීමෙන් පසුව සහ ඊට වෙනස් දෙයකට ව්‍යාපාර ආයතනය එකඟ වන්නේ නම් මිස, බලාපොරොත්තු වන සංචාරය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අපනයන රටේ රජයට දැනුම් දීමෙන් අනතුරුව, එම සංචාරය සඳහා එම රජයෙන් විරෝධතාවක් නොමැති විටකදී පමණි. තවදුරටත්, සත්‍යායනය කළ යුතු තොරතුරුවල සාමාන්‍ය ස්වභාවය සම්බන්ධයෙන් සහ ඉදිරිපත් කරනු ලැබීමට අවශ්‍ය වැඩිදුරටත් වූ යම් තොරතුරු සම්බන්ධයෙන් අදාළ ආයතනවලට සංචාරයට පෙරාතුව උපදෙස් දීම සම්මත ප්‍රතිපත්තිය විය යුතු ය. එහෙත් ලැබී ඇති තොරතුරු මත, වැඩිදුර වූ තොරතුරු සඳහා එම ස්ථානයේදී ම ඉල්ලීම් කිරීම මෙයින් වළක්වනු නොලැබිය යුතු ය.

8. අපනයන කරන රටවල බලධාරීන් හෝ ව්‍යාපාර ආයතන විසින් ඉදිරිපත් කරන සහ එම ස්ථානයේම පවත්වන සාර්ථක විමර්ශනයකට අත්‍යාවශ්‍ය විමසීම් හෝ ප්‍රශ්නවලට, හැකි සෑම විටම සංචාරය ඇරඹීමට පෙරාතුව පිළිතුරු සපයනු ලැබිය යුතු ය.

තුන්වන උපලේඛනය

[65 (2) (ආ) වගන්තිය]

**ක්‍රියාමාර්ගයක් ගත නොහැකි සහනාධාර**

1. (අ) කාර්මික පර්යේෂණ පිරිවැයෙන් සියයට හැත්තෑපහකට නොවැඩි ප්‍රමාණයක් හෝ පූර්ව තරගකාරී සංවර්ධන කටයුතුවල පිරිවැයෙන් සියයට පණහකට නොවැඩි ප්‍රමාණයක් ආධාරවලින් ආවරණය වන අවස්ථාවක දී, සහ

(ආ) එම ආධාරය -

(i) තනිකරම පර්යේෂණ කටයුතු සඳහා පමණක් සේවයේ නියුක්ත කරන පර්යේෂකයන්ගේ, තාක්ෂණඥයන්ගේ සහ වෙනත් උපකාරක කාර්ය මණ්ඩලයේ පිරිවැය;

(ii) වාණිජ පදනමක් මත නිකුත් කරනු නොලැබුවා වූ ද, තනිකරම සහ ස්ථිරවම පර්යේෂණ කටයුතු සඳහා භාවිත කළ මෙවලම්වල, උපකරණවල, ඉඩම්වල සහ ගොඩනැගිලිවල පිරිවැය;

(iii) පර්යේෂණයන් සඳහා වූ මිල, තාක්ෂණික දැනුම, පේටන්ට් බලපත්‍ර යනාදිය ඇතුළුව තනිකරම පර්යේෂණ කටයුතු සඳහා භාවිත කළ උපදේශන සහ ඒ හා සමාන සේවාවල පිරිවැය;

(iv) පර්යේෂණ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස සෘජුව දරන ලද අමතර පොදු කාර්ය පිරිවැය;

(v) පර්යේෂණ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස සෘජුව දරන ලද අමුද්‍රව්‍ය, සැපයුම් සහ වෙනත් පුනරාවර්තන වියදම,

ආවරණය කිරීමට පමණක් සීමා වන අවස්ථාවක දී, සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන යම් පුද්ගල මණ්ඩලයක් විසින් හෝ එවැනි පුද්ගල මණ්ඩලයක් සමග ඇතිකරගත් ගිවිසුම් පදනමක් මත, කිසියම් උසස් අධ්‍යාපන හෝ පර්යේෂණ ආයතනයක් විසින් පවත්වන ලද පර්යේෂණ කටයුතු සඳහා ලබා දෙන සහාය;

2. සාමාජිකයකුගේ දේශභූමිය තුළ ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් වූ පොදු වැඩ රාමුවකට අනුකූලව දෙන ලද සහ (66 වන වගන්තියේ අර්ථානුකූලව) විශේෂිත නොවන සුදුසුකම් ලත් ප්‍රදේශ ඇතුළත වූ අවාසිදායක ප්‍රදේශවලට දෙන ලද ආධාර, එසේ වුව ද -

(අ) එක් එක් අවාසිදායක වූ කලාපය නිශ්චිත ආර්ථික සහ පරිපාලන අනන්‍යතාවක් ඇති, පැහැදිලිව නම් කරන ලද යාබද භූගෝලීය ප්‍රදේශ විය යුතු ය;

(ආ) ඒ කලාපය තාවකාලික තත්ත්වයක් ඉක්මවා පැන නැගුණු කලාපීය අපහසුකම් නිරූපණය වන, අපක්ෂපාතී සහ විෂය මූලික නිර්ණායක පදනම් කරගෙන අවාසිදායක කලාපයක් ලෙස සැලකිය යුතු ය. එම නිර්ණායක සත්‍යායනය කිරීමට හැකිවන පරිදි නීතියෙහි, නියෝගවල හෝ වෙනත් නිල ලේඛනවල පැහැදලිව විස්තර කරනු ලැබිය යුතු ය;

(ඇ) එම නිර්ණායකයට අවම වශයෙන් පහත දැක්වෙන සාධකවලින් එකක් හෝ මත පදනම් වූ ආර්ථික සංවර්ධන මිනුම් දණ්ඩක් ඇතුළත් විය යුතු යː-

(i) ඒකපුද්ගල ආදායම හෝ ඒකපුද්ගල කුටුම්බ ආදායම යන දෙකෙන් එකක් හෝ අදාළ රට සඳහා සාමාන්‍ය ප්‍රමාණයෙන් සියයට අසූපහකට නොවැඩි විය යුතු ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදනය;

(ii) අදාළ රට සඳහා වූ සාමාන්‍ය ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට එකසිය දහයක් විය යුතු විරැකියා අනුපාතය; (එය අවුරුදු තුනක කාලයක් තුළ කළ ගණනයක් විය යුතු ය. කෙසේ වුවද, එවැනි ගණනයක් සංයුක්ත ගණනයක් විය හැකි අතර, වෙනත් සාධක ද ඊට ඇතුළත් කරනු ලැබිය හැකිය.)

3. ව්‍යාපාර ආයතනවලට ඉමහත් අවරෝධයකට සහ මූල්‍ය අපහසුතාවයන්ට ලක් වීමට සිදුවන ආකාරයට, කිසියම් නීතියක් හෝ නියෝග මගින් පනවන ලද, නව පාරිසරික නියමයන්ට අනුව පවතින පහසුකම් සුදුසු ආකාරයකට සකස් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ලබා දෙන ආධාර; එසේ වුව ද, එම ආධාර -

(අ) නැවත නැවතත් ලබා නොදෙන එක් වරක් පමණක් ලබා දෙන ආධාර වේ;

(ආ) ගැලපීම සම්බන්ධයෙන් වූ පිරිවැයෙන් සියයට විස්සකට සීමා වේ;

(ඇ) ව්‍යාපාර ආයතනය විසින් සම්පූර්ණ වශයෙන් දරනු ලැබිය යුතු වන්නා වූ, ආධාර කරන ලද ආයෝජනය ප්‍රතිසැකසීමේදී හා ක්‍රියාත්මක කිරීමේ දී දරන වියදම් ආවරණය නොකෙරේ;

(ඈ) පීඩා සහ දූෂණය අවම කිරීම පිළිබඳ ආයතනයේ සැලසුමට සෘජුවම සම්බන්ධ වූ ද, ඊට ප්‍රමාණානුකූල වූ ද, සහනාධාරයක් වන අතර එය කිසියම් නිෂ්පාදන පිරිවැය පිරිමැස්මක් ආවරණය කරනු නොලබයි; සහ

(ඉ) නව උපකරණ සහ/හෝ නිෂ්පාදන ක්‍රියාවලි යොදා ගත හැකි සියලුම ආයතනවලට ලබා ගත හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් , සහනාධාර සහ ප්‍රතිතෝලන පියවර පිළිබඳ වූ ගිවිසුම මත, මේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද ක්‍රියාමාර්ගයක් ගත නොහැකි සහනාධාර පිළිබඳ කිසියම් සත්‍යායනයක් කිරීම සඳහා ලෝක වෙළඳ සංවිධානයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, ක්‍රියාමාර්ගයක් ගත නොහැකි සහනාධාර හඳුනාගැනීමේ දී, වෙනත් දේ අතර, ලෝක වෙළඳ සංවිධානයේ "සහනාධාර සහ ප්‍රතිතෝලන පියවර පිළිබඳ කමිටුව" විසින් කරන ලද සුළු වෙනස්කම් ද සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

හතරවන උපලේඛනය

[85 වන වගන්තිය]

**තහනම් කළ සහනාධාර**

1. අපනයන සහනාධාර සම්බන්ධයෙන් විස්තර දක්වන ලැයිස්තුව-

(අ) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයකට හෝ කර්මාන්තයකට අපනයන ඉටුකිරීම් මත රඳාපවතිමින් ආණ්ඩු විසින් සෘජුව සහනාධාර සැලසීම;

(ආ) අපනයන මත ප්‍රසාද මුදලක් අදාළ වන ව්‍යවහාර මුදල් රඳවාගැනීමේ ක්‍රම හෝ යම් සමාන පරිචයන්;

(ඇ) දේශීය නැව්ගත කිරීම් සඳහා වූ නියමයන්ට වඩා වාසිදායක වූ නියමයන් මත ආණ්ඩු විසින් සපයනු ලැබූ හෝ බලය දෙනු ලැබූ අපනයන නැව්ගත කිරීම මත අභ්‍යන්තර ප්‍රවාහන සහ ගැල් කුලී;

(ඈ) භාණ්ඩ සම්බන්ධයෙන් යම් නියමයන් හෝ කොන්දේසි, ඒවායේ අපනයනකරුවන්ට ලෝකයේ වෙළෙඳපොලවල දී වාණිජ වශයෙන් ලබා ගත හැකි නියමයන්ට හෝ කොන්දේසිවලට වඩා වාසිදායක වේ නම්, දේශීය පරිභෝජනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි දී භාවිත කිරීම සඳහා සමාන හෝ සෘජුවම කරගකාරී නිෂ්පාදන හෝ සේවා සැපයීමට වඩා වාසිදායක නියමයන් හෝ කොන්දේසි මත අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙහි දී භාවිතා කිරීම සඳහා අපනයනය කළ හෝ දේශීය භාණ්ඩ හෝ සේවාවන් ආණ්ඩු විසින් හෝ ඔවුන්ගේ නියෝජිත ආයතන මගින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ආණ්ඩුවේ බලය දෙනු ලැබූ ක්‍රම මගින් හෝ සැලසීම;

(ඉ) කාර්මික හෝ වාණිජ ව්‍යවසායන් විසින් ගෙවනු ලබන හෝ ගෙවිය යුතු නිශ්චිත වශයෙන්ම අපනයනවලට අදාළ සෘජු බදු හෝ සමාජ සුභසාධන ගාස්තු සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම;

(ඊ) සෘජු බදු අයකිරීමේ පදනම ගණනය කිරීමේ දී දේශීය පරිභෝජනය සඳහා නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලබන දීමනා හෝ විශේෂ අඩුකිරීම් ඉක්ම වූ හෝ ඊට වැඩියෙන් වූ, අපනයනවලට හෝ අපනයන ඉටුකිරීම්වලට කෙළින්ම අදාළ දීමනා හෝ විශේෂ අඩුකිරීම්;

(උ) දේශීය පරිභෝජනය සඳහා නිෂ්පාදන විකුණනු ලැබූ විට, සමාන නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් පනවනු ලබන්නා වූ බදු ඉක්මවන අපනයනය කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් වූ වක්‍ර බදු නිදහස් කිරීම හෝ එය අඩු කිරීම;

(ඌ) දේශීය පරිභෝජනය සඳහා විකුණනු ලැබූ විට, සමාන නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී භාවිත කරනු ලබන භාණ්ඩ හෝ සේවා මත සමාන පූර්ව අදියර සමුච්චිත වක්‍ර බදු නිදහස් කිරීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම ඉක්මවා අපනයනය කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී භාවිත කරනු ලබන භාණ්ඩ හෝ සේවා මත පූර්ව අදියර සමුච්චිත වක්‍ර බදු නිදහස් කිරීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම:

එසේ වුව ද, අපනයන කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී (අපතේ යාම සඳහා සාමාන්‍ය ඉඩ දීමෙන් පසු) පරිභෝජනය කරනු ලබන යෙදවුම් මත පූර්ව අදියර වක්‍ර බදු පනවනු ලැබුවේ නම්, දේශීය පරිභෝජනය සඳහා විකුණනු ලැබූ විට සමාන නිෂ්පාදන මත පූර්ව අදියර සමුච්චිත වක්‍ර බදු නිදහස් කරනු නොලැබූ විට, අඩුකරනු නොලැබූ විට හෝ විලම්භනය කරනු නොලැබූ විට පවා අපනයනය කළ නිෂ්පාදන මත පූර්ව අදියර සමුච්චිත වක්‍ර බදු නිදහස් කිරීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම හෝ කරනු ලැබිය හැකි ය. මේ ඡේදයේ විධිවිධාන, මෙම උපලේඛනයේ 2 වන අයිතමයෙහි සඳහන් "නිෂ්පාදන ක්‍රියාවලියෙහි යෙදවුම් පරිභෝජනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශවලට" අනුකූලව අර්ථ නිරූපණය කළ යුතු ය;

(එ) අපනයනය කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී (අපතේ යාම සඳහා සාමාන්‍ය ඉඩ දීමෙන් පසු) පරිභෝජනය කරනු ලබන ආනයනය කළ යෙදවුම් මත පනවනු ලැබූ ආනයන ගාස්තු ඉක්මවා අය කරන ලද ආනයන ගාස්තු ආපසු ගැනීම අඩුකිරීම:

එසේ වුව ද, ආනයන සහ අනුරූප අපනයන ක්‍රියාකාරකම් යන දෙකම අවුරුදු දෙකක් නොඉක්මවන සාධාරණ කාලසීමාවක් ඇතුළත සිදුවන්නේ නම්, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් විසින්, මේ විධිවිධානයෙන් ප්‍රතිලාභ ලැබීම සඳහා, ආදේශිතයක් වශයෙන් ආනයනය කළ යෙදවුම්වල ගුණාත්මකභාවය සහ ලක්ෂණ ඇත්තා වූ දේශීය වෙළඳපොළෙහි ඇති සමාන යෙදවුම් ප්‍රමාණයක් යම් විශේෂ අවස්ථාවල දී භාවිත කළ හැකි ය. මේ ඡේදයේ විධිවිධාන, මේ උපලේඛනයේ 2 වන අයිතමයෙහි නිශ්චිතව සඳහන් කර ඇති "නිෂ්පාදන ක්‍රියාවලියෙහි යෙදවුම් පරිභෝජනය කිරීමේ මාර්ගෝපදේශ" සහ මේ උපලේඛනයේ 3 වන අයිතමයෙහි නිශ්චිතව දක්වා ඇති "අපනයන සහනාධාර වශයෙන් ආපසු ගෙවීමේ පද්ධති ආදේශ කිරීම තීරණය කිරීමේ මාර්ගෝපදේශවලට" අනුකූලව අර්ථ නිරූපණය කළ යුතු ය;

(ඒ) ආණ්ඩු විසින් (හෝ ආණ්ඩු විසින් පාලනය කරනු ලබන විශේෂ ආයතන විසින්), අපනයනය කළ නිෂ්පාදනවල පිරිවැය වැඩිවීමට ප්‍රතිපක්ෂ රක්ෂණ හෝ සහතික වැඩසටහන් හෝ විනිමය අවදානම්

වැඩ සටහන්වල දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කිරීමේ පිරිවැය සහ පාඩු ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන වාරික මත අපනයන ණය සහතික හෝ රක්ෂණ වැඩසටහන් සැපයීම;

(ඔ) අපනයනකරුවන් විසින් එලෙස යොදවනු ලැබූ අරමුදල් වෙනුවෙන් ඔවුන්ට සැබැවින්ම ගෙවීමට සිදුවන හෝ (සමාන කල්පිරීමක් ඇති සහ සමාන ණය නියම ඇති සහ අපනයන ණය වශයෙන් නම් කරන ලද සමාන ව්‍යවහාර මුදලින් අරමුදල් ලබාගැනීම පිණිස ඔවුන් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් ණයට ගනු ලැබුවේ නම්, ගෙවීමට ඔවුන්ට සැබවින්ම සිදුවන අනුප්‍රමාණයන්ට අඩුවෙන්) ආණ්ඩු විසින් (හෝ ආණ්ඩු විසින් පාලනය කරනු ලබන සහ/හෝ ආණ්ඩුවල බලය යටතේ ක්‍රියාකරන විශේෂ ආයතන විසින් හෝ) අපනයන ණය ප්‍රදානය කිරීම හෝ අපනයනය ණය නියමයන් සම්බන්ධයෙන් වූ ක්ෂේත්‍රයෙහි වැදගත් වාසියක් අත්කර ගැනීමට අපනයනකරුවන් සහ මූල්‍ය ආයතන පුරුදුව ඇතිතාක් දුරට ණය ලබාගැනීමේ දී අපනයනකරුවන් හෝ මූල්‍ය ආයතන විසින් දරන ලද පිරිවැය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ගෙවීම:

එසේ වුව ද, 1979 ජනවාරි මස 01 වන දිනයෙහි සහනාධාර සහ ප්‍රතිතෝලන පියවර පිළිබඳ ලෝක වෙළෙඳ සංවිධානයේ සම්මුතියට යටත් පිරිසෙයින් මුල් සාමාජිකයන් දොළොස්දෙනකු පාර්ශ්වකරුවන් වන්නා වූ නිල අපනයන බැර පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපාරයක (හෝ එම මුල් සාමාජිකයන් විසින් සම්මත කරනු ලැබූ අනුප්‍රාප්තික ව්‍යාපාරයක) සාමාජිකයකු පාර්ශ්වකරුවකු වන්නේ නම් හෝ පරිචය අනුව සාමාජිකයකු අදාළ ව්‍යාපාරයේ පොළී අනුප්‍රමාණ විධිවිධාන ඉල්ලුම් කරන්නේ නම්, එම විධිවිධාන සමග සැසඳෙන්නා වූ අපනයන ණය පරිචයක් "සහනාධාර සහ ප්‍රතිතෝලන පියවර පිළිබඳ ලෝක වෙළෙඳ සංවිධානයේ සම්මුතියෙන්" තහනම් කරනු ලැබූ සහනාධාරයක් ලෙස සලකනු නොලැබිය යුතු ය;

(ඕ) 1994 ගැට් ගිවිසුමේ XVI වන වගන්තියේ අදහස අනුව අපනයන සහනාධාරයක් සංයුක්ත වන රජයේ ගිණුම් මත වෙනත් යම් වැය බරක්.

2. නිෂ්පාදන කාර්යාවලියෙහි යෙදවුම් පරිභෝජනය පිළිබඳ මාර්ගෝපදේශ -

(1) අපනයන කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී (අපතේ යාම සඳහා සාමාන්‍ය ඉඩ සැලසීමෙන් පසු) පරිභෝජනය කරනු ලබන්නා වූ යෙදවුම් මත පනවනු ලබන පූර්ව අදියර සමුච්චිත වක්‍ර බදු නිදහස් කිරීම, අඩු කිරීම හෝ විලම්භනය කිරීම සඳහා වක්‍ර බදු ප්‍රතිදාන ක්‍රමවලින් ඉඩදෙනු ලැබිය හැකි ය.

(2) ඒ සමානව ම අපනයන නිෂ්පාදනය කිරීමේ දී (අපතේ යාම සඳහා සාමාන්‍ය ඉඩ සැලසීමෙන් පසුව) පරිභෝජනය කරනු ලබන්නා වූ යෙදවුම් මත පනවනු ලබන ආනයන ගාස්තු අඩුකිරීම හෝ ආපසු ගෙවීම සඳහා ආපසු ගෙවීමේ ක්‍රම මගින් ඉඩ දෙනු ලැබිය හැකි ය.

(3) මේ උපලේඛනයේ 1 වන අයිතමයෙහි නිශ්චිතව සඳහන් අපනයන සහනාධාර සම්බන්ධයෙන් විස්තර දැක්වෙන ලැයිස්තුවෙහි (ඌ) සහ (ඵ)

ඡේදවල "අපනයන නිෂ්පාදන නිෂ්පාදනයේ දී පරිභෝජනය කරනු ලබන යෙදවුම්" යන යෙදුම සඳහන් වේ. (ඌ) ඡේදය අනුව "අපනයන නිෂ්පාදනය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන යෙදවුම්" මත සැබවින්ම අයකරනු ලබන යම් බදුවල මුදල් ප්‍රමාණය ඉක්මවන පූර්ව අදියර සමුච්චිත වක්‍ර බදු නිදහස් කිරීම, අඩු කිරීම හෝ විලම්භනය කිරීම ප්‍රතිඵලය වන ප්‍රමාණයට අපනයන සහනාධාරයක් වක්‍ර බදු ප්‍රතිදාන ක්‍රමයකින් ඇතිකරනු ලැබිය හැකි ය. (එ) ඡේදය අනුව අපනයන නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන යෙදවුම් මත සැබවින්ම අයකරනු ලබන ආනයන ගාස්තු ඉක්මවන ආනයන ගාස්තු අඩුකිරීමක හෝ ආපසු ගැනීමක ප්‍රතිඵලය වන ප්‍රමාණයට අපනයන සහනාධාරයක් ආපසු ගැනීමේ ක්‍රමයකින් ඇතිකරනු ලැබිය හැකි ය. අපනයන නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී යෙදවුම් පරිභෝජනය කිරීම සම්බන්ධයෙන් වූ තීරණවල දී අපතේ යාම සඳහා සාමාන්‍ය ඉඩ දීමක් කළ යුතු බවට ඡේද දෙකෙහිම නියම කොට ඇත. උචිත අවස්ථාවල දී ආදේශ කිරීම සඳහා විධිවිධාන ද (එ) ඡේදයෙන් සලස්වයි.

(4) මේ පනතේ II වන කොටස යටතේ පවත්වනු ලබන ප්‍රතිතෝලන බදු විමර්ශනයක කොටසක් වශයෙන් අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී යෙදවුම් පරිභෝජනය කරනු ලබන්නේ දැයි පරීක්ෂා කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන පදනම මත කටයුතු කළ යුතු යඃ

(අ) අපනයන නිෂ්පාදන නිෂ්පාදනය කිරිමේ දී පරිභෝජනය කළ යෙදවුම් මත වක්‍ර බදු හෝ ආනයන ගාස්තු ප්‍රමාණය ඉක්ම වූ ප්‍රතිදානයක් හෝ ප්‍රමාණය ඉක්මවා ආපසු ගැනීමක් හේතුවෙන්, වක්‍ර බදු ප්‍රතිදාන ක්‍රමයකින් හෝ ආපසු ගැනීමේ ක්‍රමයකින් සහනාධාරයක් පවත්වා ගෙන යන බව කියනු ලබන අවස්ථාවක, අපනයන නිෂ්පාදන නිෂ්පාදනය කීරීමේ දී කිනම් යෙදවුම් පරිභෝජනය කරනු ලබන්නේ ද සහ ඒ කුමන ප්‍රමාණයකින් දැයි ස්ථිර කිරීමට ක්‍රමයක් හෝ කාර්ය පටිපාටියක් අපනයනය කරන සාමාජිකයාගේ ආණ්ඩුවට ඇත්තේ ද සහ එය අදාළ කර ගන්නේ ද යන කාරණය අධ්‍යක්ෂ ජනරාල්වරයා පළමුවෙන් තීරණය කළ යුතු ය. එවැනි ක්‍රමයක් හෝ කාර්ය පටිපාටියක් අදාළ විය යුතු බවට තීරණය කරනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවිට, අදහස් කරනු ලැබු කාර්යය සඳහා ඒ ක්‍රමය හෝ කාර්ය පටිපාටිය සාධාරණ වන්නේ ද, ඵලදායි වන්නේ ද සහ අපනයනය කරන රටෙහි සාමාන්‍යයෙන් පිළිගත් වාණිජ පරිචයන් මත පදනම් කරගනු ලැබුවක් දැයි සොයා බැලීම පිණිස පරීක්ෂා කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනතේ 33 වන වගන්තියට අනුකූලව තොරතුරු සත්‍යායනය කිරීම පිණිස හෝ ක්‍රමය හෝ කාර්ය පටිපාටිය ඵලදායී අයුරින් ආදාළ කරන බවට තමා සෑහීමට පත්වනු පිණිස ඇතැම් ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ආ) එවැනි යම් ක්‍රමයක් හෝ කාර්ය පටිපාටියක් නොමැති අවස්ථාවක, එය සාධාරණ නොවන අවස්ථාවක, හෝ එය ආරම්භ කරනු ලැබ සාධාරණ යයි සලකනු ලබන්නා වූ එහෙත් එය අදාළ කර ගනු නොලබන හෝ ඵලදායී ලෙස අදාළ කරගනු නොලබන බව අනාවරණය වූ අවස්ථාවක, අතිරේක ගෙවීමක් සිදුකොට තිබේ දැයි තීරණය කිරීමේ සන්දර්භය අනුව අපනයනය කරන සමාජිකයා විසින් අදාළ වූ සැබෑ යෙදවුම් මත වැඩිදුර පරීක්ෂණයක් ක්‍රියාත්මක

කරනු ලැබීමට අවශ්‍ය වන්නේ ය. වැඩිදුර පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම් එය (අ) ඡේදයට අනුකූලව කරගෙන යා හැකි ය;

(ඈ) යම් යෙදවුම් නිෂ්පාදන ක්‍රියාවලියෙහි භාවිත කරනු ලබන්නේ නම් සහ අපනයනය කළ නිෂ්පාදනයෙහි භෞතික වශයෙන් අන්තර්ගතව ඇත්නම්,එම යෙදවුම් භෞතික වශයෙන් සංයුක්ත කොට ඇති ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සැලකිය යුතු ය. යෙදවුමක් නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් කරනු ලැබූ ආකාරයෙන් ම අවසානාත්මක නිෂ්පාදනයෙහි තිබීම අවශ්‍ය නොවන බව සාමාජිකයන් විසින් සටහන් කරගත යුතු ය;

(ඈ) අපනයන නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන යම් විශේෂ යෙදවුමක ප්‍රමාණය තීරණය කිරීමේ දී, "අපතේ යාම සඳහා වූ සාමාන්‍ය ඉඩදීමක්" ගණන් ගත යුතු අතර, ඒ අපතේ යාම අපනයන නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ දී පරිභෝජනය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. "අපතේ යාම" යන යෙදුම නිෂ්පාදන කාර්යාවලියෙහි ස්වාධීන කර්තව්‍යයක් ඉටු නොකරන ලද යම් යෙදවුමක (අකාර්යක්ෂමතා වැනි හේතු නිසා) අපනයනය කරන ලද, භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී පරිභෝජනය නොකරන ලද සහ නිෂ්පාදකයා විසින් ම ආපසු අයකර ගැනීමක්, භාවිත කිරීමක් හෝ විකිණීමක් නොකරන ලද යෙදවුම්වල කොටසක් සඳහා යෙදේ;

(ඉ) අපතේ යාම සඳහා හිමිකම් පා ඇති ඉඩදීම "සාමාන්‍ය" දැයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කිරීමේ දී නිෂ්පාදන කාර්යාවලිය, අපනයනය කරන රටෙහි කර්මාන්ත සම්බන්ධයෙන් ඇති සාමාන්‍ය පළපුරුද්ද සහ උචිත පරිදි, වෙනත් කාර්මික සාධක සැලකිල්ලට ගත යුතු ය. එතරම් මුදල් ප්‍රමාණයක් බද්දෙහි හෝ තීරුබද්දෙහි, ප්‍රතිදානයෙහි හෝ අඩු කිරීමෙහි ඇතුළත් කරනු ලැබීමට අදහස් කර ඇති විට, අපනයන සාමාජික රටෙහි බලධරයන් විසින් අපතේ යාමේ ප්‍රමාණය සාධාරණ ලෙස ගණනය කරනු ලැබ ඇත්තේ ද යන්න වැදගත් ප්‍රශ්නයක් බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම සිතෙහි තබා ගත යුතු ය.

3. අපනයන සහනාධාර වශයෙන් ගෙවීමේ පද්ධති ආදේශ කිරීම තීරණය කිරීමේ මාර්ගෝපදේශ:

(1) වෙනත් නිෂ්පාදනයක නිෂ්පාදන ක්‍රියාවලියේ දී පරිභෝජනය කරන්නා වූ යෙදවුම් මත සහ මින් පසුව සඳහන් නිෂ්පාදනය අපනයනය තුළ ආනයනය කරනු ලැබූ යෙදවුම් වෙනුවට එම ගුණාත්මක භාවය සහ ලක්ෂණ ඇත්තා වූ දේශීය යෙදවුම් අඩංගු වන්නා වූ අවස්ථාවක, ආනයන වියදම ආපසු දීමක් හෝ ආපසු ගැනීමක් සඳහා ආපසු ගැනීමේ ක්‍රම මගින් ඉඩදෙනු ලැබිය හැකි ය. මේ උපලේඛනයේ සඳහන් අපනයන සහනාධාර සම්බන්ධයෙන් වූ විස්තරාත්මක ලැයිස්තුවෙහි (ඵ) ඡේදය අනුව, ආපසු ගැනීම සඳහා හිමිකම් පානු ලබන්නා වූ ආනයන යෙදවුම් මත මූලික වශයෙන් අයකරනු ලැබූ ආනයන ගාස්තු සම්බන්ධයෙන් ආපසු ගැනීමේ අතිරික්තයක ප්‍රතිඵලය ඇතිවන ප්‍රමාණයට අපනයන සහනාධාරයක් ආදේශිත ආපසු ගැනීමේ ක්‍රමයකින් ඇති කළ හැකි ය.

(2) මේ පනතේ II වන කොටස යටතේ පවත්වනු ලබන ප්‍රතිතෝලන බදු විමර්ශනයක කොටසක් වශයෙන් යම් ආදේශිත ආපසු ගැනීමේ ක්‍රමයක් පරීක්ෂා කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන පදනම මත කටයුතු කළ යුතු යː-

(අ) උපලේඛනයේ නිශ්චිතව සඳහන් අපනයන සහනාධාර පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුවෙහි (එ) ඡේදයෙන්, අපනයනය සඳහා නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීමේ දී ආනයනය කළ යෙදවුම් වෙනුවට දේශීය වෙළඳපළෙහි යෙදවුම් ආදේශ කරනු ලැබිය හැකි බව නියම කරයි. එසේ වුව ද ඒ යෙදවුම් ආදේශ කරනු ලබන්නා වූ ආනයනය කළ යෙදවුම්වලට ප්‍රමාණයෙන් සමාන විය යුතු අතර ගුණාත්මක භාවයෙන් සහ ලක්ෂණවලින් සමාන විය යුතු ය. ආපසු ගෙවීම සඳහා හිමිකම් පානු ලබන්නේ යම් යෙදවුම් ප්‍රමාණයක් සඳහා ද, ඒ යෙදවුම් ප්‍රමාණය කවර වූ ආකාරයකින් හෝ අපනයනය කළ සමාන නිෂ්පාදන ප්‍රමාණය නොඉක්මවන බව සහ ප්‍රශ්නගත ආනයන කළ යෙදවුම් මත මුලින් අයකරනු ලැබූ ආනයන ගාස්තු ඉක්ම වූ ආපසු ගැනීමක් නොමැති බව අපනයන කරන රටේ ආණ්ඩුවට සහතික කිරීමට සහ පෙන්නුම් කිරිමට හැකියාව ලැබෙන නිසා සත්‍යායනය කිරීමේ ක්‍රමයක් හෝ කාර්ය පටිපාටියක් තිබීම වැදගත් ය;

(ආ) ආදේශිත ආපසු ගැනීමේ ක්‍රමයකින් සහනාධාරයක් දක්වන්නේ යයි කියනු ලබන අවස්ථාවක, අපනයනය කරන සාමාජිකයාගේ ආණ්ඩුවට සත්‍යායනය කිරීමේ කාර්ය පටිපාටියක් තිබෙන්නේ ද යන්න සහ එය අදාළ කරගන්නේ ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කිරිමට කටයුතු කළ යුතු ය. එවැනි ක්‍රමයක් හෝ කාර්ය පටිපාටියක් අදාළ කළ යුතු බව තීරණය කරනු ලබන අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අදහස් කරනු ලැබූ කාර්ය සඳහා ඒ ක්‍රමය හෝ කාර්ය පටිපාටිය සාධාරණ වන්නේ ද, ඵලදායි වන්නේ ද සහ අපනයනය කරන රටෙහි සාමාන්‍යයෙන් පිළිගත් වාණිජ පරිචයන් මත පදනම් කරනු ලැබූවක් දැයි සොයාබැලීම පිණිස සත්‍යායනය කිරීමේ ක්‍රමය පරීක්ෂා කරනු ලැබිය යුතු ය. මේ පරීක්ෂණය සපුරාලීමට සහ එම කාර්ය පටිපාටි ඵලදායි ලෙස අදාළ කරන තාක් දුරට කිසිම සහනාධාරයක් ඇත්තේ යයි පූර්ව නිගමනය නොකළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ 33 වන වගන්තියට අනුකූලව තොරතුරු සත්‍යායනය කිරීමට සහ සත්‍යායනය කිරීමේ කාර්ය පටිපාටි ඵලදායී අයුරින් අදාළ කරන බවට සෑහීමට පත්වීම පිණිස ඇතැම් ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය;

(ඇ) සත්‍යායනය කිරීමේ කාර්ය පටිපාටි නොමැති අවස්ථාවක හෝ ඒවා සාධාරණ නොවන අවස්ථාවක හෝ එවැනි කාර්ය පටිපාටි ආරම්භ කරනු ලැබ ඇති බව සහ ඒවා සාධාරණ යයි සලකනු ලබන්නා වූ එහෙත් එය සැබවින්ම අදාළ කරනු නොලබන බවට හෝ ඵලදායී අයුරින් අදාළ කරනු නොලබන බවට අනාවරණය වූ අවස්ථාවක, සහනාධාරයක් තිබිය හැකි ය. එවැනි අවස්ථාවල දී අදාළ වන සැබෑ ගනුදෙනුවල පදනම මත අපනයනය කරන සමාජිකයා විසින් වැඩිපුර ගෙවීමක් සිදුකොට ඇත්තේ දැයි තීරණය කිරීමට වැඩිදුර පරීක්ෂණයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නේ ය. වැඩිදුර

පරීක්ෂණයක් අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම් එය (ආ) ඡේදයට අනුකූලව කරගෙන යා යුතු ය;

(ඇ) ආපසු ගැනීම සඳහා හිමිකම් පාන්නා වූ විශේෂ ආනයන නැව්ගත කිරීම තෝරා ගැනීමට අපනයනකරුවන්ට ඉඩදෙනු ලබන්නා වූ ආපසු ගැනීමේ ආදේශිතයක් සම්බන්ධයෙන් විධිවිධානයක් තිබීමෙන් ම සහනාධාරයක් ඇති කෙරෙන්නේ යයි සලකනු නොලැබිය යුතු ය;

(ඉ) මේ උපලේඛනයේ සඳහන් අපනයන සහනාධාර සම්බන්ධයෙන් වූ සවිස්තර ලැයිස්තුවේ (එ) ඡේදයේ අදහස අනුව ආනයන ගාස්තු සම්බන්ධයෙන් ආපසු ගැනීමේ අතිරික්තයක් සැබවින්ම ගෙවන ලද හෝ ගෙවිය යුතු පොළියේ ප්‍රමාණයට තම ආපසු ගැනීමේ ක්‍රම යටතේ ආපසු ගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් මත වූ පොළිය ආණ්ඩු විසින් ගෙවන ලද අවස්ථාවක පවතින්නේ යයි සලකනු ලැබිය යුතු ය.